SEC | SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA



වාර්ෂික වාර්තාව 2023

ප්‍රගතියේ පියාපත්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

පටුන

උපාය මාර්ගික දිශාව 2

විධායක සමාලෝචනය

සභාපතිතුමාගේ සමාලෝචනය.....4

ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය 2023-2025.....8

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය.....10

කොමිෂන් සභා සාමාජිකයින්.....15

අධ්‍යක්ෂකවරුන්, අධ්‍යක්ෂකවරියන්, සහකාර අධ්‍යක්ෂකවරුන් සහ සහකාර අධ්‍යක්ෂකවරියන්.....19

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය.....20

කළමනාකරුවන්.....20

වසරේ විශේෂ අවස්ථාවන්.....21

මෙහෙයුම් සමාලෝචනය

උපායමාර්ගික අරමුණු 1 24

උපායමාර්ගික අරමුණු 2 39

උපායමාර්ගික අරමුණු 3 51

උපායමාර්ගික අරමුණු 4 55

උපායමාර්ගික අරමුණු 5 58

අතිරේක තොරතුරු 63

මූල්‍ය වාර්තා

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

විගණකාධිපති වාර්තාව.....68

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.....73

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය.....74

සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය.....75

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 76

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන 77

සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

විගණකාධිපති වාර්තාව.....90

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.....94

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය.....95

සෙස් අරමුදලේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය.....96

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 97

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්.....98

වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

විගණකාධිපති වාර්තාව..... 103

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය..... 107

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය..... 108

වන්දි අරමුදලේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය 109

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 110

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්..... 111

පියවීම් සහතික කිරීමේ වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

විගණකාධිපති වාර්තාව..... 116

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 120

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය..... 121

ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය..... 122

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 123

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්..... 124

සාංගමික තොරතුරු .....පිට කවරයේ ඇතුළු පැත්ත



ප්‍රගතියේ පියාපත්

පවතින ගතික පරිසරය තුළ අපි ධනාත්මක වෙනසක් ඇති කිරීම සඳහා උත්ප්‍රේරකයකගේ භූමිකාව ආඩම්බරයෙන් භාර ගනිමු. සාධාරණ, කාර්යක්ෂම සහ සදාචාරාත්මක පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ස්ථීර කැපවීමකින්, ව්‍යාපාර සහ ආයෝජකයන් අතර ප්‍රාග්ධනය ගලා යාමට පහසුකම් සලසමින් අප ප්‍රගතියේ පියාපත් සමඟ ඉහළට ගමන් කරන්නෙමු.

අපගේ ප්‍රගතියේ පියාපත් තුළින් සංකේතවත් කරනුයේ, සමස්ත සුරකුම්පත් වෙළෙඳපොළ ඉදිරියට ගෙනයාමට අප තුළ ඇති අධිෂ්ඨානයයි. ඉදිරි දැක්මක් සහ අනුවර්තනය වීමේ හැකියාවකින් බල ගැන්වෙන මෙම පියාපත් අපගේ දියුණුවේ නව මාවත කරා යන ගමනේ ප්‍රධාන බලවේගය ලෙස කටයුතු කරයි.

මෙම ක්‍රියාකාරී ස්ථාවරය, වෙළෙඳපොළ තරඟකාරිත්වය වැඩි දියුණු කරනවා පමණක් නොව, සුරකුම්පත් වෙළෙඳපොළෙහි අනාගතය හැඩගැස්වීමේ ප්‍රධාන බලවේගය ලෙස අපව ස්ථානගත කරයි. අපි අපගේ ප්‍රගතියේ පියාපත් මත පියාසර කරන විට, නවෝත්පාදනයන් සමෘද්ධිමත් වන සහ සුරකුම්පත් වෙළෙඳපොළ දියුණු වන අනාගතයක උත්පාදකයා බවට අප පත්වන්නෙමු.

උපාය මාර්ගික දිශාව

දැක්ම, මෙහෙවර සහ සාරධර්ම

උපාය මාර්ගික ඉලක්ක

2023 වසර අපගේ ප්‍රමුඛතා සඳහා මඟ පෙන්වූ අපගේ තුන් අවුරුදු උපාය මාර්ගික සැළැස්මේ අවසාන වසර සනිටුහන් කළේය. මෙම උපාය මාර්ගික සැළැස්ම අපගේ දැක්ම, මෙහෙවර සහ අරමුණු ඉටු කිරීමට ඉවහල් විය. මෙම වාර්ෂික වාර්තාව එක් එක් උපාය මාර්ග පහ තුළ අපගේ ප්‍රගතියේ යාවත්කාලීනයක් ලබා දෙයි.

අපේ දැක්ම

කලාපයේ පදනම් ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමකයෙකුගේ තත්ත්වය ඉටු කිරීම

1. ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපනය කිරීම සහ පවත්වා ගෙනයාම
2. ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම
3. ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනයට අනුබල දීම
4. දැනුවත් ආයෝජන තීරණ ගැනීම සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ කෙරෙහි උනන්දුව ප්‍රවර්ධනය කිරීම
5. ආයතනික විශිෂ්ඨත්වය දියුණු කිරීම

අපේ මෙහෙවර

සාධාරණ, කාර්යක්ෂම, ක්‍රමවත් සහ විනිවිදභාවයෙන් යුත් ප්‍රාග්ධන වෙළෙඳපොළක් ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම

සාරධර්ම

- නවෝත්පාදනය, නිර්මාණශීලිත්වය සහ සංවර්ධනය
- අවංක භාවය, වාස්තවිකත්වය සහ විනිවිදභාවය
- පාර්ශවකරුවන්ගේ සහ පාරිභෝගික අවධානය යොමුකරගත් වගකීම්
- කාර්යක්ෂමතාව සහ නම්‍යශීලි බව
- කාර්යසාධනය සහ ගුණාත්මකභාවය මත පදනම් වීම



පුළුල් වූ ඉදිරි දර්ශනය

විධායක සමාලෝචනය

සභාපතිතුමාගේ සමාලෝචනය 4 | ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ නඩාය පත්‍රය 2023-2025 8 | අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය 10
කොමිෂන් සභා සාමාජිකයින් 15 | අධ්‍යක්ෂකවරුන්, අධ්‍යක්ෂකවරියන්, සහකාර අධ්‍යක්ෂකවරුන් සහ සහකාර අධ්‍යක්ෂකවරියන 19
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය 20 | කළමනාකරුවන් 20 | වසරේ විශේෂ අවස්ථාවන් 21

සභාපතිතුමාගේ සමාලෝචනය



මෙම අර්බුදය මධ්‍යයේ, ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය කිරීම, ආයෝජකයින් ආරක්ෂා කිරීම, මහජන සුභසිද්ධිය ආරක්ෂා කිරීම, මූල්‍ය අපරාධ අවම කිරීම සහ සාධාරණ, ක්‍රමවත් සහ කාර්යක්ෂම වෙළෙඳපොළක් පවත්වාගෙන යාම සඳහා වූ අපගේ මෙහෙවරෙහි අපි නොසැලී කටයුතු කළෙමු.

අපගේ ජාතික නිදහසින් පසු දරුණුතම ආර්ථික අර්බුදයත් සමඟ පැන නැගුණු අසමසම අභියෝගවලින් පසුගිය වසර සනිටුහන් වූ අතර, එය අපගේ මූල්‍ය වෙළෙඳපොළවල සහ ආයතනවල ඔරොත්තු දීමේ හැකියාව දැඩි ලෙස පරීක්ෂා කළ වසරක්ද විය. මෙම අර්බුදය මධ්‍යයේ, ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය කිරීම, ආයෝජකයින් ආරක්ෂා කිරීම, මහජන සුභසිද්ධිය ආරක්ෂා කිරීම, මූල්‍ය අපරාධ අවම කිරීම සහ සාධාරණ, ක්‍රමවත් සහ කාර්යක්ෂම වෙළෙඳපොළක් පවත්වාගෙන යාම සඳහා වූ අපගේ මෙහෙවරෙහි අපි නොසැලී කටයුතු කළෙමු.

ආර්ථික අර්බුදය පුරාවටම අප තීරණාත්මක සහ වැදගත් කරුනු මත ක්‍රියාකාරීව වැඩ කරමින් සිටින්නෙමු. අප තදින් විශ්වාස කරනවා දුෂ්කර කාලවලදී ආයතන නැවත ගොඩ නැගීමට, පාරවර්තනයට සහ අනාගතයට සූදානම් කිරීමට උතුම අවස්ථාව බව. එවිට ආර්ථිකය නැඟී එන විට කල් ඇතිව වාසි ලබා ගැනීමට සහ අනාගතයට සූදානම් විය හැක.

ශක්තිමත් ප්‍රාග්ධන වෙළෙඳපොළක් නිර්මාණය කිරීම සඳහා අප තුළ ඇති කැපවීමට අනුව, සුරුකුම්පත් වෙළෙඳපොළේ වර්ධනය, නවෝත්පාදනය සහ තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ප්‍රධාන ක්‍රියාකාරකම් 12 කින් සමන්විත 2023-2025 කාලසීමාව සඳහා පුළුල් ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ ව්‍යාය පත්‍රයක් අප විසින් හඳුන්වා දුන්නෙමු. සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සමස්ත කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා සහ විශේෂයෙන්ම නව සහ පුළුල් කරන ලද සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ එහි නියාමන කාර්යභාරය සහ වගකීම් ඉටු කිරීම සඳහා 2023 වර්ෂයේදී ආයතනික ධාරිතාව ගොඩනැගීම ප්‍රධාන ප්‍රමුඛතාවයක් ලෙස අප හඳුනා ගත්තෙමු.

සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සමස්ත කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා සහ විශේෂයෙන්ම නව සහ පුළුල් කරන ලද සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ එහි නියාමන කාර්යභාරය සහ වගකීම් ඉටු කිරීම සඳහා 2023 වර්ෂයේදී ආයතනික ධාරිතාව ගොඩනැගීම ප්‍රධාන ප්‍රමුඛතාවයක් ලෙස අප හඳුනා ගත්තෙමු.

අපගේ මෙහෙයුම්වලදී ඉක්මන් සහ කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට, මානව සම්පත් සහ තාක්ෂණ අංශයන් තීරණාත්මක ක්ෂේත්‍ර බවට පත්විය. විශේෂඥ මානව කුසලතා අත්පත් කර ගැනීම, රඳවා තබා ගැනීම, ඉහළ නැංවීම සහ නැවත සකස් කිරීම, ව්‍යාපාර ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණය, විශේෂඥ ප්‍රමිති සැකසීම සහ නියාමන ආයතනයකට අදාළ සුදුසු තාක්ෂණික පද්ධති ප්‍රසම්පාදනය කිරීම, සහ මෙහෙයුම් ක්‍රියාවලි කාර්යක්ෂමතාව සඳහා සංවිධානය පරිවර්තනය, කාර්ය සාධන දිශානතිය සහ ප්‍රතිපත්තිමය වෙළෙඳපොළ හැසිරීම් සංස්කෘතියක් ද එයට ඇතුළත් විය. ධාරිතා ගොඩනැගීමේ ක්‍රියාවලියේදී අපගේ ප්‍රධාන මෙහෙයුම් කුළුණු 3 තුළ පවතින මානව සම්පත් අවශ්‍යතා එනම් වෙළෙඳපොළ නිරීක්ෂණ, විමර්ශන සහ බලාත්මක කිරීම විශේෂිතව සැලකිල්ලට ගන්නා ලදී. බාහිර පරිසරයෙන් එල්ල වන අභියෝග පිළිබඳව අවධානය යොමු කරමින් එම අවශ්‍යතා මගහැරවීමට කොමිෂන් සභාව සුදුසු ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. වටිනාකම් නිර්මාණය සහ අවදානම් අවම කිරීමේ අදහසින් යුතුව මෙම දෙකෙන්ම අර්ථවත් ප්‍රතිඵල නිර්මාණය කිරීම සඳහා අප ආයතනයේ පරිවර්තන ක්‍රියාකාරකම්, උපායමාර්ගිකව අපගේ ඩිජිටල් පරිවර්තන ක්‍රියාකාරකම සමඟ සම්බන්ධ වේ.

සමහර ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරකම් සාර්ථකව නිම කර ඇති අතර අනෙක් ඒවා ක්‍රමයෙන් ඉදිරියට යමින් පවතී. ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයේ කේන්ද්‍රීය වන්නේ අපගේ වෙළෙඳපොළ යටිතල පහසුකම් නවීකරණය කිරීමේදී සහ සියලුම පාර්ශවකරුවන් සඳහා ප්‍රවේශ්‍යතාව වැඩිදියුණු කිරීමේදී වැදගත් අංගයක් වන ඩිජිටල් පරිවර්තනය වෙත ගමන් කිරීම, ව්‍යුත්පන්න සුරකුම්පත් හුවමාරුවක්, කාබන් ණය වෙළෙඳ හුවමාරුවක්, බහු-මුදල් හුවමාරුවක් ස්ථාපිත කිරීම සහ ගෝලීය තිරසාර ඉලක්ක සමඟ පෙළගැසෙමින් විවිධ ආයෝජන අවස්ථා සඳහා පහසුකම් සැලසීමේ අපගේ කැපවීමේ කොටසක් ලෙස නව නිෂ්පාදන හඳුන්වාදීමයි.

යහපාලනය, වඩා හොඳ කාර්යක්ෂමතාව සහ තරඟකාරිත්වය හඹා යාමේදී, ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයේ ප්‍රමුඛස්ථානයක් ගනුයේ කොළඹ කොටස් හුවමාරුව අසාමූහීකරණයයි. සාමූහික (අන්‍යෝන්‍ය) කොටස් හුවමාරුවක් ක්‍රියාත්මක වන ලෝකයේ ඉතා සුළු වෙළෙඳපොළවල් අතර අපගේ ප්‍රාග්ධන වෙළෙඳපොළ ද එකකි. වෙළෙඳපොළ ආයතන මට්ටමින් තිරසාර විශ්වසනීයත්වයක් ගොඩනැංවීම සඳහා අසාමූහීකරණය ඉතා වැදගත් වේ. 2018 වසරේ සිට මතභේද හේතුවෙන් ඇනහිට තිබූ අසාමූහීකරණ නීති සම්පාදනය කඩිනම් කිරීමට 2023 දී අප තීරණාත්මක පියවර ගත්තෙමු. ව්‍යවස්ථාදායකය හරහා අසාමූහීකරණ පනත නැවත ආරම්භ කිරීමට සහ ප්‍රගතිය සඳහා කොටස් තැරැව්කාර කර්මාන්තයෙන් අපට මේ වන විට ලැබී ඇති සහයෝගය මම අගය කරමි. මෙම ඒකාබද්ධ ප්‍රයත්නයේ සාර්ථකත්වය කොළඹ කොටස් හුවමාරුවේ අනාගත මෙහෙයුම් සඳහා ධනාත්මක ප්‍රතිඵල ගෙන දෙන අතර එය මීළඟ අදියරට ඔසවා තැබීමට ද හැකියාව ලැබෙනු ඇත.

තත්කාලීන වෙළෙඳපොළ ආවේක්ෂණ පද්ධතියක් සහ ස්වයංක්‍රීය වෙළෙඳපොළ අධීක්ෂණ පද්ධතියක් ප්‍රසම්පාදනය දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අතර එමගින් තීරණාත්මක වැදගත් මූලික නියාමන කාර්යයන් දෙකක් වන වෙළෙඳපොළ ආවේක්ෂණය සහ වෙළෙඳපොළ අධීක්ෂණය ශක්තිමත් කිරීමත් , නියාමන අධීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමත් සහ ආයෝජකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමත් සිදුවේ.

කොළඹ කොටස් හුවාමාරුව සමඟ සහයෝග යෙන්, අප නවෝත්පාදනයට සහ වර්ධනයට හිතකර පරිසරයක් නිර්මාණය කරමින් කැපී පෙනෙන පරිවර්තනීය ක්‍රියාකාරකම් කිහිපයක් හඳුන්වාදෙන ලදී. අප සුරකුම්පත් ණයට ගැනීම සහ ණය දීම (SBL) හරහා නියාමනය කරන ලද හිඟ විකුණුම් (RSS) සඳහා සක්‍රීය නියාමන රාමුවක් නිර්මාණය කළ අතර,

එය ආයෝජකයින්ට අවදානම් කළමනාකරණය සඳහා නව ප්‍රවේශයක් ලබා දෙන අතරම වෙළෙඳපොළ ද්‍රවශීලතාවය සහ කාර්යක්ෂමතාව ඉහළ නංවන වැදගත් සන්ධිස්ථානයක්ද විය. ආයෝජන අවස්ථා විවිධාංගීකරණය කරනවා පමණක් නොව පාරිසරික සහ සමාජ වගකීම් ද ප්‍රවර්ධනය කරන හරිත සහ නිල් බැඳුම්කර ඇතුළු තිරසාර බැඳුම්කර සඳහා නියාමන රාමුවක් නිර්මාණය කිරීම තුළින් අප තිරසාරභාවය වෙනුවෙන් ප්‍රමුඛත්වය ගත්තෙමු. සදාචාරාත්මක මූලධර්මවලට අනුකූලව ආයෝජකයින්ගේ විවිධ අවශ්‍යතා සපුරාලමින් මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශ වීම සඳහා අපගේ කැපවීම ඔරියා අනුකූල ණය සුරකුම්පත් හඳුන්වාදීම තුළින් පැහැදිලි වේ. ආර්ථික වර්ධනය සඳහා යටිතල පහසුකම් සංවර්ධනයේ ප්‍රධාන භූමිකාව හඳුනා ගනිමින්, යටිතල පහසුකම් බැඳුම්කර නිකුත් කිරීම් පුළුල් කරමින් අත්‍යවශ්‍ය ව්‍යාපෘති සඳහා දිගුකාලීන මූල්‍ය විසඳුම් ලබාදීමට අප කටයුතු තර ඇත.

රජය සතු ව්‍යවසායන්හි (SOE) ප්‍රතිසංස්කරණ පිළිබඳ රජයේ ප්‍රතිපත්තියට සහය දැක්වීමක් වශයෙන්, වෙළෙඳපොළ ද්‍රවශීලතාවය ක්‍රමයෙන් ඉහළ නැංවීම සහ රජය සතු ව්‍යාපාර අංශයේ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා තීරණාත්මක පියවරක් ලෙස රජය සතු ව්‍යාපාර ලැයිස්තුගත කිරීම කඩිනම් කිරීමට, අප වෙනම සංක්‍රාන්තික ලයිස්තුගත කිරීමේ පුවරුවක් නිර්මාණය කිරීම අනුමත කළෙමු.

සභාපතිතුමාගේ සමාලෝචනය

රජය සතු ව්‍යවසායන්හි (SOE) ප්‍රතිසංස්කරණ පිළිබඳ රජයේ ප්‍රතිපත්තියට සහය දැක්වීමක් වශයෙන්, වෙළෙඳපොළ ද්‍රවශීලතාවය ක්‍රමයෙන් ඉහළ නැංවීම සහ රජය සතු ව්‍යාපාර අංශයේ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා තීරණාත්මක පියවරක් ලෙස රජය සතු ව්‍යාපාර ලැයිස්තුගත කිරීම කඩිනම් කිරීමට, අප වෙනම සංක්‍රාන්තික ලයිස්තුගත කිරීමේ පුවරුවක් නිර්මාණය කිරීම අනුමත කළෙමු. කොළඹ කොටස් හුවමාරුවෙහි සහ රජය සතු ව්‍යාපාරයන්හී ලයිස්තුගත කිරීම් හරහා ආයතන සඳහා යහපාලනයක්, විනිවිදභාවයක් සහ ආයෝජක අයිතීන් අනුව බොහෝ ප්‍රතිලාභ ලබා දෙයි.

දැඩි සුපරීක්ෂාකාරී ආවේක්ෂණය සහ පුළුල් විමර්ශනය තුළින්, වංචනික ක්‍රියාකාරකම්වලට හෝ වෙළෙඳපොළ හැසිරවීම්වලට සම්බන්ධ බවට අනාවරණය වූ පුද්ගලයන්ට, වෙළෙඳපොළ අතරමැදියන්ට සහ ලැයිස්තුගත සමාග ම්වලට එරෙහිව කොමිෂන් සභාව කඩිනම් සහ තීරණාත්මක ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම උත්සාහයන් නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීමට සහ වෙළෙඳපොළ විනය සහ අඛණ්ඩතාව ආරක්ෂා කිරීමට අපගේ කැපවීම පිළිබඳ පැහැදිලි විදහා දැක්වීමක් ලෙස පෙන්වා දිය හැකිය. 2023 දී, ප්‍රාග්ධන වෙළඳපොළ තුළ සදාචාර විරෝධී, නීති විරෝධී, සාපරාධී හැසිරීම්, වෙළෙඳපොළ ගනුදෙනු සහ වැරදි නොඉවසන බවට ප්‍රබල පණිවිඩයක් යවමින් බොහෝ බලාත්මක ක්‍රියාමාර්ග කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

බලාත්මක කිරීම සඳහා වන අපගේ ක්‍රියාකාරී ප්‍රවේශය, අපගේ නියාමන රාමුවේ අඛණ්ඩතාව පිළිබඳව ආයෝජකයින්ට විශ්වාසය තැබිය හැකි සාධාරණ, විනිවිද පෙනෙන සහ ක්‍රමවත් වෙළෙඳපොළ පරිසරයක් පෝෂණය කිරීම සඳහා අපගේ කැපවීම අවධාරනය කරයි. වසර තුළ අවධානය යොමු කළ එක් කැපී පෙනෙන අංශයක් නම්, විශේෂයෙන් සමාජ මාධ්‍ය නාලිකා හරහා ආයෝජන උපදෙස් ලබා දෙන බලපත්‍ර රහිත පුද්ගලයින් බහුල වීමයි. එවැනි අනවසර උපදෙස් මගින් ඇති විය හැකි අවදානම් සැලකිල්ලට ගනිමින්, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ආයෝජන උපදෙස් පිරිනැමීම පාලනය කරන නියාමන අවශ්‍යතා පිළිබඳව එවැනි පුද්ගලයින්ට සහ සාමාන්‍ය ජනතාවට අනතුරු ඇඟවීමට සහ දැනුවත් කිරීමට ක්‍රියාකාරී පියවර ගත්තේය.

ප්‍රාග්ධන වෙළෙඳපොළේ දිශානතිය සහ කාර්යක්ෂමතාවය හැඩගැස්වීමේදී පාර්ශවකරුවන්ගේ වැදගත්කම හඳුනා ගනිමින්, අපි විවිධ පාර්ශවකරුවන් සමඟ නිරන්තර නියැලීම, සංවාදය, උපදේශන සහ සහයෝගිතාවය සඳහා පහසුකම් සැලසුවෙමු. වෙළෙඳපොළ සහභාගිවන්නන්, කර්මාන්ත සංගම් සහ අනෙකුත් නියාමන ආයතන, සම්මන්ත්‍රණ සහ ව්‍යාප්ත වැඩසටහන් සමඟ නිරන්තර උපදේශන සහ සාකච්ඡා හරහා, තීරණාත්මක නියාමන යාවත්කාලීන කිරීම් සහ මග පෙන්වීම් බෙදා හරින අතරම පාර්ශ්වකරුවන්ගේ වර්ධනය වන අවශ්‍යතා සහ අභියෝග අවබෝධ කර ගැනීමට අපි ක්‍රියාකාරීව උත්සාහ කළෙමු. දේශීය ක්ෂේත්‍රයෙන් ඔබ්බට, සුරුකුම්පත් කොමිෂන් සභා ජාත්‍යන්තර සංවිධානයේ (IOSCO) වාර්ෂික රැස්වීම් ඇතුළු ජාත්‍යන්තර සංසදවලට SEC ක්‍රියාකාරීව සහභාගී වූ අතර, ගෝලීය වෙළෙඳපොළ සහ නියාමන හු දර්ශනය තුළ ශ්‍රී ලංකාවේ තත්ත්වය ඉහළ නැංවීම සඳහා ඵලදායී හවුල්කාරිත්වයන් සහ දැනුම හුවමාරු කර ගැනීම.

වෙළෙඳපොළ සහභාගිවන්නන්, කර්මාන්ත විශේෂඥයින් සහ නියාමන ආයතන සමඟ සංවාදය ඇතුළුව පුළුල් පාර්ශ්වකරුවන්ගේ උපදේශන හරහා, අපි 2008 සිට පළමු විස්තීර්ණ සංශෝධනය සනිටුහන් කරමින් 2023 දී ආයතනික පාලනය පිළිබඳ රීති උනන්දුවෙන් සමාලෝචනය කර යාවත්කාලීන කළෙමු. ආයතනික පාලන නීතිවල සැලකිය යුතු සංශෝධනයක් ලැයිස්තුගත සමාග ම්වල අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ මණ්ඩල කමිටුවල පාලන ව්‍යුහයන්, භූමිකාවන්, යුතුකම් සහ වගකීම් ශක්තිමත් කිරීමට අපගේ අඛණ්ඩ උත්සාහයන්.සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, CSE සහ කර්මාන්තය අතර මෙම සහයෝගී උත්සාහය, ශ්‍රී ලංකාවේ ආයතනික පරිසරය තුළ විනිවිදභාවය, වගවීම සහ සදාචාරාත්මක භාරකාරත්වය පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීමේ අපගේ සාමූහික අධිෂ්ඨානය පිළිබිඹු කරයි, එමඟින් ආයෝජකයින්ගේ විශ්වාසය ශක්තිමත් කිරීම සහ අපගේ සුරුකුම්පත් වෙළෙඳපොළේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරයි.

සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වෙළෙඳපොළ අධීක්ෂණ භූමිකාවේ තිරසාරභාවය සහ සඵලතාවය සහතික කිරීම සඳහා ක්‍රියාශීලී පියවරක් ලෙස, අපි නියාමනය කරන ලද ආයතන සඳහා බලපත්‍ර ගාස්තු දීර්ඝ කාලීනව සංශෝධනය කිරීම ආරම්භ කළෙමු. මූල්‍ය කර්මාන්තයේ ගතික ස්වභාවය සහ විකාශනය වන නියාමන අවශ්‍යතා හඳුනා ගනිමින්, මෙම මූලපිරීම මඟින් බලපත්‍ර ගාස්තු වර්තමාන වෙළෙඳපොළ යථාර්ථයන් සහ මෙහෙයුම් පිරිවැය සමඟ පෙළගැස්වීමේ දිගුකාලීන අවශ්‍යතාවයට අවධානය යොමු කරන ලදී. කිසිදු යථාර්ථවාදී ගැලපීමකින් තොරව දශකයකට වැඩි කාලයකට පසුව, මෙම සංශෝධනය මගින් බලපත්‍ර ගාස්තු ව්‍යුහය දැනට තරමක් අර්ථවත් මට්ටමකට තල්ලු කර ඇත.ආයෝජක විශ්වාසය තහවුරු කිරීම, අවදානම් අවම කිරීම සහ සදාචාරාත්මක ව්‍යාපාරික භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා, අපි වෙළෙඳපොළ අතරමැදියන් සඳහා අවම පාලන ප්‍රමිතීන් හඳුන්වා දුන්නෙමු. මෙම ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම හරහා වෙළෙඳපොළ අතරමැදියන් වැඩි විනිවිදභාවයකින් සහ වගවීමකින් ක්‍රියා කිරීමටත්, සදාචාරාත්මක ව්‍යාපාරික හැසිරීම සහතික කිරීමටත් අපේක්ෂා කෙරේ.

මූල්‍ය සාක්ෂරතා සංස්කෘතියක් ඇති කිරීම සඳහා අධ්‍යාපනයේ අනිවාර්ය කාර්යභාරය හඳුනා ගනිමින් පාසල් මට්ටමින් ප්‍රාග්ධන වෙළෙඳපොළ දැනුවත්භාවය ඉහළ නැංවීමේ අභිලාෂයෙන් යුතුව පියවර කිහිපයක් අප විසින් ආරම්භ කර ඇත. රට පුරා මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමේදී, අප සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන තිබේ. ඒ අනුව, අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ දූරදර්ශී නායකත්වය මත අප පළාත් නවයම ආවරණය වන අයුරින් තෝරා ගත් පාසල් 100 ක ප්‍රාග්ධන වෙළෙඳපොළ සංගම් පිහිටුවීම ආරම්භ කළෙමු. එහි ප්‍රථම ප්‍රාග්ධන වෙළෙඳපොළ සංගමය ජනාධිපතිතුමා විසින්ම විවෘත කිරීම මගින් අපගේ තරුණ පරපුර අත්‍යවශ්‍ය මූල්‍ය දැනුමෙන් සහ කුසලතාවන්ගෙන් සවිබල ගැන්වීමේ සංකේතාත්මක කැපවීමක් සනිටුහන් කළේය. තවද, මූල්‍ය අධ්‍යාපන ක්‍රියාකාරකම් පුළුල් කිරීමේ අපගේ අඛණ්ඩ ප්‍රයත්නයන්හිදී, අප රාජ්‍ය විශ්ව විද්‍යාලවල සිසුන් ඉලක්ක කර ගනිමින් “Varsity Battles” නමින් ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුම මිනුම තරඟයක් දියත් කළෙමු. මෙම නව වැඩසටහන මඟින් ප්‍රාග්ධන වෙළෙඳපොළ, ආයෝජන මූලධර්ම සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ සිසුන්ගේ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා සිසුන් සම්බන්ධ කර ගැනීමට සහ අභියෝගයක් ලබාදීමට උත්සාහ කරයි. මෙම ක්‍රියාකාරකම හරහා, වඩාත් තිරසාර සහ සෞභාග්‍යමත් අනාගතයකට මංපෙත් විවර කරමින්, දැනුවත් ආයෝජකයින් සහ වගකිවයුතු මූල්‍ය තීරණ ගන්නන්ගේ පරම්පරාවක් ඇති කිරීම අපගේ අරමුණයි.

සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව 2023 වර්ෂයේදී ආර්ථික කුණාටුවෙන් මිදී, ආයතනික සහ වෙළෙඳපොළ මට්ටමින් අර්ථවත් ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයක් යථාර්ථවාදී ප්‍රමුඛතා සමඟ සකස් කළ අතර, පුළුල් කාර්යභාරයක් සහ වගකීම් ඉටු කිරීම සඳහා කාලෝචිත තීරණ ගත් බව පැවසීම පිළිබඳව මම සතුටු වෙමි. 2023 වර්ෂයේදී අපට තීරණ ගැනීමට තිබුණි. එනම්, අප සිටි තැනම සිටීම

ආර්ථික ප්‍රකෘතිය සහ වර්ධනයේ මාවත සම්බන්ධයෙන් 2024 වර්ෂය අභියෝගාත්මක වසරක් වනු ඇත. මෙම ගමන් මගේ අවසානයේදී විසඳුම් ලැබෙන එනම් ආර්ථිකය නැවතත් නිසි මාවතකට පිවිසෙනු ඇත. ධනාත්මක බව සහ ධනාත්මක මානසිකත්වය, අර්බුදයෙන් අපව ගොඩ ගැනීමට බලපාන තීරණාත්මක සාධකයක් වනු ඇත.

හෝ කලාපය තුළ පදනම් නියාමකයෙකුගේ තත්වයට සූදානම්, ක්‍රියාශීලී, කාර්යක්ෂම සහ ඵලදායී ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමකයින්ගේ මීළඟ තත්ත්වයට ගමන් කිරීමයි. අපගේ හෘද සාක්ෂියට එකඟව 2023 දී එම තත්ත්වයට ගමන් කිරීමට අප තෝරා ගත් අතර 2024 දී නව ජවයකින් සහ කැපවීමෙන් එම ගමන අඛණ්ඩව සිදුකරගෙන යන්නෙමු.

ආර්ථික ප්‍රකෘතිය සහ වර්ධනයේ මාවත සම්බන්ධයෙන් 2024 වර්ෂය අභියෝගාත්මක වසරක් වනු ඇත. මෙම ගමන් මගේ අවසානයේදී විසඳුම් ලැබෙන එනම් ආර්ථිකය නැවතත් නිසි මාවතකට පිවිසෙනු ඇත. ධනාත්මක බව සහ ධනාත්මක මානසිකත්වය, අර්බුදයෙන් අපව ගොඩ ගැනීමට බලපාන තීරණාත්මක සාධකයක් වනු ඇත. වත්මන් අර්බුධය අර්බුදය අපට නිවැරදි මගකට යොමුවීමට අවස්ථාවක් ලබා දෙනු ඇති අතර එය අප කළ යුතු දෙයක් බවද කිව යුතුය. දිගුකාලීන ස්ථාවරත්වය සඳහා නිවැරදි දේ කිරීමට සුදුසුම කාලය දැන් එළඹී තිබේ.

අප ඉදිරිය දෙස බලන විට, ආයෝජකයින් ආරක්ෂා කිරීම, මහජන සුභසිද්ධිය ආරක්ෂා කිරීම, ලයිස්තුගත සමාගම් වලට, වෙළෙඳපොළ සහභාගිවන්නන් සහ පාර්ශවකරුවන්ට අවශ්‍ය මග පෙන්වීම සහ සහාය දීම සහ යහපාලනය, විනිවිදභාවය, වගවීම සහ සදාචාරාත්මක භාවිතයන් පිළිබඳ මූලධර්ම ආරක්ෂා කිරීම සඳහා අපගේ කැපවීමෙහි නොසැලී සිටින්නෙමු.

කොමිෂන් සභාවේ සාමාජිකයින්, අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සහ ලේකම් කාර්යාලයේ සියලුම කාර්ය මණ්ඩලය ඔවුන්ගේ කැපවීම, නොපසුබස්නා උත්සාහය සහ සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මෙහෙවර සඳහා සාමූහික දායකත්වය වෙනුවෙන් මාගේ අවංක ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි. එමෙන්ම, ගරු ජනාධිපතිතුමාට සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාට, මුදල් රාජ්‍ය අමාත්‍යතුමාට සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ නිලධාරීන්ටත් ඔවුන්ගේ මගපෙන්වීම සහ ලබාදුන් සහාය වෙනුවෙන් සහ කර්මාන්තයේ නියුතු අපගේ සියළුම පාර්ශවකරුවන් ඔවුන් ලබාදුන් සහයෝගය වෙනුවෙන් ද ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි.



ෆයිසාල් සාලි
සභාපති

2024 අප්‍රේල් 17

ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය 2023-2025



කොළඹ කොටස් හුවමාරුව අසාමූහීකරණය

අසාමූහීකරණයේ ප්‍රතිඵලයක් ලෙස කාර්යක්ෂම හා ඵලදායී කොටස් හුවමාරුවක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යහපාලනය සහ කළමනාකරණ ව්‍යුහයන් ස්ථාපිත කෙරෙනු ඇත. කොටස් හුවමාරු අතර ඉහළ යන තරඟකාරී පරිසරය පිළිබඳව සළකා බැලීමේදී ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි දියුණුව සඳහා මෙම අසාමූහීකරණය අත්‍යවශ්‍ය සහ ඉතා වැදගත් පියවරකි.



තත්‍ය කාලීන ආවේක්ෂණ පද්ධතියක්

ආවේක්ෂණ කාර්යයට සහාය වීමට සහ අපගේ නියාමන කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට මෙය ඉතා වැදගත් වේ.



ඩිජිටල් පරිවර්තනය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි මූලික මෙහෙයුම් ඩිජිටල් ලෙස පරිවර්තනය කිරීම.



නියාමකයාගේ මට්ටමින් සහ වෙළෙඳපොළ අතරමැදියාගේ මට්ටමින් හැකියාවන් ගොඩනැගීම

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියාමන කාර්යභාරය සහ වගකීම්වල කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවයය ඉහළ නැංවීමට සහ හැකියාවන් සහ වෙළෙඳපොළ අතරමැදියන්ගේ ප්‍රමිතීන් ඉහළ නැංවීමට අවශ්‍ය අභ්‍යන්තර ආයතනික හැකියාවන් වර්ධනය කිරීම.



රජය සතු ව්‍යාපාර ලයිස්තුගත කිරීම පුළුල් කිරීම (SOEs)

සක්‍රීය නියාමන රාමුවක් හරහා රජය සතු ව්‍යාපාර ලයිස්තුගත කිරීමට පහසුකම් සැලසීම.



විදේශීය ආයෝජකයින් සඳහා බහු මුදල් හුවමාරුවක් ස්ථාපිත කිරීම

බහු-මුදල් වටිනාකම් සහිත සුරැකුම්පත් ගණුදෙනු කිරීමට හැකි වන පරිදි බහු-මුදල් සුරැකුම්පත් හුවමාරුවක් වරාය නගරය තුළ ස්ථාපිත කිරීමට පහසුකම් සැලසීම.

ව්‍යුත්පන්න සුරකුම්පත් හුවමාරුවක් පිහිටුවීම

බහු-වත්කම් පන්තියේ ව්‍යුත්පන්න සුරකුම්පත් හුවමාරුවක් ස්ථාපිත කිරීම සඳහා නියාමන රාමුවක් සකස් කිරීමට පහසුකම් සැලසීම.

ශ්‍රී ලංකා දේපල ආයෝජන භාර (REIT)

ශ්‍රී ලංකා දේපළ ආයෝජන භාර නිකුත් කිරීමට හිතකර පරිසරයක් සඳහා පහසුකම් සැලසීම.

යටිතල පහසුකම් බැඳුම්කර

යටිතල පහසුකම් බැඳුම්කර වෙළෙඳපොළට හඳුන්වාදීමට සහ ඒ සඳහා වන නියාමන රාමුවට පහසුකම් සැලසීම.



එම්පවර් පුවරුව

ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හඳුනා ගැනීමට, දැනුවත් කිරීමට සහ පහසුකම් සැලසීමට අදාළව කොළඹ කොටස් හුවමාරුව මෙහෙයවීම.

නව ආයෝජන උපකරණ හඳුන්වාදීම

තිරසාර බැඳුම්කර, ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ උපකරණ, හිමිකම් සමූහ අරමුදල් ගණුදෙනු කිරීමේ වේදිකා ආදිය හඳුන්වාදීමට අවශ්‍ය නියාමන රාමු සකස් කිරීම

පාසල් මට්ටමින් ප්‍රාග්ධන වෙළෙඳපොළ දැනුවත්භාවය ගොඩනැගීම

අධ්‍යාපන වැඩසටහන් හරහා සිසුන් අතර මූල්‍ය සාක්ෂරතාව ලබා දීම සහ මනා වූ අනාගත ආයෝජක පරපුරක් බිහිකිරීම.

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය



රාජ්‍ය අංශයේ විශාලත්වය අඩු කිරීම, කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළ නැංවීම සහ තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම මගින් ආර්ථික වර්ධනය සහ ස්ථාවරත්වය ළඟා කර ගැනීම ඉලක්ක කරගත් වෙනත් රටවල සාර්ථක ප්‍රතිසංස්කරණ වැඩසටහන්වලින් ශ්‍රී ලංකාවට ඉගෙන ගත හැකිය.

2023 වසර රටට පරිවර්තනීය වසරකි. එම වසර තුළ ශ්‍රී ලංකාව එහි දරුණුතම ආර්ථික අර්බුදයෙන් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමට ආරම්භ කළේය. 2023 මාර්තු මාසයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ඇමරිකානු ඩොලර් බිලියන 2.9 ක ණය මුදලක් සිව් අවුරුදු වැඩසටහනකට අනුව ලබාදීමට අනුමත කළේය.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රකෘතිමත් වීමේ මාවත 2023 දී දැවැන්ත අභියෝගවලින් පිරී තිබුණි. කැපවීම, විනිවිදභාවය සහ උපාය මාර්ගික තේරීම් සිදු කිරීමේ වටිනාකම එම වසර තුළ ඉස්මතු කිරීම විශේෂත්වයක් විය. සත්‍ය වශයෙන්ම, අභියෝගයට මුහුණ දීමට සහ මෙම මූල්‍ය හා ආර්ථික දුෂ්කරතා ජය ගැනීමට, අවශ්‍ය ප්‍රතිසංස්කරණ මොනවාද සහ ඒවා ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේද යන්න තේරුම් ගැනීම තීරණාත්මක ලෙස වැදගත් විය.

අවශ්‍ය ප්‍රතිසංස්කරණ අතරට රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීම, දේශීය සම්පත් භාවිතය ඉහළ නැංවීම, රාජ්‍ය ව්‍යවසායන්හි (SOEs) මූල්‍ය බර අඩු කර ගැනීම සඳහා කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සහ වෙළෙඳ හා ආයෝජන ක්‍රියාකාරකම් එකමුතු කිරීම තුළින් පුද්ගලික අංශයේ ක්‍රියාකාරකම් දිරිමත් කිරීම ද ඇතුළත් විය.

එසේ වුවද, 2023 වසරේ ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ දැඩි ප්‍රමාදය 2023 වසර තුළ මුහුණ දුන් පුළුල් ගැටළුවක් විය. නිදසුනක් වශයෙන්, රාජ්‍ය අංශයේ ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලීන් ප්‍රමාද කිරීම අනතුරුදායක වූයේ, එය මහජනතාවට සැලකිය යුතු සාර්ව ආර්ථික ඇඟවීම් සහිත අධික මූල්‍ය බරක් ඇති කළ බැවිනි.

එම සන්දර්භය තුළ, ප්‍රාග්ධන වෙළෙඳපොළ යනු බැංකු හා සසඳන විට ව්‍යාපාරික ආයතන සඳහා දිගුකාලීන ප්‍රාග්ධන අරමුදල් රැස් කිරීම සඳහා ගෝලීය වශයෙන් පිළිගත් ක්‍රමවේදය වේ.

රාජ්‍ය අංශයේ විශාලත්වය අඩු කිරීම, කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළ නැංවීම සහ තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම මගින් ආර්ථික වර්ධනය සහ ස්ථාවරත්වය ළඟා කර ගැනීම ඉලක්ක කරගත් වෙනත් රටවල සාර්ථක ප්‍රතිසංස්කරණ වැඩසටහන්වලින් ශ්‍රී ලංකාවට ඉගෙන ගත හැකිය. මෙම වෙනස්කම් මඟින් භාණ්ඩ හා සේවා සෘජුව සැපයීමට වඩා ආර්ථික කටයුතු පහසු කිරීම සහ නියාමනය කිරීම කෙරෙහි පූර්ණ අවධානය යොමු කිරීමට රජයට ඉඩ සලසයි. එය රජයේ මූල්‍ය හා පරිපාලනමය බර අඩු කරයි.

එම සන්දර්භය තුළ, ප්‍රාග්ධන වෙළෙඳපොළ යනු බැංකු හා සසඳන විට ව්‍යාපාරික ආයතන සඳහා දිගුකාලීන ප්‍රාග්ධන අරමුදල් රැස් කිරීම සඳහා ගෝලීය වශයෙන් පිළිගත් ක්‍රමවේදය වේ. තවද, ලයිස්තුගත කිරීමේ ක්‍රියාවලිය හරහා උපාය මාර්ගික සහ වෙනත් ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළ අවස්ථා සලසා දෙයි. කොටස් වෙළෙඳපොළෙහි ලයිස්තුගත කිරීමෙන් මෙම රාජ්‍ය අංශයේ ව්‍යාපාරවලට, ඔවුන්ගේ අභ්‍යන්තර පාලනය, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට සහ විදේශීය සහ දේශීය ආයෝජක ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීමට හැකි වේ.

එම සන්දර්භය තුළ, ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව විසින් රාජ්‍ය අංශයේ පවතින වත්මන් පාලන මට්ටම්, සංවිධාන ව්‍යුහය සහ මෙහෙයුම් අභියෝග පිළිබඳව නිසි සැලකිල්ලක් දැක්වූ අතර රාජ්‍ය අංශයේ ව්‍යාපාරවලට තමන් දැනට සිටින තත්ත්වයේ සිට ළඟා වීමට අවශ්‍ය තත්ත්වය දක්වා ක්‍රමානුකූලව සංක්‍රමණය වීමට ඉඩ සැලසීමේ අරමුණින් වෙනම ලයිස්තුගත කිරීමේ පුවරුවක් සහ ලයිස්තුගත කිරීමේ රීති නිර්මාණය කරන ලදී. කෙසේ වෙතත්, රාජ්‍ය අංශය තවමත් මෙම මාවත භාවිතා කර නොමැත.

ශ්‍රී ලංකාවට වත්මන් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට ඇති එකම මාර්ගය ඉදිරි වසර දහයක පමණ කාලය තුළ සියයට පහේ සිට හත දක්වා හෝ ඊට වැඩි පරාසයක සැලකිය යුතු ආර්ථික වර්ධන වේගයක් ඇතිකර ගැනීම බව මේ වන විට හොඳින්ම පැහැදිලිය. කෙසේ වෙතත්, අද අප දකින සංඛ්‍යාලේඛනවලට අනුව, ඉදිරි වසරවලදී ආර්ථිකය සැලකිය යුතු වේගයකින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා නොකරන අතර ආර්ථිකය අතිශයින් දුර්වල හා අවිනිශ්චිත තත්ත්වයක පවතිනු ඇත. එවැනි තත්වයක් තුළ, ප්‍රාග්ධන වෙළෙඳපොළ නිසියාකාරව භාවිතා කළහොත් වෙනස් කිරීමේ උත්ප්‍රේරකයක් විය හැකිය.

නිදසුනක් වශයෙන්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ඩොලර් ඉපැයීමේ ලයිස්තුගත සමාගම්වලට සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළ හැකිය. ඒ අර්ථයෙන් ගත් කල, අපගේ අපනයනය ඉලක්ක කරගත් ඩොලර් උපයන ලයිස්තුගත සමාගම්වලින් ජයග්‍රාහකයින් තෝරා ගැනීමට කාලය පැමිණ ඇත්තේ ඔවුන්ගේ හැකියාවන්, මෙහෙයුම් සහ කැපවීම දෙස බැලීමෙනි. එබැවින්, අප එවැනි ජයග්‍රාහකයින් දිරිමත් කර පෝෂණය කළ යුතු අතර, අප රටේ සමස්ත පෙනුම වෙනස් කරන ආර්ථික සංවර්ධනයේ ප්‍රගතිය සඳහා ගෝලීය දැවැන්තයන් සමඟ තරඟ කිරීමට එවැනි ජයග්‍රාහී සමාගම් නිදහස් කළ යුතුය. එය අපව ක්‍රියාශීලී ව්‍යවසායක රාජ්‍යයක් බවට පත් කරනු ඇති අතර රටට එහි සැබෑ හැකියාවන් අවබෝධ කර ගැනීමට උපකාර වනු ඇත.

එසේ වුවද, හඳුන්වා දෙනු ලබන මනා ව්‍යුහගත, සාර්ථක ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා සියලු කණ්ඩායම් සහාය දිය යුතු අතර රජය ද මෙම අර්බුදයෙන් ප්‍රයෝජන ගත යුතුය. එමෙන්ම ප්‍රතිගාමී සහනාධාර දීම නවත්වා ගැනීම මෙන්ම සිට රාජ්‍ය අංශයේ ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීම දක්වා කිසිදා උත්සාහ නොකළ දේවල් කිරීමට ද රජය කටයුතු කළ යුතුය.

එවැනි පසුබිමක් තුළ; වාර්තාකරණ කාලසීමාව තුළ සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සිදු කරන ලද කාර්යයන් සමාලෝචනය කිරීමට ලැබීම ගැන මම බොහෝ සෙයින් සතුටට පත් වෙමි.

වෙළෙඳපොළ කාර්ය සාධනය

2022 වසරට සාපේක්ෂව සියලු කොටස් මිල දර්ශකය (ASPI) සියයට විසිපහක (25%) වර්ධනයක් පෙන්නුම් කළේය. 2022 වර්ෂයේ වාර්තා වූ පාඩු බොහෝමයක් මකා දැමීමට සියළු කොටස් මිල දර්ශකයේ ඉහළයාම උපකාරී විය. ඒ හා සමානව, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 මිල දර්ශකය ද සියයට දහසයකට වැඩි (16%) වර්ධන වේගයක ධනාත්මක සටහනක් සමඟ වසර අවසන් විය. ඊට පටහැනිව යමින්, 2023 වර්ෂයේදී දෛනික සාමාන්‍ය පිරිවැටුම ශ්‍රී ලංකා රුපියල් බිලියන 1.69 දක්වා පහත වැටුණි. කෙසේ වෙතත්, වෙළෙඳපොළ ප්‍රාග්ධන සම්පාදනයේදී ප්‍රමුඛස්ථානයේ පසු වූයේ සමාලෝචිත වර්ෂය තුළ එය රුපියල් බිලියන 56.7ක් දක්වා ඉහළ නැංවීමට උපකාරී වූ බැවිනි.

තවද, 2023 දී මුළු ශුද්ධ විදේශ ගලා ඒම රුපියල් බිලියන 6 ඉක්මවා ගිය බැවින් විදේශීය ආයෝජකයින්ගේ උනන්දුව ඉහළ ගියේය. තවද, සමස්ත වෙළෙඳපොළ පිරිවැටුම සඳහා විදේශීය ආයෝජකයින්ගේ දායකත්වයේ යම් වැඩි වීමක් වසර තුළ දක්නට ලැබුණු අතර දේශීය පුද්ගලයින්ගේ වෙළෙඳපොළ ක්‍රියාකාරකම් මට්ටම්වල පෙර වසරවල මෙන් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය. දළ දේශීය නිෂ්පාදිතයට (GDP) අනුපාතිකව වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 18% ක පමණ මධ්‍යස්ථ මට්ටමක පැවතුනි.

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් දෙයාකාරය. එනම් නියාමනය සහ වෙළෙඳපොළ සංවර්ධනයයි. ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය 2023-2025 පැති දෙකම උපරිමයෙන් ආවරණය වන අතර එමඟින් ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි වර්තමාන සහ අනාගත අවශ්‍යතා සපුරාලන බව මා මෙහිදී පැවසිය යුතුය.

එම සන්දර්භය තුළ, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වශයෙන් අප, රට තුළ ප්‍රාග්ධන වෙළෙඳපොළ තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ශක්තිමත් නියාමනය සහ වෙළෙඳපොළ සංවර්ධන ක්‍රියාකාරකම්වල නිරත වන්නෙමු. පුළුල් සහ දුවශීල වෙළෙඳපොළක් ගොඩනැඟීමේ ප්‍රධානතම දෙය වන්නේ ආයෝජකයින්ගේ විශ්වාසය සහ වෙළෙඳපොළ කෙරෙහි විශ්වාසය ගොඩනැඟීමයි. ආයෝජකයින් සඳහා ආයෝජන මාර්ග නිර්මාණය කරන අතරම ඔවුන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ව්‍යාපාර සඳහා මූල්‍ය ප්‍රභවයක් ලෙස ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන බව වටහා ගැනීම ඉතා වැදගත්ය.

සාංගමික පාලන තත්ත්වයන් ශක්තිමත් කිරීම

වර්තමාන සන්දර්භය තුළ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි (CSE) සාංගමික පාලන රීති ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය විය. දුර්වල පාලන ව්‍යුහයන් විසින් ආයතනයක මෙහෙයුම් තත්ත්වයන් උග්‍ර කරයි. දුර්වල පාලන ව්‍යුහයන් සහිත සමාගම් ඔරොත්තු දීමට අපොහොසත් වීමත්, යහපත් සාංගමික පාලන ව්‍යුහයන් සහිත සමාගම් ඔරොත්තු දීමට සමත් වීමත් මූල්‍ය අර්බුදය තුළ හොඳින් පැහැදිලි විය.

මේ අනුව, වෙළෙඳපොළෙහි සමස්ත සංවර්ධනයට අත්‍යවශ්‍ය වන බැවින් නීතිරීතිවල අන්තර්ගතය පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් විය. එම අරමුණ පෙරදැරි කරගෙන සාංගමික පාලන නීති ශක්තිමත් කරන ලදී. වෙනස්කම් සිදුකිරීමේදී කර්මාන්තය අනුගමනය කළ ප්‍රවේශය මම අගය කළ යුතුය.

වර්තමානයේදී, සාංගමික පාලන රීති හැරුණු විට, ලයිස්තුගත කිරීමේ නීතිවල අනෙකුත් පැතිකඩයන් තවදුරටත් වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා අවධානය යොමු කරනු ඇත.

ක්‍රියාකාරී සහ වැළැක්වීමේ මැදිහත්වීම්

සමාලෝචිත වර්ෂය තුළ, ආවේක්ෂණ, අධීක්ෂණ, විමර්ශන සහ බලාත්මක කිරීමේ අංශයන් ශක්තිමත් කරන ලද අතර, වෙළෙඳපොළ විෂමාචාර වැලැක්වීම සඳහා බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග කඩිනමින් ගන්නා ලදී.

සත්‍ය වශයෙන්ම, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ දෘෂ්ටිකෝණයෙන්, අපට අවශ්‍ය වූයේ වෙළෙඳපොළ සංශෝධනය කිරීමට සහ වෙළෙඳපොළ විෂමාචාර කාරණාවලට ඉක්මනින් හා තීරණාත්මක ලෙස ප්‍රතිචාර දක්වමින් වෙළෙඳපොළ ක්‍රියාත්මක වන ආකාරය වෙත මනා පැහැදිලි බවක්, අනුකූලතාවයක් සහ පුරෝකථනයක් ගෙන ඒමට ය.

පසුගිය වසර තුළ සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සැලකිය යුතු ප්‍රමාණයක් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත. බලාත්මක කිරීමේ වාර්තාවන් අතරට නඩු පැවරීමේ තීරණ කිහිපයක්, නඩු පැවරීම්, සමථයකට පත් කිරීම් සහ වෙනත් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් වේ. වසර තුළ වෙළෙඳපොළ විෂමාචාරය සැලකිය යුතු ලෙස අඩු කළ බැවින්, ගෙන ඇති බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ඉතා ඵලදායී බව ඔප්පු විය.

තවද, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සමාජ මාධ්‍යවල ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම සඳහා මනා වූ යාන්ත්‍රණයක් ස්ථාපිත කරන ලදී. වෙළෙඳපොළ වැරදිකරුවන්ට එරෙහිව කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලද අතර, අනතුරු ඇඟවීමේ සහ අවවාද කිරීමේ ලිපි නිකුත් කිරීම සහ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම ඊට ඇතුළත් විය.

බලපත්‍රලාභීන් තම ව්‍යාපාර නියාමනය කරන ලද රාමුව තුළ පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා වසර තුළ අධීක්ෂණ අංශය විසින් ස්ථානීය සහ දුරස්ථ පරීක්ෂාවන් කිහිපයක් පවත්වන ලදී. අඛණ්ඩ සහ නිරන්තර අධීක්ෂණයන් තුළින් මූලිකවම නියාමන ප්‍රමිතීන් සපුරාලන බවට සහතික විය.

සාංගමික පාලන රීති සංශෝධනයට සමානව, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙළෙඳපොළ අතරමැදියන් සඳහා අදාළ වන අවම පාලන අවශ්‍යතා නිකුත් කරනු ලැබීය. එම පාලන රාමුව වෙළෙඳපොළ අතරමැදියන්ගේ ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා බෙහෙවින් වැදගත් වේ.

ඕනෑම ආයතනයක ප්‍රධාන කළමනාකරණ පිරිස් එම ආයතනය නඟා සිටුවීමේ මුල්ගල ලෙස ක්‍රියා කරයි. සමාගමක් තුළ ඔවුන් ඉටු කරන අත්‍යවශ්‍ය කාර්යභාරය සැලකිල්ලට ගනිමින්, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙළෙඳපොළ අතරමැදියන්ගේ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ යෝග්‍යතාවය සහ සුදුසුකම් තක්සේරු කිරීම සඳහා රාමුවක් සකස් කළ අතර එම අවශ්‍යතා සමඟ අනුකූල නොවන ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රමිතිගත ප්‍රවේශයක් හඳුන්වා දෙන ලදී.

තවද, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා විමර්ශන අත්පොත වසර තුළදී නව විමර්ශන සහ බලාත්මක කිරීමේ අත්පොතක් සමඟ ප්‍රතිස්ථාපනය විය. මෙම අත්පොතට නව සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ ක්ෂේත්‍රය තුළට එන නව බලාත්මක කිරීමේ ක්‍රම ද ඇතුළත් කර ඇත. විමර්ශන පැවැත්වීමේදී සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගනු ලබන ප්‍රමිතිගත විනිවිදභාවයෙන් යුත් ප්‍රවේශය, මෙම අත්පොත තවදුරටත් ශක්තිමත් කර වැඩිදියුණු කරනු ලබයි. මෙම ක්‍රියාකාරකම්වල අවසාන පරමාර්ථය වන්නේ දේශීය හා විදේශීය ආයෝජකයින් අතර විශ්වාසය ගොඩනැංවීම සඳහා අපගේ වෙළෙඳපොළ අඛණ්ඩතාව ඉහළ නැංවීමයි.

බහුවිධ උපායමාර්ගික ප්‍රවේශය

සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් දෙයාකාරය. එනම් නියාමනය සහ වෙළෙඳපොළ සංවර්ධනයයි. ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය 2023-2025 පැති දෙකම උපරිමයෙන් ආවරණය වන අතර එමඟින් ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි වර්තමාන සහ අනාගත අවශ්‍යතා සපුරාලන බව මා මෙහිදී පැවසිය යුතුය. ඒ අනුව, ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ප්‍රධාන ප්‍රතිසංස්කරණ දොළහ පහත පරිදි වේ.

■ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව සඳහා වෙනම තත් කාලීන ආවේක්ෂණ පද්ධතියක්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමන භූමිකාවේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා මෙය තීරණාත්මක වැදගත් අංගයක් ලෙස සැලකේ. තවද, වර්තමාන ඉහළ යන ගණුදෙනු පරිමාවන්ට ගැලපෙන පරිදි නව විශේෂ ලක්ෂණ සහිත ශක්තිමත් ආවේක්ෂණ පද්ධති, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාලීන මැදිහත්වීම් ශක්තිමත් කරමින් ඵලදායී හා කාර්යක්ෂම වෙළෙඳපොළ අධීක්ෂණය ශක්තිමත් කරනු ඇත.

■ ඩිජිටල් පරිවර්තනය

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අවධානය යොමු කර ඇත්තේ කඩදාසි භාවිතය අවම පරිසරයක් හරහා ක්‍රියාත්මක වීම සඳහා නියාමන සහ පරිපාලන කාර්යයන් දෙකම ඩිජිටල්කරණය කිරීම කෙරෙහි ය. ප්‍රතිසංස්කරණ යටතේ ඇති සමහර ප්‍රධාන ක්‍රියාකාරකම් අතරට නියාමන වාර්තාකරණය සඳහා විද්‍යුත් ගොනු කිරීමේ පද්ධතිය ඩිජිටල් කිරීම ඇතුළත් වේ. වෙළෙඳපොළ අතරමැදියන්ට ප්‍රමිතිගත පද්ධතියක් හරහා අන්තර්ජාලය හරහා තම වාර්තා ඉදිරිපත් කිරීමට හැකි වනු ඇත.

■ කොළඹ කොටස් හුවමාරුව අසාමූහීකරණය කිරීම

කාර්යක්ෂම හා ඵලදායී කොටස් හුවමාරුවක ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය පාලන සහ කළමනාකරණ ව්‍යුහයන් අසාමූහීකරණය මගින් සපයනු ලබයි.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අවධානය යොමු කර ඇත්තේ කඩදාසි භාවිතය අවම පරිසරයක් හරහා ක්‍රියාත්මක වීම සඳහා නියාමන සහ පරිපාලන කාර්යයන් දෙකම ඩිජිටල්කරණය කිරීම කෙරෙහි ය.

■ නියාමක මට්ටමින් සහ වෙළෙඳපොළ අතරමැදි මට්ටමින් හැකියාවන් ඉහළ නැංවීම

නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත බලාත්මක කිරීමත් සමඟ නියාමන මට්ටමින් සහ වෙළෙඳපොළ අතරමැදි මට්ටමින් හැකියාවන් ඉහළ නැංවීම තීරණාත්මක ලෙස වැදගත් වී ඇත. මෙම ප්‍රතිසංස්කරණය යටතේ ඇති සමහර ක්‍රියාකාරකම් අතරට, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියාමන ක්‍රියාකාරිත්වය සහ වගකීම්වල සඵලතාවය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා අභ්‍යන්තර හැකියාවන් ප්‍රවර්ධනය, වෙළෙඳපොළේ සමස්ත මෙහෙයුම් ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා වෙළෙඳපොළ අතරමැදියන්ගේ අවම ප්‍රාග්ධන අවශ්‍යතා වැඩි කිරීම සහ බලපත්‍ර ලබාදීම සඳහා සුදුසුකම් ලබන්නේ නිශ්චිත තත්ත්වයන් සහ යහපත් මූල්‍ය තත්ත්වයක් වෙළෙඳපොළ ක්‍රියාකරුවන් පමණක් බව සහතික කිරීමට වැඩි දියුණු කරන ලද නියාමන අධීක්ෂණ පිරිවැය අඩු කිරීම සඳහා බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම ඇතුළත් වේ.

■ රජය සතු ව්‍යාපාර (SOEs) ලයිස්තුගත කිරීම පුළුල් කිරීම

ආර්ථිකය තුළ ඵලදායීතාව, තරඟකාරිත්වය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා රජය (GoSL) රාජ්‍ය ව්‍යාපාර සඳහා ගැඹුරු ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලියක යෙදී සිටී. රජය සතු ව්‍යාපාර ප්‍රාග්ධන වෙළෙඳපොළට ඇතුළුවීම මගින් එම ව්‍යාපාරවලට විවිධ පැතිවලින් ප්‍රතිලාභ ලබා දෙනු ඇත. එනිසා, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව රජය සතු ව්‍යාපාර ලයිස්තුගත කිරීම් සඳහා අදාළ නීති රීති දැනටමත් අනුමත කර ඇති අතර කොළඹ කොටස් හුවමාරුව විසින් එවැනි රජය සතු ව්‍යාපාර සඳහා පහසුකම් සැලසීමට "Catalyst Board" නමින් වෙනම තාවකාලික පුවරුවක් දියත් කර ඇත.

■ විදේශීය ආයෝජකයින් සඳහා බහු මුදල් හුවමාරුවක් ස්ථාපිත කිරීම

ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති නව ප්‍රතිසංස්කරණයක් වන්නේ වරාය නගරයේ බහු මුදල් හුවමාරුවක් පිහිටුවීමයි. මෙම හුවමාරුව පිහිටුවීම මගින් බහු-මුදල් වටිනාකම්වල් යුත් සුරැකුම්පත් ගණුදෙනු කිරීමට පහසුකම් සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

■ කාබන් ක්‍රෙඩිට් වෙළෙඳ හුවමාරුවක් පිහිටුවීම

කාබන් වෙළෙඳපොළවල් දේශගුණික අර්බුදය විසඳීම සඳහා අවශ්‍ය පරිවර්තනය වේගවත් කිරීමට උපකාරී වේ. ඵලදායී, විනිවිදභාවයෙන් යුත් සහ කාර්යක්ෂම කාබන් වෙළෙඳපොළවල්, දූෂණයට මිලක් නියම කරන අතර විමෝචනය අඩු කිරීම සඳහා ආර්ථික දිරිගැන්වීමක් නිර්මාණය කරයි. එමනිසා, කාබන් ක්‍රෙඩිට් වෙළෙඳ හුවමාරුවක් ස්ථාපිත කිරීම මඟින් 2050 වන විට ශුද්ධ ශූන්‍ය තත්ත්වය ළඟා කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජයෙහි උනන්දුව තවදුරටත් ශක්තිමත් වනු ඇති බව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විශ්වාස කරයි.

■ ශ්‍රී ලංකා දේපල ආයෝජන භාර (REITs)

මෙම ප්‍රතිසංස්කරණය යටතේ, දේපොළ ආයෝජන භාර නිකුත් කරන්නාට සහ ආයෝජකයාට ආකර්ශනීය ආයෝජන මාර්ග යක් බවට පත් කිරීම සඳහා විකල්ප මාර්ග ගැන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අවධානය යොමු කර ඇත. දැනට, ප්‍රධාන නගරවල එවැනි දේපල කිහිපයක් දක්ණට ලැබෙන අතර සුළු පරිමාණ ආයෝජකයින්ට එවැනි දේපළ තබා ගැනීමට මූල්‍ය හැකියාවක් නොමැත. සුළු පරිමාණ ආයෝජකයින්ට එවැනි දේපළ වෙළෙඳපොළට සහභාගී වීමට සහ එවැනි දේපල වලින් නිර්මාණය කරන ලද ආර්ථික වටිනාකමෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට දේපළ ආයෝජන භාර යාන්ත්‍රණයක් සපයයි.

■ යටිතල පහසුකම් බැඳුම්කර

කොටස් හුවමාරුවේ ලයිස්තුගත කර ඇති යටිතල පහසුකම් බැඳුම්කර, යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා පුද්ගලික අංශයේ සහභාගීත්වය ආකර්ෂණය කර ගනු ඇත. එවැනි බැඳුම්කර රජයේ ආයතන, මහ නගර සභා, පළාත් පාලන සභා ආදිය මගින් නිකුත් කළ හැක.

■ එම්පවර් පුවරුවේ ලයිස්තුගත කිරීම් සඳහා පහසුකම් සැලසීම

මෙම විශේෂ ලයිස්තුගත කිරීමේ පුවරුව මූලිකවම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (SMEs) ප්‍රාග්ධන වෙළඳපොළට ඇතුළු වීමට ආකර්ෂණය කර ගැනීමට සහ පහසුකම් සැලසීමට නිර්මාණය කර ඇති නමුත් තවමත් සමාගම් සක්‍රීයව එහි ලයිස්තුගතවීමක් දක්ණට නොමැත.

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් රටේ වර්ධනයේ තීරණාත්මක අංගයකි. ඔවුන් රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 52% ක් පමණ වන අතර ශ්‍රී ලංකාවේ සියලුම ව්‍යවසායන්ගෙන් 75% ක් පමණ වේ. එබැවින්, එවැනි ආයතන කොළඹ කොටස් හුවමාරුව තුළ නියෝජනය වීම ඉතා වැදගත් වේ. එම්පවර් පුවරුවේ ලයිස්තුගත කිරීම තුළින් ඔවුන්ට ඔවුන්ගේ ඊළඟ මට්ටමට ගමන් කිරීමට අවශ්‍ය ශක්තිය ලබාදෙනු ඇත.

■ නව ආයෝජන උපකරණ හඳුන්වාදීම

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ලොව පුරා සිදුවන නව වෙළෙඳපොළ වර්ධනයන් සමඟ සමීපව කටයුතු කිරීමට උත්සාහ කරයි. එබැවින්, කොළඹ කොටස් හුවමාරුව සමඟ එක්ව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මෙම ප්‍රතිසංස්කරණය යටතේ ප්‍රාග්ධන වෙළෙඳපොළට විවිධ නව ආයෝජන උපකරණ සහ වෙළෙඳපොළ යටිතල පහසුකම් හඳුන්වා දීමට සැලසුම් කරයි. ආයෝජන උපකරණ සහ වෙළෙඳපොළ යටිතල පහසුකම්වලට හරිත බැඳුම්කර/නිල් බැඳුම්කර (සාමාන්‍යයෙන් හැඳින්වෙන්නේ තිරසාර බැඳුම්කර ලෙස හැඳින්වේ), නියාමනය කරන ලද හිඟ විකුණුම්, සුකුක් (Sukuk) වැනි ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ උපකරණ , හිමිකම් සමූහ අරමුදල් චේදිකා ආදිය ඇතුළත් වේ.

■ පාසල් මට්ටමින් ප්‍රාග්ධන වෙළෙඳපොළ දැනුවත්භාවය ඇතිකිරීම

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මහජනතාව අතර මූල්‍ය සාක්ෂරතා මට්ටම තවදුරටත් ඉහළ නැංවීමට කටයුතු කරයි. ඒ සම්බන්ධයෙන්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ජාතික අධ්‍යාපන ආයතනය (NIE) සමඟ එක්ව ලබන වසරේ සිට පාසල් විෂය මාලාවට, විෂයයක් ලෙස සුරැකුම්පත් වෙළෙඳපොළ හඳුන්වා දීමට කටයුතු කරමින් සිටී. සාම්ප්‍රදායික ඉතුරුම් සංස්කෘතියෙන් බැහැරව රටේ සංවර්ධනයට අත්‍යවශ්‍ය වන සමකාලීන ආයෝජන සංස්කෘතියක් කරා ගමන් කිරීමේ අදහසින් කුඩා කල සිටම ප්‍රාග්ධන වෙළෙඳපොළ දැනුම ලබාදෙන බැවින් එමගින් ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි වෙනසක් වනු ඇතැයි මම විශ්වාස කරමි.

මූල්‍ය සාක්ෂරතාව පුළුල් කිරීමේ දී නව තත්ත්වයක් වෙත ළඟා වීම

තරුණ පරපුර අතර කොටස් වෙළෙඳපොළ ප්‍රචලිත කිරීම සඳහා රට පුරා ප්‍රාග්ධන වෙළෙඳපොළ සංගම් 100ක් පිහිටුවා පාසල් සිසුන් අතර මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ඉතා කාලෝචිත තීරණයක් ගත් බව මා කිව යුතුය. ජනාධිපතිතුමාගේ දැක්ම ක්‍රියාත්මක කිරීම සඳහා, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ජනාධිපති ලේකම් කාර්යාලය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ කොළඹ කොටස් හුවමාරුව සමඟ එක්ව දිවයිනේ තෝරාගත් පාසල් 100 ක ප්‍රාග්ධන වෙළෙඳපොළ සංගම් පිහිටුවීමෙන් අධ්‍යාපන පද්ධතිය පුරා මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමේ නව වැඩපිළිවෙළක් ආරම්භ කළේය. 2023 අගෝස්තු 31 වැනි දින ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් මහනුවර නුගවෙල මධ්‍ය මහා විද්‍යාලයේදී මංගල ප්‍රාග්ධන වෙළෙඳපොළ සංගමය ස්ථාපිත කරන ලදී.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ශ්‍රම බලකාය - අත්‍යවශ්‍ය වත්කමකි

අපගේ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් අපගේ වටිනාම වත්කම ලෙස අපි සලකමු. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මෙහෙයුම් හැකියාව ශක්තිමත් කර එහි ආයතනික ධාරිතාව ඉහළ නැංවීම සඳහා නව කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගත් බව ප්‍රකාශ කිරීමට මම සතුටු වෙමි.

මෙම දුෂ්කර කාලවලදී එල්ල වූ අභියෝග ජය ගැනීම සඳහා ඔවුන්ගේ උපරිම සහයෝගය සහ කැපවීම ලබා දීම පිළිබඳව කාර්ය මණ්ඩලයට ස්තුති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති ෆයිසාල් සාලි මහතාට ඔහුගේ මගපෙන්වීම සහ නොසැලෙන සහයෝගය සෑම විටම ලබා දීම ගැන මගේ කෘතඥතාව පුදකර සිටිමි. කොමිෂන් සභා රැස්වීම් සහ අනෙකුත් අනුකමිටු රැස්වීම්වලට සහභාගි වීමට ඔවුන්ගේ පෞද්ගලික සහ වෘත්තීය කාලය කැප කරමින් සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යභාරය සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්ය මණ්ඩලයට ලබා දුන් දිරිගැන්වීම් සහ ස්ථිර සහයෝගය වෙනුවෙන් කොමිෂන් සභා සාමාජිකයින් සියළු දෙනාට මම ස්තුතිවන්ත වීමට කැමැත්තෙමි.

චින්තක මෙන්ඩිස්
අධ්‍යක්ෂ ජනරාල්

2024 අප්‍රේල් 20

කොමිෂන් සභා සාමාජිකයින්



ෆයිසාල් සාලි මහතා
සභාපති



මනිල් ජයසිංහ මහතා



සුජීව මුදලිගේ මහතා



ඇන්ටන් ගොඩ්‍රි මහතා



ආර්.එම්.පී. රත්නායක මහතා



ඉවට් ප්‍රනාන්දු මහත්මිය



සංජීව දිසානායක මහතා



ඒ. නිලන්ති ජයකි ද අල්විස් මහත්මිය



හේෂණ කුරුප්පු මහතා

කොමිෂන් සභා සාමාජිකයින්

ෆයිසාල් සාලි මහතා
සභාපති

ෆයිසාල් සාලි මහතා 2023 පෙබරවාරි 15 වැනි දින ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නව සභාපතිවරයා ලෙස වැඩ භාර ගන්නා ලදී. ඔහු ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි වාණිජ හා සංවර්ධන බැංකුකරණය පිළිබඳ දීගුකාලීන හා පුළුල් අත්දැකීම් ඇති ප්‍රවීණ විශ්‍රාමික බැංකුකරුවෙකි. ඔහු Grindlays බැංකුව, ANZ බැංකුව, NDB සහ අමානා බැංකුව වැනි ගෝලීය සහ දේශීය බැංකු වල ඉහළ කළමනාකරණ තනතුරු හොබවා ඇත. බැංකු, මූල්‍ය, රක්ෂණ, අරමුදල් කළමනාකරණය, කොටස් තැරැව්කරණය, නිෂ්පාදනය, වෙළෙඳාම සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍ර වලට අයත් සමාගම් කිහිපයකම අධ්‍යක්ෂ මණ්ඩලවල අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කර විවිධාකාර අත්දැකීම් ඔහු සතුවේ.

ඔහු රාජ්‍ය විශ්වවිද්‍යාල අධ්‍යක්ෂ මණ්ඩලවල සහ මූල්‍ය, ආර්ථික කටයුතු, නිවාස සංවර්ධන, ඉදිකිරීම් සහ තෘතීයික අධ්‍යාපනය යන ක්ෂේත්‍රවල රාජ්‍ය සහ රාජ්‍ය නොවන කමිටු කිහිපයකම ද සේවය කර ඇත. එමෙන්ම ඔහු ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ ලංකා ක්ලියර් ප්‍රයිවට් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලයේද කටයුතු කර ඇත.

සාලී මහතා බැංකු හා මූල්‍ය පිළිබඳ ආර්ථික විද්‍යා (විශේෂ) පළමු පන්තියේ ගෞරව උපාධියක්, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් සහ මූල්‍ය සාංගමික කාර්යසාධන කළමනාකරණය පිළිබඳ උපාධියක්ද හිමිකරගෙන ඇත. ආයතනික අංශයේ ඔහු සතු පළපුරුද්ද වසර 40 ඉක්මවන අතර, ඉන් වසර 20කට වැඩි කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ ද වසර 14ක් වැඩි කාලයක්, කළමනාකරණ අධ්‍යක්ෂකවරයෙකු /ප්‍රධාන විධායක නිලධාරියෙකු ලෙසද වසර 30කට වැඩි කාලයක් අධ්‍යක්ෂක මණ්ඩල මට්ටමේ ඇත්දැකීම් ලබා ඇත. ඔහු විවිධ සමාගම්වල විධායක, විධායක නොවන සහ ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ මණ්ඩල තනතුරු හොබවා ඇත.

ලාභ අලාභ බෙදාගැනීමේ බැංකු ආකෘතිය මත පදනම්ව ශ්‍රී ලංකාව තුළ පොලී රහිත බැංකුකරණ ක්‍රමය ආරම්භ කිරීම, සංවර්ධනය කිරීම සහ ඉදිරියට ගෙන යාම සහ ශ්‍රී ලංකාවේ ප්‍රථම පොලී රහිත බලපත්‍රලාභී වාණිජ බැංකුව ලෙස අමානා බැංකුව පිහිටුවීම සඳහා ඔහු කැපී පෙනෙන උපායමාර්ගික සහ මෙහෙයුම් නායකත්ව කාර්යභාරයක් ඉටු කළ අතර එහි ආරම්භක කළමනාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරියා ද ඔහු විය.

ඔහු ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ ආසන්නතම හිටපු සභාපතිවරයා ය; අධ්‍යක්ෂ මණ්ඩල නායකත්වය සහ පාලනය පිළිබඳ ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාවයේ සහතික ලත් පුහුණුකරුවෙකු වන අතර පශ්චාත් උපාධි මට්ටමින්

මනිල් ජයසිංහ මහතා
හෙක්ටර් මනිල් ඇන්තනි ජයසිංහ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු, වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (එක්සත් රාජධානියේ) සාමාජිකයෙකු, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකු සහ රාජ්‍ය මූල්‍ය සහ ගණකාධිකරණය පිළිබඳ වරලත් ආයතනයේ සාමාජිකයෙකි.

අර්නස්ට් ඇන්ඩ් යංග්හි සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ජයසිංහ මහතා, වසර 30ක් පුරා අර්නස්ට් ඇන්ඩ් යංග්හි හවුල්කරු ලෙසින් නිෂ්පාදන, සිල්ලර වෙළෙඳාම් , ආගන්තුක සත්කාර, තොග ව්‍යාපාර සහ විදුලි සංදේශ ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක පුළුල් අත්දැකීම් ලබා ඇත. එමෙන්ම, 2021-2023 දක්වා අර්නස්ට් ඇන්ඩ් යංග් ශ්‍රී ලංකා ආයතනයෙහි සහ මාලදිවයිනෙහි රාෂ්ට කළමනාකාර හවුල්කරු, ඇෂුවරන්ස් සහ බැංකු සහ මූල්‍ය සේවා කටයුතු හාර ප්‍රධානී ලෙස හා 2003-2023 දක්වා ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණු අධ්‍යක්ෂවරයා විය. ව්‍යාපාර ඇගයීම සහ මූල්‍ය ආයතන සඳහා උපාය මාර්ගික සැලසුම් සංවර්ධනය කිරීමෙහිලා ඔහු සතු වූ ශක්තිය ජයසිංහ මහතා මූල්‍ය සේවාවන්හි ප්‍රධාන සම්පතක් බවට පත් කළේය. ඔහු ශ්‍රී ලංකා ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්හි / SLAS Desk හි ප්‍රධානියා ලෙසද කටයුතු කළේය.

වසර 41 කට අධික උපදේශක සහ කර්මාන්ත අත්දැකීම් සහිත ඔහුගේ වෘත්තීය ජීවිතය තුළ, ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති සහ කවුන්සිල සාමාජිකයෙකු, ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු, ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගනකාදිකාරීවරුන්ගේ ආයතනයේ කවුන්සිල සාමාජිකයෙකු, ශ්‍රී ලංකා කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනයේ සමාජිකයෙකු, මොරටුව විශ්වවිද්‍යාලයේ කවුන්සිල සාමාජිකයෙකු, ජාත්‍යන්තර ගණකාධිකාරීවරුන්ගේ ෆෙඩරේෂණයේ ජාත්‍යන්තර ගිනුම්කරණ අධ්‍යාපන මණ්ඩලයේ සාමාජිකයෙකු, මහ බැංකුවේ විගණන උපදේශක කමිටුවේ සාමාජිකයෙකු, පොදු ලයිස්තුගත සමාගම් හා බැංකු පිළිබඳ විගණන කමිටුවල උපදේශකයෙකු, සහ ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස සේවය කළේය.

වර්තමානයෙහි ඔහු, ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සභාපති, ව්‍යවස්ථාපිත විගණන ප්‍රමිති කමිටුවේ සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ තවත් බොහෝ කමිටුවල සේවය කරයි. තවද, ඔහු මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ක්‍රියාත්මක කිරීමේ සහ අර්ථකථන කමිටුවේ (FRSIICS) සාමාජිකයෙකු, දකුණු ආසියානු ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනයේ (SAFA) ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සභාපති, ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයේ විගණන කමිටුවේ සාමාජිකයෙකු, ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සාමාජිකයෙකු, ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩල සාමාජිකයෙකු සහ ඩීසල් සහ මෝටර් ඉංජිනේරු පීඑල්සී, සිලෝන් හොස්පිටල්ස් පීඑල්සී, සී ඩබ්ලිව් මැකී පීඑල්සී, ලංකා මිල්ක් ෆුඩ්ස් (CWE) පී එල් සී, ලංකා ඩෙයරීස් ලිමිටඩ්, සහ සහස්‍රා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් හි විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකු ලෙස ද කටයුතු කරයි.

සුජීව මුදලිගේ මහතා
මුදලිගේ මහතා වරලත් ගණකාධිකාරිවරයෙකු ලෙස වසර 30කට වැඩි පළපුරුද්දක් ඇති අයෙකි. ඔහුගේ සුදුසුකම් වන්නේ FCA (ICA - SL), FCMA (CIMA - UK), FCCA (ACCA - UK) සහ FCPA (CPA - Australia) ය.

ඔහු මෑතකදී ශ්‍රී ලංකාවේ PwC හි කළමනාකාර හවුල්කරු ලෙස විශ්‍රාම ගිය අතර වෙළෙඳ සේවා අර්ථසාධක සංගමයේ (MSPS) විධායක නොවන සභාපති වශයෙන් කටයුතු කරයි. ඔහු එන් ඩී බී බැන්ක් පී එල් සී, සී අයි සී හෝල්ඩිංග්ස් පී එල් සී, සී අයි සී ෆිඩ්ස් සමූහය, එන් එස් බී එම් හරිත විශ්වවිද්‍යාලය, ලින්ක් නැවුරල් ප්‍රොඩක්ට්ස් ලිමිටඩ්, ෂර්වුඩ් කැපිටල් සහ අයිඩියල් ෆයිනෑන්ස් ලිමිටඩ්හි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ද වේ. ඔහු ලංකා වාණිජ මණ්ඩල කමිටු සාමාජිකයෙකි.

මුදලිගේ මහතාට රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම ආයතනවල විගණන කමිටු සභාපතිවරයකු ලෙස අත්දැකීම් බහුලය. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (ICASL) සහ ආසියා පැසිෆික් ගණකාධිකාරීවරුන්ගේ (CAPA) ආයතනයේ හිටපු සභාපතිවරයෙකු වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ කවුන්සිල සාමාජිකයෙකු සහ එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනයේ - ශ්‍රී ලංකා අංශයේ පාලක මණ්ඩල සාමාජිකයෙකු ලෙසද, ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ, කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙසද (2010-2011), සහ ඔහුගේ වෘත්තීය කාලය තුළ දේශීය හා ගෝලීය වශයෙන් එවැනි තවත් තනතුරු කිහිපයක් දරා තිබේ.

ඔහු 2012 සිට 2019 දක්වා හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී (HNB) හි විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ද විය. ඔහු මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශක කමිටුවේ නියෝජ්‍ය සභාපතිවරයෙකු ලෙසත්, ජාතික ආර්ථික සභාවට උපදෙස් දීම සඳහා වන උපදේශක කමිටු සාමාජිකයෙකු ලෙසත් සහ අසාර්ථක බලපතුලාභී මූල්‍ය සමාගම් පුනර්ජීවනය සඳහා වූ උපදේශක කමිටුවෙහි සමාජිකයකු ලෙසත් කටයුතු කර ඇත.

ඇන්ටන් ගොඩ්ෆ්‍රි මහතා

විධායක සභාපති - ඇග්සා ග්ලෝබල් සහ AG ඉන්ටර්නැෂනල්. ඇන්ටන් ගොඩ්ෆ්‍රි මහතා ඇග්සා ග්ලෝබල් සහ AG ඉන්ටර්නැෂනල්හි නිර්මාතෘ/විධායක සභාපතිවරයා වේ. එමෙන්ම ඔහු සමාගමේ ගෝලීය ව්‍යාපාරික කාර්යයන්හි සීමා පුළුල් කිරීම් සම්බන්ධයෙන් ඉදිරියෙන් සිටින ව්‍යාපාරික දක්ෂතාවයෙන් යුත් කීර්තිමත් ව්‍යවසායකයෙකි. ඔහු වෘත්තීයභාවයේ ඉහළම ප්‍රමිතීන් රකිමින් සියලුම පාර්ශවකරුවන් සම්බන්ධයෙන් වගකීම් පවත්වාගෙන යනු ලබයි.

ජයග්‍රහණ ඉලක්ක කරගත්, නවෝත්පාදනය කෙරෙහි අවධානය යොමු කර, පවතින ව්‍යාපාර ජාලයන් තවදුරටත් ව්‍යාප්ත කිරීමට දිරිගැන්වීම සඳහා ඔහු කැපවී සිටී. ඔහුගේ දැක්ම සහ නව්‍යතාවයන් හේතුවෙන්, වෙළෙඳාම, බලශක්තිය, රසායනික ද්‍රව්‍ය, පල්ප් සහ කඩදාසි, තාක්ෂණය, ආයතනික පාරිභෝගික සේවා සහ බාහිරින් ලබා ගැනීමේ අංශවල ලෝකයේ ප්‍රමුඛතම සන්නාම කිහිපයක් ඇග්සා ග්ලෝබල් සහ AG ඉන්ටර්නැෂනල් නියෝජනය කරයි.

ඇග්සා ග්ලෝබල් ආයතනයට අනුබද්ධ ආයතන ශ්‍රී ලංකාව, ඉන්දියාව, සිංගප්පූරුව සහ ඕස්ට්‍රේලියාව යන රටවල පිහිටා ඇති අතර ප්‍රධාන ජාල ආසියාව, යුරෝපය, උතුරු ඇමරිකාව සහ අප්‍රිකාව පුරා විහිදේ. බාහිර විදේශීය පොදු ලැයිස්තුගත කිරීම් ඇතුළු හවුල් ව්‍යාපාර ලෙස Fonte Resources, Fusionex, පෙන්වාදිය හැකිය. ඔහුගේ ජයග්‍රහණ අගයමින් ගොඩ්ෆ්‍රේ මහතාට APEA 2013 හි විශිෂ්ට ආසියා පැසිෆික් ව්‍යවසායකත්ව සම්මානය හිමි විය.

ඔහු එංගලන්තයේ වරලත් කළමනාකරණ ආයතනයට අනුබද්ධ වරලත් අලෙවිකරුවෙකු වන අතර එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ සහ ඕස්ට්‍රේලියානු කළමනාකරණ ආයතනයෙහි සාමාජිකයෙකි. ඔහු එංගලන්තයේ Leicester විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් ද ලබා ඇත. ඇන්ටන් ගොඩ්ෆ්‍රි මහතා ශ්‍රී ලංකාවේ සහ ඕස්ට්‍රේලියාවේ වාණිජ මණ්ඩලය ඇතුළු ජාත්‍යන්තර වෙළෙඳ කවුන්සිලයන්හී ක්‍රියාකාරීව සම්බන්ධ වී ඇත.

ඔහු වියට්නාමයේ ශ්‍රී ලංකා ව්‍යාපාරික කවුන්සිලයේ, ලංකා වාණිජ මණ්ඩලයේ ඉන්දුනීසියාවේ ශ්‍රී ලංකා ව්‍යාපාරික කවුන්සිලයේ සහ කලම්බු අප්ටවුන් හි රොටරි සමාජයේ හිටපු සභාපතිවරයා වන අතර 2015-2019 අතර කොළඹ කොටස් හුවමාරුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ද සේවය කර ඇත.

ආර්.එම්.පී. රත්නායක මහතා

ආර්.එම්.පී.රත්නායක මහතා ශ්‍රී ලංකා සැලසුම් සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන අතර දැනට මුදල් අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ලෙස කටයුතු කරයි. ඔහු වසර 30 කට ආසන්න කාලයක් විවිධ වැදගත් තනතුරු දරමින් රාජ්‍ය සේවයේ යෙදී සිටී. රත්නායක මහතා නෝර්වේ කෘෂිකාර්මික විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා ඇත.

1994 දී රාජ්‍ය සේවයට බැඳුණු ඔහු මහා භාණ්ඩාගාරයට අනුයුක්තව කටයුතු කරමින් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ හා බාහිර සම්පත් දෙපාර්තමේන්තුවේ (ERD) තනතුරු ගණනාවක් දරා ඇත. සංවර්ධන සැලසුම්කරණය සහ අයවැය සැකසීම සම්බන්ධයෙන් ඔහුට පුළුල් අත්දැකීම් තිබේ. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ඔහු සංවර්ධන හවුල්කරුවන්, ජාත්‍යන්තර මූල්‍ය ආයතන සහ ප්‍රාග්ධන වෙළඳපොළ සමඟ එක්ව රටකට සුවිශේෂී වූ සංවර්ධන වැඩසටහන් දියත් කිරීම සහ විදේශ මූල්‍යකරණය, ද්විපාර්ශ්වික සාකච්ඡා මෙහෙයවීම සහ බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා විදේශ මූල්‍ය කාලීනව යෙදවීමට පහසුකම් සැලසීම සඳහා ඔහු වගකීම් දරා ඇත.

රත්නායක මහතා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා ලෙස කටයුතු කිරීමට අමතරව, ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB), ලංකා බැංකුවේ සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කරයි. ඔහු ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපති, මහජන බැංකුවේ අධ්‍යක්ෂ, වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ (PGIM) කළමනාකරණ මණ්ඩලයේ සාමාජික, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ (SPC) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ, ජාතික වෛද්‍ය නියාමන අධිකාරියේ සාමාජිකයකු ලෙස තවත් වැදගත් නායකත්ව තනතුරු රැසක් දරා ඇත.

ඉවට් ප්‍රනාන්දු මිය

ඉවෙට් ප්‍රනාන්දු මහත්මිය දැනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරිය ලෙස කටයුතු කරන අතර මූල්‍ය පද්ධති ස්ථායිතා අංශය භාරව කටයුතු කරයි. බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල අධීක්ෂණය සහ නියාමනය, මූල්‍ය පද්ධති ස්ථායිතාව, විදේශ විනිමය කළමනාකරණය, මුදල් කළමනාකරණය, ගෙවීම් සහ පියවීම් යනාදී ක්ෂේත්‍රවල මහ බැංකුවේ වසර 30කට වැඩි සේවා කාලයක් ඇය සතුය. මෙම කාලසීමාව තුළ ප්‍රනාන්දු මහත්මිය බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ සහ විනිමය පාලකවරිය ලෙස කටයුතු කර ඇති අතර ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ ආචාරධර්ම භාවිතයන්ට අනුකූලව බැංකු සඳහා ශක්තිමත් නියාමන රාමුවක් ක්‍රියාත්මක කිරීමට නායකත්වය ලබා දෙමින් මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට දායක වීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. වර්තමානයේ ඇය බැංකු අධීක්ෂණය, බැංකු නොවන අධීක්ෂණ, ගෙවීම් සහ පියවීම්, මුදල්, විදේශ විනිමය, මුදල්, ප්‍රාදේශීය සංවර්ධන සහ සේවක අර්ථසාධක අරමුදල යන දෙපාර්තමේන්තු භාරව කටයුතු කරයි.

ප්‍රනාන්දු මහත්මිය දැනට මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුවේ, ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය සඳහා සැළසුම් ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් කමිටුවේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාතික ගෙවීම් කවුන්සිලයේ, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යංශයේ සභාපතිනිය ලෙස සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

ප්‍රනාන්දු මහත්මිය කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් ලබා ඇත.

සංජීව දිසානායක මහතා

සංජීව දිසානායක මහතා 1997 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස ඇතුළත් කර බඳවා ගන්නා ලදී. ඔහු හොංකොං විශ්ව විද්‍යාලයෙන් මානව හිමිකම් පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (LLM) ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුවට අනුයුක්ත නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයෙකු වන අතර දැනට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ලෙස රාජකාරී භාර ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (PSC) විසින් නිදහස් කර ඇත.

කොමිෂන් සභා සාමාජිකයින්

සංජීව දිසානායක මහතා නීතිපති දෙපාර්තමේන්තුවේ අපරාධ සහ සිවිල් අංශ දෙකෙහිම අත්දැකීම් ඇති අතර 2010 පෙබරවාරි සිට 2011 ජූලි දක්වා දූෂණයට එරෙහි ෆීජි ස්වාධීන කොමිසමේ අභිචෝදකයකු ලෙස කටයුතු කර ඇත. ඔහු ගිණුම්කරණ ප්‍රමිති කමිටුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ නිල බලයෙන් පත් වූ සාමාජිකයෙකු ද වේ.

ඒ. නිලන්ති ජයකි ද අල්විස් මහත්මිය

ජයකි ද අල්විස් මහත්මිය වසර 35කට ආසන්න කාලයක් නීති ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීව නියැලී සිටින අතර ශ්‍රී ලංකාවේ සිවිල් සහ අපරාධ නීතිය පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇය සතුය. ඇය ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයෙන් අපරාධ යුක්තිය, නීතිවිරෝධී සහ කාන්තා සහ ළමා අයිතිවාසිකම් නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (LLM) ලබා ඇත. ඇය 1985 දී ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් වූ අතර අවසාන විභාගයෙන් සමත් වූ පසු ජනාධිපති නීතීඥ කෝසල විජයතිලක මහතාගේ ප්‍රධානත්වය යටතේ ආධුනිකත්වය සම්පූර්ණ කර 1989 අප්‍රේල් මස ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරියක් ලෙස ඇතුළත් වී ලියාපදිංචි වූවාය.

1989 සිට 1991 දක්වා ඇය කළමනාකරණ හවුස් ලිමිටඩ් හි නීති නිලධාරිනියක ලෙස සේවය කළ අතර සමාගම් ලේකම් අංශයේ කටයුතු කළාය.

1991 දී ඇය නිල නොවන නීතීඥ සංගමයේ අපරාධ නඩු කටයුතු ආරම්භ කර ඇති අතර නීතිඥවරියක ලෙස ද විය. වසර හතක දීර්ඝ කාලයක් ක්‍රියාකාරීව සේවයේ යෙදී සිටින අතරතුර ඇය 1998 වර්ෂයේදී ශ්‍රී ලංකා අධිකරණය ක්ෂේත්‍රයේ මහේස්ත්‍රාත් / දිසා විනිසුරුවරියක් ලෙස පත්වී අනතුරුව මහාධිකරණ විනිසුරුවරියක ලෙස උසස්වීම් ලබා ඇත. ඇය අධිකරණයේ මහේස්ත්‍රාත්වරියක්, දිසා විනිසුරුවරියක්, මහාධිකරණ විනිසුරු (අපරාධ) සහ සිවිල් අභියාචනා මහාධිකරණයේ විනිසුරුවරියක් ලෙස විවිධ අධිකරණ බල ප්‍රදේශවල සේවය කර ඇත.

ඇය අධිකරණ සේවා සංගමයේ (JSA- ශ්‍රී ලංකාවේ සියලුම මහේස්ත්‍රාත්වරුන් සහ දිසා විනිසුරුවරුන්ගෙන් සමන්විත සංගමය, (HCJA - රටේ සියලුම මහාධිකරණ විනිසුරුවරුන්ගෙන් සමන්විත සංගමය) කමිටු සාමාජිකාවක්, සහකාර ලේකම් සහ භාණ්ඩාගාරික ලෙස තනතුරු දරමින් කටයුතු කර ඇත.

ද අල්විස් මහත්මිය, 2011 දී ඉන්දියාවේ බෝපාල්හී ජාතික අධිකරණ ඇකඩමිය, 2015 දී මැලේසියාවේ අධිකරණ හා පුහුණු ආයතනය, 2016 දී ඉන්දියාවේ නවදිල්ලිහි අධිකරණ හා පුහුණු ආයතනය, 2017 දී ඉන්දියාවේ පන්ජාබ්/හර්යානා, චන්දිගාර්හී අධිකරණ හා පුහුණු ආයතනය, 2019 දී ඉන්දියාවේ මහාරාෂ්ට්‍රාහී අධිකරණ ඇකඩමිය සහ 2008 දී බැංකොක් හි පැවති "හරිත විනිසුරු මඩුල්ල" ඇතුළු ගෝලීය වැඩමුළු රැසකදී ඇය දකුණු ආසියානු නීති කණ්ඩායමේ එකම අධිකරණ නිලධාරිනිය ලෙස ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත.

වර්තමාන දිනවල, ද අල්විස් මහත්මිය ඉන්දියානු කාන්තා වාණිජ හා කර්මාන්ත මණ්ඩලය විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණවල දැනුම හුවමාරු කර ගැනීම සඳහා නිතර ආරාධිත කථිකයෙකු ලෙස සම්බන්ධ වේ -WICCI

ද අල්විස් මහත්මිය ඇයගේ ගෞරවනීය තනතුරු සමඟින් වඩාත් සාධාරණ සහ සාධාරණ සමාජයක් බිහි කිරීම සඳහා නොසැලෙන කැපවීමක් බෙදාහදා ගනිමින් සහ අඛණ්ඩව අමිල අවබෝධයක් ලබා දී ඇත.

හේෂණ කුරුප්පු මහතා

හේෂණ කුරුප්පු මහතා වරලත් ගණකාධිකාරීවරයෙකු වන අතර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ (බැංකු සහ මූල්‍ය) ශාස්ත්‍රපති උපාධිධරයෙකු, කොළඹ විශ්ව විද්‍යාලයේ මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙකු හා, වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකු ද වේ. එමෙන්ම ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ගණකාධිකරණය පිළිබඳ විද්‍යාවේදී පළමු පෙළ උපාධියක්ද හිමිකරගෙන ඇත.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙහි සභාපති හා ඩේවිඩ් පීරිස් සමාගම් සමූහයේ සමූහ මූල්‍ය අධ්‍යක්ෂකවරයෙකු ද වේ.

කුරුප්පු මහතා දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) සභාපති ලෙස ද කටයුතු කරයි. ඔහු 2023 වර්ෂයේදී දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ උප සභාපතිවරයා ලෙසත්, 2020/2021 වර්ෂයේදී විනිවිදභාවය, වගවීම සහ පාලනය වැඩිදියුණු කිරීම සඳහා වූ කමිටුවේ (ITAG) සභාපතිවරයා ලෙසත් සේවය කළේය.

ඔහු දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ ව්‍යාපාර පිළිබඳ වෘත්තීය ගණකාධිකාරීවරුන්ගේ (PAIB) කමිටුවේ සාමාජිකයෙකු ලෙස සහ සාර්ක් රටවල රාජ්‍ය මූල්‍ය පාලන තන්ත්‍ර සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ව්‍යාපාර අවශ්‍යතා අධ්‍යයනය කිරීමේ කමිටුවේ සාමාජිකයෙකු ලෙස සේවය කළේය.

කුරුප්පු මහතා ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ (SLAASMB) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි.

අධ්‍යක්ෂකවරුන්, අධ්‍යක්ෂකවරියන්, සහකාර අධ්‍යක්ෂකවරුන් සහ සහකාර අධ්‍යක්ෂකවරියන්



වමේ සිට දකුණට: ශර්මිලා පණ්ඩිතරත්න - සහකාර අධ්‍යක්ෂ, නීති හා බලාත්මකකිරීම. තුෂාරි රඹුක්පොත - සහකාර අධ්‍යක්ෂ, මානව සම්පත් සහ ආයතනික පර්වර්තන. මනුරි වීරසිංහ - අධ්‍යක්ෂ, සාංගමික කටයුතු. සුනෙත් පෙරේරා - සහකාර අධ්‍යක්ෂ, අධීක්ෂණ. මධුයංගනී බලපිටිය - සහකාර අධ්‍යක්ෂ, විමර්ශන. ඩී. එම්. ජී. ප්‍රියන්ත - සහකාර අධ්‍යක්ෂ, ප්‍රාග්ධන වෙළෙඳපොල සංවර්ධන. තුෂාර ජයරත්න - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්. චින්තක මෙන්ඩිස් - අධ්‍යක්ෂ ජනරාල්, රියාස් බෙරි - අධ්‍යක්ෂ, විමර්ශන සහ බලාත්මක කිරීම. ජී. එච්. නිරෝෂා කොඩිකාර - අධ්‍යක්ෂ මූල්‍ය සහ පරිපාලන. මධුර වනිගසේකර - ප්‍රධාන ඩිජිටල් නිලධාරි. චිරන්ති කුරේ - අධ්‍යක්ෂ, මානව සම්පත් සහ ආයතනිත පරිවර්තන. දිලුම් මහවත්ත - අධ්‍යක්ෂ, අධීක්ෂණ.

නොපැමිණි: ධම්මික පෙරේරා - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනියන්



වමේ සිට දකුණට: ෂීනා ගුණරත්න - ජ්‍යෙෂ්ඨ කාළමනාකාරිනී, අභ්‍යන්තර සම්බන්ධතා. රන්මිණි ජයතිලක - ජ්‍යෙෂ්ඨ කාළමනාකාරිනී, තොරතුරු තාක්ෂණ. සයුමි කොඩිප්පිලි - ජ්‍යෙෂ්ඨ කාළමනාකාරිනී, අධීක්ෂණ. සජීවනී බක්මීදෙණිය - ජ්‍යෙෂ්ඨ කාළමනාකාරිනී, ප්‍රාග්ධණ වෙළෙඳපොල අධ්‍යාපන. මංජුල චන්ද්‍රරත්න - ජ්‍යෙෂ්ඨ කාළමනාකාරිනී, ආවේක්ෂණ.

කළමනාකරුවන්/කළමනාකාරිනියන්



වමේ සිට දකුණට: ප්‍රියන්ත හේරත් - කළමනාකරු, විමර්ශන. නොමානී සෙනෙවිරත්න - කළමනාකාරිනී, අධීක්ෂණ. බුද්ධිනී හේරත් - කළමනාකරිනී, නීති සහ බලාත්මකකිරීම. ආර්. කේ. වසන්ත සුනිමල් - කළමනාකරු, අධීක්ෂණ. මේබලා ජයපාල - කළමනාකාරිනී, අධීක්ෂණ. වයි. ඩී. සඳමාලී - කළමනාකාරිනී මූල්‍ය සහ පරිපාලන. නිමල් කුමාරසිංහ - කළමනාකරු, අභ්‍යන්තර සම්බන්ධතා. අනුලා විජේසිංහ - කළමනාකාරිනී, විමර්ශන.

වමේ සිට දකුණට අසුන්ගෙන: තක්ෂිලා ෆ්‍රැන්සිස් - කළමනාකරිනී, ප්‍රාග්ධන වෙළෙඳපොල සංවර්ධන. පී. එම්. නිරෝෂිකා උදයංගනී - කළමනාකාරිනී, නීති සහ බලාත්මකකිරීම. ලක්මිමී වික්‍රමනායක - කළමනාකරිනී, මූලය සහ පරිපාලන. අසෝක ඩී දයාරත්න - කළමනාකරු මානව සම්පත්.

වසරේ විශේෂ අවස්ථාවන්



ප්‍රාග්ධන වෙළෙඳපොළ සංගම් පිහිටුවීමේ සමාරම්භක උත්සවය



ප්‍රාග්ධන වෙළෙඳපොළ සංගම් පිහිටුවීමේ සමාරම්භක උත්සවය



ගුරු පුහුණු වැඩමටහනක්



ලයිස්තුගත සමාගම් සඳහා සාංගමික පාලන රීති සංශෝධනය කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය



කොටස් තැරැව්කාර සමාගම්වල හිමිකරුවන් සහ ප්‍රධාන විධායක නිලධාරීන් සමඟ සාකච්ඡාව



2023 මූල්‍ය සාක්ෂරතා දිනය සමරමින් සීනුව නාද කිරීමේ අවස්ථාව



විගණකවරුන් සමඟ පැවති සාකච්ඡාව

වසරේ විශේෂ අවස්ථාවන්



මීගමුව ආයෝජක සම්මන්ත්‍රණය



සිසුන් සඳහා පැවති සම්මන්ත්‍රණයක්



අනුරාධපුර ආයෝජක සම්මන්ත්‍රණය



"වාර්සිටි බැට්ල්ස් "අවසන් මහා තරඟය



උපාධි අපේක්ෂකයින් සඳහා පැවති වැඩමුළුවක්



ශ්‍රී ලංකා වරලත් මූල්‍ය විශ්ලේෂකයින්ගේ සංගමය සමඟ අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම



නිර්භීත දැක්මක්

මෙහෙයුම් සමාලෝචනය

උපායමාර්ගික අරමුණු 124 | උපායමාර්ගික අරමුණු 239 | උපායමාර්ගික අරමුණු 351 | උපායමාර්ගික අරමුණු 455
උපායමාර්ගික අරමුණු 558 | වසරේ විශේෂ අවස්ථාවන් 63



උපායමාර්ගික අරමුණු 1

ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම

වර්තමාන ගතික මූල්‍ය පරිසරය තුළ, ශක්තිමත් නියාමන පරිසරයක්, විශේෂයෙන්ම සුරැකුම්පත් නියාමනය ක්ෂේත්‍රය තුළ අත්‍යවශ්‍යය. වෙළෙඳපොළ ස්ථාවරත්වය, රඳා පවතින්නේ අධීක්ෂණය, සාධාරණ වත්පිළිවෙත්, ආයෝජක ආරක්ෂාව සහ පද්ධතිමය ඔරොත්තු දීමේ හැකියාව මතය. සුරැකුම්පත් නියාමනය බහුවිධ රාමුවක් නිර්මාණය කර ඇත. එහි අඩංගු වන්නේ සුරැකුම්පත් නිකුතු, හෙළිදරව් කිරීම සහ ගණුදෙණු කිරීම පාලනය කිරීම.

සුරැකුම්පත් නියාමනය, ප්‍රමිතීන්, විනිවිදභාවය, වගවීම සහ වෙළෙඳපොළ හැසිරීම ස්ථාපිත කරයි. එසේ කරන්නේ ආයෝජකයින් අතර විශ්වාසය වර්ධනය කිරීමට සහ වෙළෙඳපොළ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගනිමින්.

ශක්තිමත් නියාමනයක ප්‍රධාන සංරචක වන්නේ, දැඩි හෙළිදරව් කිරීම්, බලාත්මක කිරීමේ යාන්ත්‍රණ, සහ වෙළෙඳපොළ අබණ්ඩ අධීක්ෂණය කටයුතු කිරීම. මෙම පියවරයන් වංචනික වත්පිළිවෙත්, පද්ධතිමය අවදානම් අවම කිරීම, සහ මූල්‍ය වෙළෙඳපොළේ අබණ්ඩතාව ආරක්ෂා කිරීම ක්‍රියාකරයි.

බලපත්‍ර ලබා දීම

සාධාරණ, ක්‍රමවත්, කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුත් සුරැකුම්පත් වෙළෙඳපොළක් ඇති කිරීම සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමකයා ලෙස, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වීමට ආයතනවලට බලපත්‍ර නිකුත් කරන්නා ලෙස තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ආයතනවලට බලපත්‍ර ලබා දීමත් ඉන් අනතුරුව එම ආයතන අබණ්ඩව අධීක්ෂණය කිරීම තුළින්, මූල්‍ය වෙළෙඳපොළ විශ්වසනීයත්වය සහ ස්ථාවරත්වය පවත්වා ගැනීමත්, ආයෝජකයින් අතර විශ්වාසනීයත්වය වර්ධනය කිරීමත්, සාධාරණ හා ක්‍රමවත් වෙළෙඳ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීමත් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මූලික කාර්යය භාරය වෙයි.

වෙළෙඳපොළ ආයතන සහ වෙළෙඳපොළ අතරමැදියන් සඳහා බලපත්‍ර ලබා දීම අදියර දෙකක ක්‍රියාවලියකින් සිදු වේ. නව අයදුම්කරුවන් අදාළ බලපත්‍රය ලබා ගැනීම සඳහා පළමු අවස්ථාවේ දී ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා ගත යුතු අතර, බලපත්‍ර ලබා තම මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීමට, එක් එක් බලපත්‍ර කාණ්ඩය සඳහා අදාළ රීතිවල දක්වා ඇති සියලුම අවශ්‍යතා සපුරාලීම අවශ්‍ය වේ.

අදාළ නීතිරීතිවලට අනුගතවීම, සමාගම්වල අධ්‍යක්ෂවරුන් ඇතුළු ප්‍රධාන කළමනාකාරිත්වයේ සහ සේවාදායකයින් සමඟ ගණුදෙනු කරන පුද්ගලයන්ගේ සුදුසුකම් සහ යෝග්‍යතා, ප්‍රමාණවත් සාංගමික යහපාලනයන් යනාදිය සමාලෝචනය කිරීමෙන් පසු වාර්ෂිකව වෙළෙඳපොළ අතරමැදියන්ට ලබා දෙන බලපත්‍ර අළුත් කිරීම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.

සමාලෝචිත වර්ෂය තුළ ආයතන සඳහා ලබා දී ඇති නව බලපත්‍ර සහ 2023 දෙසැම්බර් 31 දිනට බලපත්‍රලාභී ආයතන සංඛ්‍යාව පහත පරිදි වේ. (සංඛ්‍යා සටහන 01)

සංඛ්‍යා සටහන 01: 2023 දී ආයතන සඳහා බලපත්‍ර ලබා දීම

බලපත්‍ර වර්ගය	2023 වර්ෂය තුළ ලබා දී ඇති නව බලපත්‍ර	2023 දෙසැම්බර් 31 දිනට බලපත්‍රලාභී මුළු ආයතන සංඛ්‍යාව
කොටස් භුවමාරු	-	01
නිශ්කාශනාගාර	-	01
මධ්‍යම තැන්පතුගාර	-	01
කොටස් තැරැව්කරුවන්	-	27
කොටස් වෙළෙඳුන්	-	11
කළමනාකරණ සමාගම් *	06	16
ආයෝජන කළමනාකරුවන්	01	22
ආන්තික ණය සපයන්නන්	01	20
ප්‍රාරක්ෂකයින්	-	08
ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන	-	02
සාංගමික මූල්‍ය උපදේශකයින්	04	04

*කළමනාකරණ සමාගම්

සාමූහික ආයෝජන යෝජනා ක්‍රම (CIS) ක්‍රියාත්මක කිරීමට බලය ලත් සමාගම්

සමාලෝචිත වර්ෂය තුළ, අදාළ කළමනාකරණ සමාගම් යටතේ මහජනතාවට හඳුන්වාදීමට නියමිත සාමූහික ආයෝජන යෝජනා ක්‍රම (CIS) හයක් සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

2023 දෙසැම්බර් 31 වන දිනට අනුමත සාමූහික ආයෝජන යෝජනා ක්‍රම 84 ක් ක්‍රියාත්මක විය. (සංඛ්‍යා සටහන 02)

සංඛ්‍යා සටහන 02: 2023 දී බලපත්‍රලාභී මුළු ආයතන සංඛ්‍යාව

බලපත්‍ර වර්ගය	බලපත්‍රලාභී මුළු ආයතන සංඛ්‍යාව	
	2022 දෙසැම්බර් 31 දිනට	2023 දෙසැම්බර් 31 දිනට
කොටස් හුවමාරු	01	01
නිශ්කාෂනාගාර	01	01
මධ්‍යම තැන්පතුගාර	01	01
කොටස් තැරැව්කරුවන්	28	27
කොටස් වෙළෙඳුන්	12	11
කළමනාකරණ සමාගම්	17	16
ආයෝජන කළමනාකරුවන්	23	22
ආන්තික ණය සපයන්නන්	20	20
ප්‍රාරක්ෂකයින්	08	08
ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන	03	02
සාංගමික මූල්‍ය උපදේශකයින්	-	04

සමාලෝචිත වර්ෂය තුළ, පහත ලයිස්තුගත කර ඇති සමාගම් තම මෙහෙයුම් ස්ව කැමැත්තෙන් නවතාලීමට ඉල්ලීම් සිදුකර තිබූ බැවින් මෙම ආයතන පහේ බලපත්‍ර අත්හිටවන ලදි.

ආන්තික ණය සැපයුම්කරු- පේ බී ක්‍රෙඩිට් ප්‍රයිවට් ලිමිටඩ්.
ආයෝජන කළමනාකරු - සීමාසහිත එන් එස් බී අරමුදල් කළමනාකරණ සමාගම
ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතන - ඉක්රා ලංකා ලිමිටඩ්
කොටස් තැරැව්කරු - සීමාසහිත එන් එස් බී අරමුදල් කළමනාකරණ සමාගම
කොටස් වෙළෙඳ කටයතු - සීමාසහිත එන් එස් බී අරමුදල් කළමනාකරණ සමාගම

සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කළමනාකරණ සමාගම් දෙකක් ඒකාබද්ධ කිරීමට ද පහසුකම් සලසන ලද අතර එසේ ඒකාබද්ධ වූයේ ගාර්ඩියන් ඇක්විටි ඇසෙට් මැනේජ්මන්ට් සමාගම (Guardian Acuity Asset Management) සහ සී ටී සී එල් එස් ඒ ඇසෙට් මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් (CTCLSA Asset Management (Pvt) Ltd) යන සමාගමය. මේ හේතුවෙන් දැනට ක්‍රියාත්මකව පවතින්නේ සී ටී සී එල් එස් ඒ ඇසෙට් මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් යන ආයතනයයි.
(සංඛ්‍යා සටහන 03)

සංඛ්‍යා සටහන 03: 2023 දී මුළු සාමූහික ආයෝජන යෝජනා ක්‍රම ගණන

	සාමූහික ආයෝජන යෝජනා ක්‍රම	
	2022 දෙසැම්බර් 31 දිනට	2023 දෙසැම්බර් 31 දිනට
අනුමත සාමූහික ආයෝජන යෝජනා ක්‍රම	81	84



සභාපතිතුමාගේ සහ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ කාර්යාලය

ප්‍රතිපත්ති මුලපිරීම්

වෙළෙඳපොළ ආයතන සහ වෙළෙඳපොළ අතරමැදියන් සඳහා නියාමන ගාස්තු පැනවීම සඳහා සම්මත කළ යුතු රෙගුලාසි සඳහා ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නිර්දේශ.

කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වෙළෙඳපොළ ආයතන සහ වෙළෙඳපොළ අතරමැදියන් සම්බන්ධයෙන් යෝජිත සංශෝධිත ගාස්තු ව්‍යුහයන්, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට සංශෝධිත ගාස්තු අදාළ කර ගැනීමට අවශ්‍ය රෙගුලාසි සකස් කිරීම සඳහා ගරු. මුදල් අමාත්‍යවරයා වෙත යවා ඇත.

කොළඹ කොටස් වෙළෙඳපොළ අසාමූහිකරණය

වර්ෂ 2018 ජනවාරි 26 දිනැති ගැසට් පත්‍රයේ II වන කොටසේ 2018 පෙබරවාරි 1 වන දින නිකුත් කරන ලද අතිරේකයේ, කොළඹ කොටස් වෙළෙඳපොළ අසාමූහිකරණ පනත් කෙටුම්පත සඳහා කොළඹ කොටස් හුවමාරුව විසින් ඉදිරිපත් කරන ලද යෝජිත සංශෝධන, නීති හා බලාත්මක කිරීමේ අංශය විසින් සමාලෝචනය කරන ලදී.

කොළඹ කොටස් හුවමාරුව විසින් යෝජනා කරන ලද මෙම සංශෝධන පිළිබඳව පුළුල් ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව, කොමිෂන් සභාව තීරණය කළේ, යෝජිත කොළඹ කොටස් හුවමාරු පනත, වගකීමෙන් සීමා වූ සමාගමක් කොටස්වලට සීමා වූ සමාගමක් බවට පරිවර්තනය කිරීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් සහ කොළඹ කොටස් හුවමාරුවේ පසු අසාමූහිකරණය කිරීමේ අනෙකුත් ව්‍යාපාරික මෙහෙයුම් ක්‍රියාත්මක කළ යුත්තේ අසාමූහිකරණය කරන ලද හුවමාරුවේ සමාගම් ව්‍යවස්ථාව හරහා වන අතර පාර්ලිමේන්තුවේ කාරක සභා අවස්ථාවේදී පනත් කෙටුම්පතට කිසිදු ප්‍රධාන සංශෝධනයක් ඉදිරිපත් කළ නොහැක.

කොමිෂන් සභාව කොළඹ කොටස් හුවමාරුව වෙත සිය ඉහත ස්ථාවරය දැනුම් දුන් අතර, රටේ ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයේ ඇති හදිසි අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන, අසාමූහිකරණ ක්‍රියාවලිය කඩිනම් කිරීමේ වැදගත්කම කොළඹ කොටස් හුවමාරුව වෙත මෙන්ම රජයට ද දැනුම් දෙන ලදී.

අනුමැතිය ලබාදීම

දේශීය, කලාපීය සහ ගෝලීය අරමුදල් සඳහා අනුමැතිය ලබාදීම

මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාගමෙහි නිර්දේශය මත, කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇති සමාගම්වල කොටස්වල ආයෝජනය කිරීමට ගෝලීය, කලාපීය සහ දේශීය අරමුදල් සඳහා ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙයි. විනිමය පාලන රෙගුලාසි, වර්ෂ 2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත,

උපායමාර්ගික අරමුණු 1

ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම



නීති සහ බලාත්මකිරීමේ කණ්ඩායම

වර්ෂ 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් සම්බන්ධ නීතිවලට අනුකූලව මෙම අනුමැතිය ලබා දෙනු ලැබේ.

2023 වසර තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාවේ ලැයිස්තුගත සුරැකුම්පත්වල ආයෝජනය කිරීම සඳහා ගෝලීය, කලාපීය සහ දේශීය අරමුදල් 48 ක් සඳහා අනුමැතිය ලබාදී ඇති අතර, නම් වෙනස් කිරීම් 30 ක් වාර්තා ගතකරනු ලැබ ඇත.

කොළඹ කොටස් හුවමාරුවෙහි වෙළෙඳ සහභාගිවන්නන්ගේ රීති සමාලෝචනය (පෙර කොළඹ කොටස් හුවමාරුවෙහි කොටස් තැරැකිකාර රීති ලෙස හැඳින්වූ)

වර්ෂ 2023 අප්‍රේල් 03 වැනි දින සිට බලාත්මක වූ කොළඹ කොටස් හුවමාරුවෙහි වෙළෙඳ සහභාගිවන්නන්ගේ රීති, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු වර්ෂ 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතට අනුකූලව කොළඹ කොටස් හුවමාරුව විසින් පහත සඳහන් අවස්ථාවලදී සංශෝධනය කරන ලදී.

- නීතිවල සඵලතාවය වඩා හොඳින් විධිමත් කිරීම සහ තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා සංශෝධන.
- වෙළෙඳ සහභාගිවන්නන් විසින් වෙළෙඳ සහභාගිවන්නන්ගේ රීති උල්ලංඝනය කිරීම් සඳහා දඩ මුදල් පැනවීම පහසු කිරීම සඳහා නීති රීති හඳුන්වාදීම සඳහා නීති සංශෝධන
- කොළඹ කොටස් වෙළෙඳපොළ වෙබ් අඩවියේ තිබිය යුතු වෙළඳ සහභාගිවන්නන් විසින් වෙළඳ සහභාගිවන්නන්ගේ රීති උල්ලංඝනය කිරීම් පිළිබඳ ප්‍රකාශනයට අදාළ නීති සංශෝධන.

කොළඹ කොටස් හුවමාරුවෙහි වෙළෙඳ නීති සංශෝධන

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, පහත සඳහන් පහසුකම් සැලසීම සඳහා කොළඹ කොටස් හුවමාරුව විසින් සිය වෙළඳ නීති රීති සඳහා යෝජනා කරන ලද සංශෝධන සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදී.

- කොටස් ණය ගැනීම සහ ණය දීම හරහා නියාමනය කරන ලද කෙටි විකුණුම් වෙළෙඳාම් කිරීම;
- ශරියා අනුකූල ණය සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම; සහ
- ණය සුරැකුම්පත් (REPO) සහ සදාකාලික ණය සුරැකුම්පත් නැවත මිලදී ගැනීමේ ගනුදෙනු.

කොළඹ කොටස් හුවමාරුවෙහි නිෂ්කාශන රීති වලට සංශෝධන

කොටස් ණයට ගැනීම සහ ණය දීම හරහා නියාමනය කරන ලද කෙටි විකුණුම් පහසු කිරීම සඳහා මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාගමෙහි නිශ්කාශනාගාර රීති සඳහා කොළඹ කොටස් හුවමාරුව විසින් යෝජනා කරන ලද සංශෝධන සඳහා ද සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදී.

කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීමේ රීති සමාලෝචනය

2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතට අනුව ලැයිස්තුගත කිරීමේ රීති සම්පූර්ණයෙන්ම කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් සංශෝධනය කර ඇති අතර යෝජිත රීති සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරමින් පවතී.

ඉහත කරුණුවලට අමතරව, ලැයිස්තුගත කිරීමේ රීති සඳහා පහත යෝජිත සංශෝධන කොමිෂන් සභාව අනුමත කරන ලදී.

- ලැයිස්තුගත කිරීමේ ගාස්තු සම්බන්ධ 12 වගන්තිය
- ශරියා අනුකූල ණය සුරැකුම්පත් ලැයිස්තුගත කිරීමට පහසුකම් සැලසීම සඳහා ලැයිස්තුගත කිරීමේ රීතිවලට සංශෝධන
- කොටස් ණයට ගැනීම සහ ණය දීම හරහා නියාමනය කරන ලද කෙටි විකුණුම් සඳහා පහසුකම් සැලසීම සඳහා ලැයිස්තුගත කිරීමේ රීතිවලට සංශෝධන
- කොළඹ කොටස් වෙළෙඳපොළ ලැයිස්තුගත කිරීමේ රීතිවලට අනුකූල නොවන ලැයිස්තුගත ආයතන සහ එහි අධ්‍යක්ෂවරුන්ට එරෙහිව පරිපාලන සම්බාධක සහ/හෝ විනය ක්‍රියාමාර්ග පැනවීමට පහසුකම් සැලසීම සඳහා ලැයිස්තුගත කිරීමේ නීති සංශෝධන
- තිරසාර බැඳුම්කර ලැයිස්තුගත කිරීමට සහ වෙළෙඳාම් කිරීමට පහසුකම් සැලසීම සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කිරීමේ නීතිවලට යෝජිත සංශෝධන
- යටිතල පහසුකම් බැඳුම්කර නිකුත් කිරීම සහ ලැයිස්තුගත කිරීම පහසු කිරීම සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කිරීමේ නීතිවලට යෝජිත සංශෝධන
- කොළඹ කොටස් වෙළෙඳපොළේ රජය සතු ව්‍යවසාය (SOEs) විසින් නිකුත් කරන ලද කොටස් ලැයිස්තුගත කිරීමට පහසුකම් සැලසීම සඳහා නියාමන රාමුවක් සකස් කිරීම සඳහා ලැයිස්තුගත කිරීමේ රීතිවලට සංශෝධන.

ලැයිස්තුගත කිරීම් ඉවත් කිරීම

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළදී, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 5 වන රීතිය අනුව සිදු කරන ලද පහත සඳහන් සමාගම්වල ස්වේච්ඡාවෙන් ඉවත් කිරීමේ අයදුම්පත් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී:

- නෙස්ලේ ලංකා පීඑල්සී
- ඉන්දු-මැලේ පීඑල්සී
- ගුඩ් හෝප් පීඑල්සී
- සෙලින්සිං පීඑල්සී
- ගලිමාර් (මැලේ) පීඑල්සී

පොදු ලැයිස්තුගත සමාගමක් විසින් කරන ලද ඉල්ලීමක් මත, අයදුම්කාර සමාගම විසින් සපයන ලද හේතු සලකා බැලීමෙන් අනතුරුව කොමිෂන් සභාව විසින් කොළඹ කොටස් වෙළෙඳපොළෙහි නිල ලැයිස්තුවෙන් එහි සුරැකුම්පත් ඉවත් කිරීමට මාස 6 ක කල් තැබීමක් ලබා දුන්නේය.

කොළඹ කොටස් වෙළඳපල ලැයිස්තුගත කිරීමේ රීති වල 7.13.3 රීතිය අනුව දීර්ඝ කිරීම ලබා දීම

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ, අති විශේෂ අධීක්ෂණ තත්වයන් හේතුවෙන් කොළඹ කොටස් හුවමාරුව ලැයිස්තුගත කිරීමේ රීතිවල 7.13.3 රීතිය අනුව දංකොටුව පෝසිලේන් පීඑල්සී සමාගමට දීර්ඝ කිරීම් ලබා දෙන ලදී.

පවරා ගැනීම සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය ක්‍රියාත්මක කිරීම

1995 සමාගම් පවරාගැනීම් සහ ඒකාබද්ධ කිරීම් (TOM) සංශෝධිත සංග්‍රහය ප්‍රකාරව 2023 වර්ෂය තුළ පහත පවරා ගැනීමේ අර්පණ පරිපාලනය කරන ලදී. (සංඛ්‍යා සටහන 04)

සංඛ්‍යා සටහන 04: පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය යටතේ සිදුකරන ලද අර්පණ

අර්පණකරු	අර්පණලාභියා	අර්පණයේ ස්වාභාවය	පවතින තත්වය
සී ලයින් ඉන්වෙස්ට්මන්ට්ස් (පුද්ගලික) සමාගම	දන්කොටුව පෝසිලේන් පීඑල්සී	අනිවාර්ය අර්පණය	අවසන් වී ඇත
බිලූ ඕෂන් රෙසිඩන්සීස් (පුද්ගලික) සමාගම	කෙල්සි ඩිවෙලොප්මන්ට්ස් පීඑල්සී	අනිවාර්ය අර්පණය	අවසන් වී ඇත

කොළඹ කොටස් හුවමාරුවේ බලාත්මක කිරීමේ නීති කල් දැමීම

සුරුකුම්පත් වෙළෙඳාම අත්හිටුවීම කල් දැමීමට අදාළ කොළඹ කොටස් හුවමාරුවේ ලයිස්තුගත කිරීමේ රීති ප්‍රකාරව කොළඹ කොටස් හුවමාරුවේ බලාත්මක කිරීමේ නීති කල් දැමීම සඳහා වසර තුළ ලද අයදුම්පත් 04ක් සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විවිසින් සමාලෝචනය කරන ලදී.

- නවලෝක හොස්පිටල්ස් පීඑල්සී
- බිම්පුත් ෆයිනෑන්ස් පීඑල්සී
- සමූපකාර රක්ෂණ සමාගම පීඑල්සී
- අනිලානා හොටෙල්ස් සහ ප්‍රොපර්ටීස් පීඑල්සී

කොළඹ කොටස් වෙළෙඳපොළෙහි සමාගම් ලැයිස්තුගත කිරීමේ රීතිවල 5.4 (අ) රීතිය යටතේ ලබා දෙන නිදහස් කිරීම්

කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීතිවල 5.4(අ) රීතිය යටතේ නිදහස් කිරීම් ඉල්ලා පොදු ලැයිස්තුගත සමාගම් (PLC) විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරයි. යෝජිත කොටස් නිකුතුව පොදු ලැයිස්තුගත සමාගමේ සමාගම් නිකුතුවේ කොටස් වලින් 20% ඉක්මවන්නේ නම්, පුද්ගලික ස්ථානගත කිරීමක් හරහා පොදු ලැයිස්තුගත සමාගම විසින් නව කොටස් නිකුත් කිරීමට පහසුකම් සැලසීමට මෙම අත්හැරීම් අපේක්ෂා කෙරේ.

සමාලෝචිත වර්ෂයේදී, කොමිෂන් සභාව පොදු ලැයිස්තුගත සමාගම් වෙතින් එවැනි එක් අයදුම්පතක් ද කැන්ඩි හොටෙල්ස් කම්පැනි (1938) අනුමත කරන ලද අතර, සමාගමට පුද්ගලික ස්ථානගත කිරීමක් සමඟ ඉදිරියට යාමට සහ නිශ්චිත සීමාව ඉක්මවා නව කොටස් නිකුත් කිරීමට ඉඩ ලබා දෙන ලදී.

වෙළෙඳ භූමියෙන් බැහැර ගණුදෙනු සඳහා අනුමැතිය ලබාදීම්

ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 84 (1) ප්‍රකාරව "විනිමය ස්ථානයක ලයිස්තුගත කළ සමාගමක සුරුකුම්පත් දරන තැනැත්තකු විසින් එම බලපත්‍ර ලත් විනිමය ස්ථානය විසින් යොදාගනු ලැබූ වෙළෙඳ කාර්යපටිපාටියට අනුකූලව එම සුරුකුම්පත් මිලදී ගැනීම, විකිණීම, තැගි දීම හෝ අන්‍යාකාරයකින් ගනුදෙනු කිරීම කරනු ලැබිය යුතුය. එසේ වුවද, එම විනිමය ස්ථානය විසින් කිසිම නිශ්චිත වෙළෙඳ කාර්ය පටිපාටියක් යොදාගෙන නොමැති විටදී, ඒ සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගනු ලැබිය යුතුය.

මෙහෙයුම් වර්ෂය තුළදී විශේෂිත පැවරීම් 530ක් සහ කොටස් ත්‍යාග කිරීම් 159ක් කොමිෂන් සභාවේ අවධානය පිණිස යොමු කරන ලදී. අප ආයතනය විසින් සිදු කරන ලද විශේෂිත පැවරීම් ලෙස සළකන්නේ ආන්තික ගණුදෙනු තිනි පුද්ගල ගිණුම් , හවුල් ගිණුම් බවට හැරවීම්, හවුල් ගිණුම් තනි පුද්ගල ගිණුම් බවට හැරවීම්, මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා වන පැවරීම්, විශේෂිත ත්‍යාග පැවරීම්, අනිවාර්ය අර්පණ සඳහා අදාළ පැවරීම්, ලයිස්තුවෙන් ඉවත්වීමේ අර්පණ සඳහා අදාළ පැවරීම්ය.

ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 80 වැනි වගන්තිය යටතේ පිරිනමනු ලැබූ අනුමැතීන්

ලයිස්තුගත පොදු සමාගමක් හෝ හුවමාරුවක ලයිස්තුගත කිරීමක් ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති කිසියම් පොදු සමාගමක් කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද පුද්ගලයෙකුගේ අනුමැතියෙන් තොරව සෘජුව හෝ තෙවන පාර්ශවයක් හරහා සංස්ථා ප්‍රකාශයක් හෝ ඒ හා සමාන ලේඛනයක් මගින් හෝ වෙනත් ආකාරයකින් මහජන අර්පණයක් මගින් අරමුදල් ලබා ගැනීමක් සිදු නොකළ යුතුය.

වසර තුළ ආගාරපතන ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ් හට අනුමැතිය ලබාදුන් අතර ජේ එෆ් එස් හෝල්ඩිංග්ස් ලිමිටඩ් සහ ට්‍රෙෂර් රිසබ්ලික් ගාර්ඩියන් ලිමිටඩ් හී අයුදුම්පත් ඇගයීමක් සිදුකරන ලදී.

අධීක්ෂණය සහ අනුකූලතාවය

ලයිස්තුගත පොදු සමාගම්

සියළුම ලයිස්තුගත පොදු සමාගම් මූල්‍ය වර්ෂය අවසානයේ සිට මාස 5 ක් ඇතුළත වාර්ෂික වාර්තා ඔවුන්ගේ කොටස් හිමියන්ට සහ කොළඹ කොටස් හුවමාරුව වෙත ඉදිරිපත් කළ යුතුය. සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ලයිස්තුගත සමාගම්වල වාර්ෂික වාර්තා සමාලෝචනය කරන අතර අනුකූලව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් සමාගම් සමඟ සන්නිවේදනය කරයි. මෙම ප්‍රයත්නයේදී ලයිස්තුගත පොදු සමාගම්වල ප්‍රතිචාර අතීශයින් ධනාත්මක විය. මෙම කාර්යයේ පරමාර්ථය වන්නේ ලයිස්තුගත පොදු සමාගම් විසින් මූල්‍ය වාර්තාකරණයේ සහ තොරතුරු බෙදා හැරීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමයි. ලයිස්තුගත පොදු සමාගම් සුරුකුම්පත් වෙළෙඳපොළ තුළ විනිවිදභාවය සහ වගවීම තහවුරු කිරීම සඳහා වැදගත් තොරතුරු කඩිනමින් බෙදාහැරීම සහ වෘත්තීය ප්‍රමිතීන් පවත්වා ගෙන යන බව සහතික කිරීම අවශ්‍ය වේ.

සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වාර්ෂික වාර්තා සමාලෝචනය කිරීමේදී පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන ලදී.

- කොළඹ කොටස් හුවමාරුවේ ලයිස්තුගත කිරීමේ රීති, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම
- යහපාලන පිළිවෙත්/ ආයතනික පාලන පිළිවෙත්

උපායමාර්ගික අරමුණු 1

ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම

- මූල්‍ය විශේෂ අවස්ථා
- සභාපතිගේ වාර්තාව
- අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව
- ස්වාධීන විගණක වාර්තාව
- කොටස් හිමියන් සහ ආයෝජක තොරතුරු
- මූල්‍ය දත්ත
- මණ්ඩල කමිටු වාර්තා

මෙම ක්‍රියාවලිය කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නීති සහ අදාළ රෙගුලාසිවලට අනුකූලව වාර්ෂික වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී සමාගම් වෙත පැවරී ඇති වගකීම් පිළිබඳව සමාගම් අතර දැනුවත් කිරීමේ මට්ටම අඛණ්ඩව වැඩිදියුණු කිරීමට දායක වේ.

වසර තුළදී, සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ලයිස්තුගත සමාගම්වල වාර්ෂික වාර්තා සමාලෝචන 102ක් පවත්වන ලදී. අනුකූලතාව සහ වැඩිදියුණු කළ හෙළිදරව් කිරීම් ඉහළ නංවාලීම සඳහා අදහස් ලිපි 65ක් යවන ලද අතර, සමාලෝචන 21ක් වසා දැමීම් ලෙස අවසන් කරන ලදී. මීට අමතරව, සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ණයකර සම්බන්ධ සංස්ථා ප්‍රකාශ 03ක් සහ කොටස් නිකුත් කිරීම් හා සම්බන්ධ සංස්ථා ප්‍රකාශ 02ක් පිළිබඳ සමාලෝචන සහ දැනට සිටින කොටස් හිමියන්ගෙන් තවදුරටත් අරමුදල් රැස්කර ගැනීස සඳහා ඉල්ලුම් කළ සමාගම් 09ක කොටස් හිමියන්ගේ චක්‍රලේඛ සමාලෝචන සිදුකරන ලදී.

පොදු ලයිස්තුගත සමාගම්වල හෙළිදරව් කිරීම් සහ ආයතනික කටයුතු සම්බන්ධයෙන් ගෙන ඇති නියාමන ක්‍රියාමාර්ග

මෙහෙයුම් වසර තුළදී, සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ලයිස්තුගත සමාගම් මගින් වෙළෙඳපොළ නිවේදන හරහා සිදුකළ අනාවරණය කිරීම් සමාලෝචනය කරන ලද අතර අවස්ථා 65ක් සම්බන්ධයෙන් කොළඹ කොටස් හුවමාරුව වෙතින් පැහැදිලි කිරීම් ඉල්ලා සිටියේය. එවැනි පැහැදිලි කිරීම් පහත හෙළිදරව් කිරීම්වලට අදාළ විය. (සංඛ්‍යා සටහන: 05)

සංඛ්‍යා සටහන: 05 පොදු ලයිස්තුගත සමාගම්වල හෙළිදරව් කිරීම් සහ ආයතනික කටයුතු සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග

පැහැදිලි කිරීම්වල ස්වභාවය	අවස්ථා ගණන
අවදානම් පුවරුවේ/ දෙවන පුවරුවේ සිටින පොදු ලයිස්තුගත සමාගම්වල අධ්‍යක්ෂකවරුන් විසින් සිදුකළ ගණුදෙනු	1
අධ්‍යක්ෂවරුන් විසින් සිදු කළ ප්‍රමාද වූ අනාවරණය කිරීම්	14
අධ්‍යක්ෂකවරුන් විසින් තහනම් කළ කාලය තුළ සිදුකළ ගනුදෙනු කිරීම් - (කොටස් වෙළෙඳපොළ රීති 8.6)	10
ප්‍රමාද වූ හෙළිදරව් කිරීම්	
▪ අධ්‍යක්ෂක මණ්ඩලයේ වෙනස්කම් සම්බන්ධව	30
▪ වෙනත් ආයතනික ක්ෂණික අනාවරණය කිරීම්	10



සාංගමික කටයුතු කණ්ඩායම

අනෙකුත් නියාමකයින් වෙත යොමු කරන ලද කරුණු/ කොළඹ කොටස් හුවමාරුව/ රාජ්‍ය ආයතන

පිළිගැනීම, මැනීම සහ හෙළිදරව් කිරීම් අදාළ ප්‍රමිතීන්ට අනුකූලද යන්න පැහැදිලි කිරීම් ලබා ගැනීම සඳහා පහත කරුණු වෙනත් නියාමකයින් වෙත යොමු කරන ලදී. (සංඛ්‍යා සටහන 06)

සංඛ්‍යා සටහන 06: අනෙකුත් නියාමකයින් වෙත යොමු කරන ලද කරුණු

නියාමන	ආයතනය සමාගම් ගණන
ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය (SLAASMB)	1
කොළඹ කොටස් වෙළෙඳපොළ	2
ශ්‍රී ලංකා මහ බැංකුව	4
මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය	2
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව	1

වෙළෙඳපොළ ආයතන සහ වෙළෙඳපොළ අතරමැදියන් සඳහා අධීක්ෂණය

වෙළෙඳපොළ ආයතන සහ වෙළෙඳපොළ අතරමැදියන් සඳහා වන නියාමන සහ අධීක්ෂණ රාමුව 2021 අංක 19 දරන සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ වෙළෙඳපොළ ආයතන සහ වෙළෙඳපොළ අතරමැදියන් සඳහා අදාළ නීතිවල නිශ්චිතව දක්වා ඇත.

සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 183 වගන්තිය ප්‍රකාරව, වෙළෙඳපොළ ආයතන වර්ග තුනකටත් එනම්; කොටස් හුවමාරුව, මධ්‍යම තැන්පතුගාරය, නිෂ්කාශනාගාර සහ වෙළෙඳපොළ අතරමැදි කාණ්ඩ 8 කට එනම්; ආයෝජන කළමනාකරුවන්, ආන්තික සපයන්නන්, ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතන, ප්‍රාරක්ෂකයන්, කොටස් තැරැව්කරුවන්, කොටස් වෙළෙඳුන් , කළමනාකරණ සමාගම් සහ සාංගමික මූල්‍ය උපදේශකයින් යන ආයතනවලට අදාළ වන නීති නිකුත් කර ඇත. මෙම නීති සහ නියාමනයන් ස්ථාපිත කර ඇත්තේ ආයෝජකයින්ගේ විශ්වාසය ශක්තිමත් කරන සුරක්ෂිත සහ විනිවිදභාවයෙන් යුත් වෙළෙඳපොළක් පවත්වාගෙන යාමේ අරමුණ ඇතිවය.

සමාලෝචිත වර්ෂය තුළ, සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, නව වෙළෙඳපොළ අතරමැදි කාණ්ඩයක් යටතේ සාංගමික මූල්‍ය උපදේශකයින් (Corporate Finance Advisors-CFA) සඳහා බලපත්‍ර ලබා දී ඇත. ඒ අනුව, ආයතන හතරක් සඳහා සාංගමික මූල්‍ය උපදේශකයින් ලෙස වශයෙන් ක්‍රියාකිරීමට බලපත්‍ර ලබාදෙන ලදී. එනම්; සීමාසහිත එන් ඩී බී ඉන්වෙස්ට්මන්ට් බෑන්ක් ලිමිටඩ්, කැපිටල් එලයන්ස් පාර්ට්නර්ස් ලිමිටඩ්, අටාරා කැපිටල් ප්‍රයිවට් ලිමිටඩ්, සහ CTCLSA කැපිටල් ප්‍රයිවට් ලිමිටඩ් යන සමාගම් වේ. මීට අමතරව, මෙම නව කාණ්ඩය යටතේ සාංගමික යහපාලන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා මාර්ගෝපදේශයක් ලෙස සාංගමික මූල්‍ය උපදේශකයින් සඳහා සාංගමික ආචාරධර්ම සංග්‍රහයක් ප්‍රකාශයට පත් කරන ලදී. සංග්‍රහයේ ප්‍රධාන අංගයන් ලෙස හැඳින්විය හැක්කේ සදාචාරාත්මක හැසිරීම්, ව්‍යාපාර මෙහෙයුම්, නිපුණතාවය, බැඳියා පිළිගැටුම්, සේවාදායකයන් සඳහා ඉටුකළ යුතු යුතුකම්, පැමිණිලි හැසිරවීම සහ පුද්ගලික ගිණුම් ගනුදෙනු යන අංශයන් වේ. මෙම ආචාරධර්ම සංග්‍රහය මූලිකවම හඳුන්වාදෙන ලද්දේ සාංගමික මූල්‍ය උපදේශකයින්ට ව්‍යාපාර පවත්වාගෙන යාමේ සුදුසුම භාවිතයන් සහ මූලික මූලධර්ම ඇතුළත් කරමින් විශ්වාසනීයව සිය රාජකාරි සිදු කිරීම, අඛණ්ඩතාව සහ වෘත්තියභාවයෙන් යුතුව ක්‍රමවත් ප්‍රාග්ධන වෙළඳපොළකට පහසුකම් සැලසීම සඳහා ය.

සමාලෝචිත වර්ෂය තුළ, සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, නව වෙළෙඳපොළ අතරමැදි කාණ්ඩයක් යටතේ සාංගමික මූල්‍ය උපදේශකයින් (Corporate Finance Advisors-CFA) සඳහා බලපත්‍ර ලබා දී ඇත.

ස්ථාපිත නිර්ණායක අනුව කටයුතු කිරීමට අපොහොසත් වන, සේවාදායකයින් සමඟ ගනුදෙනු කරන පුද්ගලයින්, අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් පුද්ගලයින් ඇතුළුව ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට හෝ අදාළ කටයුත්ත සඳහා නුසුදුස්සන් කිරීම වෙනුවෙන් අදාළ අභ්‍යන්තර ක්‍රියාවලිය ප්‍රමිතිගත කිරීම සඳහා ඉහත සඳහන් පුද්ගලයන්ගේ සුදුසුකම් සහ යෝග්‍යතාවය තක්සේරු කිරීමට රාමුවක් සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සකස් කරන ලදී. මේ සම්බන්ධයෙන් වන නියාමන ක්‍රියාමාර්ග දැඩි කිරීම තුළින් මෙම ආයතන විසින් සේවයේ යොදවා ඇති සියලුම ප්‍රධාන පුද්ගලයින්ගේ වෘත්තීය ප්‍රමිතීන් සහ ව්‍යාපාරික හැසිරීම් නංවාලීමට අදහස් කෙරේ.

තවද, නව පනතේ විධිවිධානවලට අනුකූලව, සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙළෙඳපොළ විෂමාචාරවලින් බැහැර ව සිදුකරන වරදවල් සඳහා පරිපාලනමය දණ්ඩන පැනවීමේ රාමුවක් සකස් කරන ලදී. ඒ අනුව නීතිමය අවශ්‍යතා සමඟ අනුගත නොවීම් හඳුනා ගැනීම සහ එවැනි අනුගත නොවීම් වන වාර ගණන සහ එමගින් වෙළෙඳපොළට ඇති කරන බලපෑම සැලකිල්ලට ගනිමින් මෙම දණ්ඩන නියම කිරීම සඳහා සම්මත ක්‍රියාවලියක් ස්ථාපිත කර ඇත.

2023 වර්ෂය තුළදී, සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙළෙඳපොළ අතරමැදියන්ට අදාළ වන අවම සාංගමික යහපාලන අවශ්‍යතා හඳුන්වා දුන් අතර මේ සම්බන්ධයෙන් විධානයක් ද නිකුත් කරන ලදී. ප්‍රධාන අවශ්‍යතා අතරට වෙළෙඳපොළ අතරමැදියන් සඳහා අවම අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් නියම කිරීම, විශේෂිත අවස්ථාවලදී 'ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයෙක්' පත් කිරීම, බලපත්‍රලාභී ආයතනවල ප්‍රධාන විධායක නිලධාරියාට අදාළ අවශ්‍යතා යනාදිය ඇතුළත් වේ. මෙම විධානය පැනවීම තුළින් වගකීම් සහගත, සදාචාරාත්මක සහ විනිවිදභාවයෙන් යුත් ව්‍යාපාර පුරුදු ප්‍රවර්ධනය කර ගෙන ඇති අතර එමගින් සාධාරණ හා විධිමත් වෙළෙඳපොළක් නිර්මාණය කිරීම හරහා ආයෝජකයින්ගේ විශ්වාසය වර්ධනය කිරීමට බලාපොරොත්තු වේ.

කොටස් තැරැව්කරුවන්

සමාලෝචිත වර්ෂය තුළ, සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධාන, අදාළ රීති සහ රෙගුලාසිවලට අනුකූල වීමේ තත්ත්වය තක්සේරු කිරීම සඳහා කොටස් තැරැව්කරුවන්ගේ ක්‍රියාපටිපාටිය අධීක්ෂණය කිරීමට සඳහා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කටයුතු සිදු කරන ලදී. කොටස් තැරැව්කරුවන්ගේ අධීක්ෂණය සිදු කරනු ලබන්නේ අවදානම මත පදනම් වූ ප්‍රවේශයක් මත වන අතර, එමගින් එක් එක් ආයතනයේ විශේෂිත අවදානම් ශ්‍රේණිගත කිරීම සහ සාපේක්ෂ වෙළෙඳපොළ කොටස සැලකිල්ලට ගනිමින් ආයතනවල සාපේක්ෂ අවදානම් තත්ත්වය තක්සේරු කරයි. කොටස් තැරැව්කරුවන්ට අදාළ වන්නා වූ අවදානම් ලෙස විචක්ෂණ, ද්‍රවශීලතා, ප්‍රතිපාර්ශ්ව, මූල්‍ය, ණය, මෙහෙයුම් සහ නීතිමය අවදානම් ලෙස හඳුනාගත හැකිය.

සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කොටස් තැරැව්කරුවන්ගේ ක්‍රියාකාරකම් ඵලදායි ලෙස අධීක්ෂණය කිරීම සඳහා ඔවුන්ගේ ස්ථානීය සහ දුරස්ථ අධීක්ෂණය අඛණ්ඩව සිදු කරගෙන යනු ලබයි. දුරස්ථ අධීක්ෂණයට කොටස් තැරැව්කරුවන් විසින් වරින් වර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන, අනුකූලතා නිලධාරීන්ගේ වාර්තා සහ ඇතැම් වැදගත් විචල්‍යයන් පිළිබඳ වරින් වර අනාවරණය වන වාර්තා සමාලෝචනය සහ විශ්ලේෂණය ඇතුළත් වේ. දුරස්ථ සමාලෝචනයන් අතරතුර යම් අනුගත නොවීමක් අනාවරණය වූ විට ආයතන වෙත දැනුම් දෙනු ලබන අතර ඒ සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ.

කොළඹ කොටස් හුවමාරුවේ ක්‍රියාවලීන්හි අධීක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා ඔවුන් විසින් සිදු කරනු ලබන කොටස් තැරැව්කරුවන්ගේ ස්ථානීය සහ දුරස්ථ අධීක්ෂණයන් මෙන්ම කොළඹ කොටස් හුවමාරුවෙහි අදාළ නීතිරීතිවලට අනුගත නොවීම් වෙනුවෙන් කඩිනම් නියාමන ක්‍රියාමාර්ග ගන්නා බව සහතික කිරීම සඳහා, සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අධීක්ෂණ රාමුවක් හඳුන්වා දෙන ලදී. මෙම රාමුව යටතේ කොටස් තැරැව්කරුවන් විසින් අදාළ නීතිමය තත්ත්වයන්ට අනුගතවීම සම්බන්ධව නිරීක්ෂණය කිරීමේ මූලික වගකීම කොටස් හුවමාරුව වෙත පැවරේ.

මීට අමතරව, 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත සහ ඒ යටතේ සාදන ලද රීති සහ රෙගුලාසිවලට අනුකූලභාවය පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ (FIU) නියෝජිතයන් සමඟ සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඒකාබද්ධ ස්ථානීය අධීක්ෂණයන් පැවැත්වීය. වසර තුළ එවැනි අධීක්ෂණ පහක් සිදු කරන ලදී.

උපායමාර්ගික අරමුණු 1

ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම

කර්මාන්තයේ කාර්යසාධනය පිළිබඳ සළකා බැලීමේදී, කර්මාන්තයේ සුවිශේෂී වසරක් ලෙස වාර්තා වූ 2022 වසරට සාපේක්ෂව සළකා බලන වසර තුළදී කොටස් තැරැව්කරුවන්ගේ මුළු පිරිවැටුම 42% කින් පහත වැටී ඇති බව පෙන්නුම් කෙරිණි. එසේ 2022 වසරේ දී රුපියල් මිලියන 3,001ක් වූ බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභය, 2023 දී රුපියල් මිලියන 1,216ක් වූ අතර, එය කර්මාන්තයේ ලාභදායීත්වයේ 39% ක පහත වැටීමකි. කොටස් තැරැව්කාර කර්මාන්තයේ කාර්ය සාධනය පිළිබඳ සංසන්දනාත්මක සංඛ්‍යාලේඛන පහත දැක්වේ. (සංඛ්‍යා සටහන 07)

සංඛ්‍යා සටහන 07: කොටස් තැරැව්කරුවන්ගේ විශේෂ අවස්ථා

	2023 (රු. '000)	2022 (රු. '000)	ප්‍රතිශතාත්මක වෙනස %
පිරිවැටුම	4,635,144	7,989,609	(42)
ශුද්ධ තැරැව්කාරත්වය	4,166,262	7,383,356	(44)
වෙනත් ආදායම්	3,846,382	3,567,382	8
මෙහෙයුම් ලාභ/අලාභය	2,787,191	3,812,946	(27)
බදු වලට පෙර ශුද්ධ ලාභය/අලාභය	1,838,886	3,001,569	(39)
බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභය/ පාඩුව	1,216,551	2,094,232	(42)
මුළු වත්කම්*	24,280,733	24,805,524	(2)
සම්පූර්ණ වගකීම්*	11,432,918	11,631,100	(2)
කොටස් හිමියන්ගේ අරමුදල්*	12,847,816	13,174,424	(2)

*දෙසැම්බර් 31 වන විට

මූලාශ්‍රය: කොටස් තැරැව්කරුවන් විසින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශන



අධීක්ෂණ කණ්ඩායම

2023 වර්ෂය තුළදී, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙළෙඳපොළ අතරමැදියන්ට අදාළ වන අවම සාංගමික යහපාලන අවශ්‍යතා හඳුන්වා දුන් අතර මේ සම්බන්ධයෙන් විධානයක් ද නිකුත් කරන ලදී.

කළමනාකරණ සමාගම් සහ සාමූහික ආයෝජන යෝජනා ක්‍රම

ස්ථානීය පරීක්ෂණ සඳහා කළමනාකරණ සමාගම් තෝරාගැනීමේදී අවදානම් පදනම් කරගත් ප්‍රවේශයක් අනුගමනය කෙරේ. මෙම අවදානම් මත පදනම් වූ ක්‍රමවේදය තුළ මූල්‍ය ශක්තිය, අභ්‍යන්තර පාලනවල ප්‍රමාණවත් බව සහ අවදානම් කළමනාකරණ යාන්ත්‍රණයන්, අදාළ නියාමන අවශ්‍යතා සහ පාලන ප්‍රමිතීන්ට අනුකූල වීම යන ප්‍රධාන සාධක කිහිපයක් සලකා බලන ලදී.

ප්‍රාග්ධන වෙළෙඳපොළේ ස්ථායීතාවය සහතික කිරීම සඳහා ඔවුන්ගේ මූල්‍ය ශක්තිය, අභ්‍යන්තර පාලනයන් සහ ක්‍රියාකාරී අවදානම් කළමනාකරණ පිළිවෙත් තක්සේරු කිරීම සඳහා දුරස්ථ සමාලෝචනයන් හරහා කළමනාකරණ සමාගම් නිරීක්ෂණය කරනු ලැබේ. සමාගම්වල මූල්‍ය තත්ත්වයේ ස්ථාවර බව සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නියම කර ඇති කොටස් හිමියන්ගේ අවම අරමුදල් අවශ්‍යතාවලට අනුකූලව ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා කළමනාකරණ සමාගම්වල විගණනය නොකළ මාසික මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය කිරීම මගින් දුරස්ථ අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කරන ලදී.

මීට අමතරව, ඒකක හිමියන්ගේ සුභසිද්ධිය ආරක්ෂා කිරීම සඳහා අදාළ නීති මගින් නියම කර ඇති පරිදි යෝජනා ක්‍රම විසින් පවත්වා ගෙන යා යුතු අවම ඒකක හිමියන් සංඛ්‍යාව, ආයෝජන සීමා කිරීම් සහ ද්‍රවශීලතා තත්ත්වයන් පිළිබඳ අවශ්‍යතාව අනුගමනය කරන බව සහතික කිරීම සඳහා යෝජනා ක්‍රමවල මාසික ප්‍රතිලාභ තොරතුරු ඉදිරිපත් කිරීම් අබණ්ඩව අධීක්ෂණය කරන ලදී.

කළමනාකරණ සමාගම් සඳහා වන රීති විසින් අදාළ සමාගම් සඳහා අනුකූලතා නිලධාරියෙකු පූර්ණ කාලීන පදනමින් පත් කිරීමේ අවශ්‍යතාවයක් ගෙන එන ලද අතර, ඔහුගේ වගකීම වන්නේ කළමනාකරණ සමාගම සෑම විටම අදාළ වන නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල වන බව සහතික කිරීම සහ කාර්තුමය අනුකූලතා වාර්තාවක් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමයි.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, යෝජනා ක්‍රමවල මූල්‍ය ස්ථායීතාවය තහවුරු කර ගැනීමට සහ නියමිත නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම අධීක්ෂණය කිරීමට කළමනාකරණ සමාගම් සහ යෝජනා ක්‍රම භාරකරුවන් සමඟ නිරන්තරයෙන් කටයුතු කරනු ලබයි. වසර තුළදී යෝජනා ක්‍රමවල ආයෝජන සහ ද්‍රවශීලතා අවශ්‍යතා පිළිබඳ යම් යම් උල්ලංඝනයන් හඳුනාගැනීමෙන් පසු, ඇතිවිය හැකි අවදානම් අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අදාළ කළමනාකරණ සමාගම් යොමුකරවීම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සිදු කරන ලදි. ඒ අනුව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අදාළ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සඳහා කළමනාකරණ සමාගම් වෙත කාලෝචිත මග පෙන්වීමක් අබණ්ඩව ලබා දී ඇත.

වසර තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නව යෝජනා ක්‍රම හයක් අනුමත කරන ලද අතර එයින් එක් යෝජනා ක්‍රමයක් සංවෘත (Close Ended Fund) ඒකක භාරයක් වන අතර එහි ඒකක කොළඹ කොටස් හුවමාරුවෙහි ලයිස්තුගත කිරීමට නියමිතව ඇත. (සංඛ්‍යා සටහන 08, රූප සටහන 01)


සංඛ්‍යා සටහන 08: යෝජනා ක්‍රමවල සමස්ත පිහිටීම

	2023. 12 .31 දිනට	2022. 12 .31 දිනට	ප්‍රතිශතාත්මක වෙනස %
අනුමත යෝජනා ක්‍රම ගණන	84	81	-
ඒකක භාරවල ශුද්ධ වත්කම් වටිනාකම (දළ වශයෙන් රු. බිලියන)	407.74	143	185.13
ඒකක දරන්නන් සංඛ්‍යාව	93,450	67,912	37.60
නිකුත් කරන ලද ඒකක ගණන (දළ වශයෙන් මිලියන)	13,371	6,283	112.81
කොටස්වල ආයෝජනය (රු. මිලියන දළ වශයෙන්)	18,506	11,856	56.08
රජයේ සුරැකුම්පත්වල ආයෝජනය (ආසන්න වශයෙන් රු. මිලියන)	315,239	88,879	254.68
වෙනත් ආයෝජන උපකරණවල ආයෝජනයෆ (දළ වශයෙන් රු. මිලියන.)	70,175	48,187	46.63

* වාණිජ පත්‍රිකා, භාර සහතික, ණයකර, බැංකු තැන්පත් ආදිය

මූලාශ්‍රය: කළමනාකරණ ආයතනවල නියාමන ඉදිරිපත් කිරීම්

රූප සටහන 01: ඒකක භාර සමාගම්වල වෙළෙඳපොළ කොටස



අනෙකුත් වෙළෙඳපොළ අතරමැදියන්

මීට අමතරව, ආන්තික ණය සපයන්නන්, ආයෝජන කළමණාකරුවන්, ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන, ප්‍රාරක්ෂකයන් සහ සාංගමික මූල්‍ය උපදේශකයින් ඇතුළු අනෙකුත් වෙළෙඳපොළ අතරමැදියන් විසින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත, අදාළ රීති සහ රෙගුලාසි අනුගමනය කරන බවට සහතික වනු පිණිස, එකී සියලු ආයතන අධීක්ෂණය කිරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පියවර ගනු ලබයි. එසේම වෙළෙඳපොළ අතරමැදියන්ට අදාළ ස්ථානීය හා දුරස්ථ අධීක්ෂනවලදී අවදානම් හඳුනාගැනීම්, නිරීක්ෂණය කිරීම්, සහ කළමනාකරණය කිරීම සඳහා ඵලදායී, අවදානම් මත පදනම් වූ අධීක්ෂණ.

උපායමාර්ගික අරමුණු 1


ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම

වෙළෙඳපොළ වෘත්තිකයන්ගේ වෘත්තීය ප්‍රමිතීන් සහ හැසිරීම වැඩි දියුණු කිරීම

වෙළෙඳපොළ අඛණ්ඩතාව සහ ආයෝජක විශ්වාසය පවත්වා ගැනීම සඳහා වෙළෙඳපොළ වෘත්තිකයන් විසින් ඉටු කරන ලද ප්‍රධාන භූමිකාව හඳුනා ගනිමින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කර්මාන්තයේ ප්‍රමිතීන් ඉහළ නැංවීම සහ සාංගමික ආචාරධර්ම ඉහළ නැංවීම අරමුණු කරගත් පුළුල් රාමුවක් ස්ථාපිත කර ඇත. එපමණක් නොව, අඛණ්ඩ අධ්‍යාපනය සහ පුහුණුව කෙරෙහි සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නිරන්තර අවධානය යොමුවන අතර සංකීර්ණ වෙළෙඳපොළ තත්ත්වයන් හමුවේ සදාචාරාත්මකව සහ වගකීමෙන් යුතුව කටයුතු කිරීමට අවශ්‍ය කුසලතා සහ දැනුම සමඟ වෙළෙඳපොළ වෘත්තිකයන් බල ගන්වනු ලබයි.

මෙම ඉලක්කය සපුරා ගැනීමේ අරමුණින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් වෘත්තීය අධ්‍යාපනය සංවර්ධනය කර පරිපාලනය කර ඇති අතර ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන් පවත්වයි. ඊට අතිරේක වශයෙන්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සාමාන්‍ය ජනතාවට ආයෝජනය කිරීමේ මූලික න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දීම සඳහා විශේෂ වූ පාඨමාලා පවත්වනු ලබයි. (රූප සටහන: 02)

රූප සටහන 02 : ප්‍රාග්ධන වෙළෙඳපොළ සුදුසුකම් රාමුව



සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් 2019 දී හඳුන්වා දුන් ප්‍රාග්ධන වෙළෙඳපොළ සුදුසුකම් රාමුව අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර එය ආයෝජන උපදේශකයින් සඳහා අවම මට්ටමේ ප්‍රවීණතාවයක් සහ නිපුණතාවයක් ලබා දීම අරමුණු කර ගෙන කොටස් තැරැව්කාර කර්මාන්තයේ ආයෝජන උපදේශකයින් සඳහා ගුණාත්මක ප්‍රමිතියක් ලබාදෙයි. එකී රාමුව තුළින් වත්කම් පන්ති එකක් හෝ කිහිපයක් සඳහා සහතික කළ ආයෝජන උපදේශකයින් සඳහා වෙන වෙනම සහතික සපයයි. එනම් හිමිකම් සුරකුම්පත්, ණය සුරකුම්පත්, ව්‍යුත්පන්න සහ ඒකක භාර ආදී වත්කම් පන්තීන්ය.

මෙසේ ලබාදෙන සෑම සහතිකයක්ම ආයෝජන උපදේශකයින්ට බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලියට තුඩු දෙන අතර ලියාපදිංචි ආයෝජන උපදේශක (RIA) සුදුසුකම ලබාගැනීමට සුරකුම්පත් කර්මාන්තයේ සියලුම වත්කම් පන්ති ඇතුළත් කිරීම සඳහා ඉහළ සුදුසුකමක් දක්වා වැඩි දියුණු කරන ලදී.

පහත වගුවට අනුව ඉහත කී එක් එක් වත්කම් පන්ති සඳහා වෙන වෙනම සහතික ලබාගැනීමේදී හදාරා අවසන් කර තිබිය යුතු විෂයය මොඩියුලයන් සහ සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරන ලද බලපත්‍ර මොනවාද යන්න පැහැදිලිව පෙන්නුම් කරයි. (සංඛ්‍යා සටහන: 09)

සංඛ්‍යා සටහන 09 : සහතික කිරීමේ මට්ටම සහ නිකුත් කර ඇති බලපත්‍ර

විෂය අංකය	විෂයය	සහතික පත්‍රයේ සහ බලපත්‍රයේ මට්ටම				
		හිමිකම්	ණයකර	ව්‍යුත්පන්න	ඒකක භාර / සාමූහික ආයෝජන යෝජනා ක්‍රම	ප්‍රාග්ධන වෙළෙඳපොළ
විෂයමාලා අංක 01	සුරකුම්පත් වෙළෙඳපොළ සහ උපකරණ	●	●	●	●	●
විෂයමාලා අංක 02	හිමිකම් නිකුතු	●				●
විෂයමාලා අංක 03	ණය සුරකුම්පත්		●			●
විෂයමාලා අංක 04	ව්‍යුත්පන්න සුරකුම්පත්			●		●
විෂයමාලා අංක 05	ඒකක භාර / CIS Code				●	●
විෂයමාලා අංක 06	මූල්‍ය සැළසුම්, උපදේශණය හා අලෙවිකරණය	●	●	●	●	●
විෂයමාලා අංක 07	සුරකුම්පත් නියාමනය සහ ආචාරධර්ම	●	●	●	●	●
	සහතිකපත්‍ර	හිමිකම් සුරකුම්පත් සහතික පත්‍රය (CES)	ණය සුරකුම්පත් සහතික පත්‍රය (CDS)	ව්‍යුත්පන්න සුරකුම්පත් සහතික පත්‍රය (CDvS)	ඒකක භාර සහතික පත්‍රය / සාමූහික ආයෝජන යෝජනා ක්‍රම (CUT/CCIS)	ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතික පත්‍රය (CCM)
	කර්මාන්තය පිළිබඳ අදාළ පලපුරුද්ද	මාස 6 කි	මාස 6 කි	මාස 6 කි	මාස 6 කි	වසරකි
	Viva Voce විභාග	අවශ්‍යයි	අවශ්‍යයි	අවශ්‍යයි	අවශ්‍යයි	අවශ්‍යයි
	කර්මාන්තය සම්බන්ධ තනතුර	සහතිකපත්‍ර ලාභී හිමිකම් සුරකුම්පත් උපදේශක (CESA)	සහතිකපත්‍ර ලාභී හිමිකම් සුරකුම්පත් උපදේශක (CDSA)	සහතිකපත්‍ර ලාභී හිමිකම් සුරකුම්පත් උපදේශක (CDvSA)	ලියාපදිංචි ආයෝජන උපදේශක (CUTA)	සහතිකපත්‍ර ලාභී ඒකක භාර උපදේශක (CUTA)
	අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා (CPD)	වාර්ෂිකව අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා ලකුණු 4 කි.				

උපායමාර්ගික අරමුණු 1

ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම

කොවිඩ් වසංගතය සහ රටේ ආර්ථික තත්ත්වය විසින් ඇති කරන ලද වෙනස්කම්වලට අනුවර්තනය වීමේ වැදගත්කම හඳුනාගෙන සහ අවබෝධ කර ගනිමින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඔන්ලයින් ක්‍රමය හරහා බාධාවකින් තොරව දේශන සඳහා සිය සහතික පත්‍ර ප්‍රදානය කිරීමේ වැඩසටහන අඛණ්ඩව සිදු කරගෙන ගියේය.

සලකා බලනු ලබන කාල සීමාව තුළ මෙම සහතිකපත්‍ර ලබාදීමේ වැඩසටහන් සඳහා බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව වර්ධනයවීමේ ප්‍රවණතාවක් නිරීක්ෂණය විය.

එහි බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොටස් තැරැව්කාර කර්මාන්තයේ ආයෝජන උපදේශකයෙකු ලෙස රාජකාරී ඉටු කිරීම සඳහා අනිවාර්ය වන ලියාපදිංචි ආයෝජන උපදේශක (RIA) සහ සහතික කළ හිමිකම් සුරැකුම්පත් උපදේශක (CESA) සහතික පත්‍ර පිරිනැමීම සිදුකරනු ලබයි. තවද, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නියම කර ඇති අවශ්‍යතාවලට අනුකූල නොවීම හේතුවෙන් බලපත්‍ර අවලංගු වූ ආයෝජන උපදේශකයින් වකුලේඛ සහ විධාන මගින් වෙළෙඳපොළට දැනුම් දී ඇති පරිදි නැවත සේවයේ පිහිටුවීම අඛණ්ඩව සිදු කරන ලදී. කර්මාන්තයේ බලපත්‍ර ලබදීමේ ක්‍රියා පටිපාටියේ ප්‍රධාන කාර්යභාරය සැලකිල්ලට ගනිමින්, ආයෝජන උපදේශකයින් සඳහා අඛණ්ඩ viva Voce විභාග කිසිදු බාධාවකින් තොරව වසර පුරා පවත්වන ලදී. මෙම විභාගවලට වත්කම් පන්ති හතරම ආවරණය වන ලියාපදිංචි ආයෝජන උපදේශක (RIA) බලපත්‍රය හදාරන සිසුන් ඇතුළත් විය. එනම් හිමිකම් සුරැකුම්පත්, ණය සුරැකුම්පත්, ඒකක භාරය සහ ව්‍යුත්පන්න සුරැකුම්පත් වේ. තනි වත්කම් පන්තියක් සඳහා වන CESA බලපත්‍රය හිමිකම් සුරැකුම්පත් සඳහා නිකුත් කරන ලදී.

වෘත්තිකයන්ගේ සහ වෙළෙඳපොළ වෘත්තිකයින්ගේ දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීම සහ තිරසාර කිරීම සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන් ඔන්ලයින් ක්‍රමය හරහා පවත්වන ලදී.


ඉහත කරුණු වලට අමතරව, 2023 වසර තුළ දැනට සිටින සහ ආයෝජනය කිරීමට හැකියාව ඇති ආයෝජකයින්ට දැනුවත් ආයෝජන තීරණ ගැනීම සඳහා පහසුකම් සැලසෙන පරිදි දැනුම ලබා දීම කෙරෙහි අවධානය යොමු කරන ලද ආයෝජන වැඩසටහනක් ද සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පවත්වන ලදී. එය දෙමළ මාධ්‍යයෙන් පවත්වන ලද අතර එම වැඩසටහනේ සියලුම දේශන ඔන්ලයින් ක්‍රමවේදය ඔස්සේ පවත්වන ලදී.

ඉහත වැඩසටහන් සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළ වෘත්තිකයන්ට අමතරව කර්මාන්ත නොවන පුද්ගලයන්, උපාධි අපේක්ෂකයින්, පාසල් හැර ගිය අය සහ වෙනත් අංශවල වෘත්තීන්හී නියැලුන පුද්ගලයන් ඇතුළු විවිධ අංශ නියෝජනය කරන ශිෂ්‍ය පදනමක් නිරීක්ෂණය විය.

ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතිකපත්‍ර පාඨමාලාව (CCM), හිමිකම් සුරැකුම්පත් පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව (CES), ණය සුරැකුම්පත් පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව (CDS) සහ ඒකක භාර සහතිකපත්‍ර පාඨමාලාව (CUT)

ඉහත සඳහන් වැඩසටහන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන ලද අතර 2023 වර්ෂයේදී ආරම්භ කරන ලදී. 2022 ඔක්තෝම්බර් මස ආරම්භ වූ ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතිකපත්‍ර පාඨමාලාවේ 26 වන කාණ්ඩායම සිසුන් 87 දෙනෙකුගෙන් සමන්විත වූ අතර එය 2023 සැප්තැම්බර් මාසයේදී සාර්ථකව පවත්වා අවසන් කරන ලදී. එම පාඨමාලාවේ 27 වන කණ්ඩායමට ලියාපදිංචි වූ සහභාගීවන්නන් සංඛ්‍යාව 73 ක් වූ අතර එය 2023 ඔක්තෝම්බර් මාසයේදී ආරම්භ කරන ලදී. (රූප සටහන: 03)

රූප සටහන 03: 2023 දී පාඨමාලා සම්පූර්ණ කිරීමේ සංඛ්‍යාලේඛන



ලියාපදිංචි ආයෝජන උපදේශක (RIA), සහතිකපත්‍ර ලාභී හිමිකම් සුරැකුම්පත් උපදේශක (CESA) සහ නැවත ස්ථාපිත කිරීම්

RIA බලපත්‍රය, CESA බලපත්‍රය, CUTA බලපත්‍රය අපේක්ෂා කරන සිසුන්ට බලපත්‍ර ප්‍රදානය කිරීම සහ වාර්ෂික CPD අවශ්‍යතාවයට අනුකූල නොවීම හේතුවෙන් බලපත්‍රය කල් ඉකුත් වූ ආයෝජන උපදේශකයින් නැවත සේවයේ පිහිටුවීම සඳහා, වසර තුළ ඩෂඒ ඩධකෑ විභාග 15 ක් පැවැත්විණි.

ඒ අනුව මෙම VIVA VOCE විභාග සඳහා සිසුන් 52 දෙනෙකු සහභාගී වූ අතර සාමාන්‍ය සමත් ප්‍රතිශතය 62% කි. සමත් සිසුන් අතරින් සිසුන් 21 දෙනෙකු 66% ක ප්‍රතිශතයක් සටහන් කරමින් RIA බලපත්‍රය ලබාගෙන ඇති අතර සිසුන් 2 දෙනෙකු සමත් සිසුන්ගෙන් 6% ක් පෙන්නුම් කරමින් CESA බලපත්‍රය ලබාගෙන ඇති අතර සිසුන් 3 දෙනෙකු 9% ක් අගයක් පෙන්නුම් කරමින් CUTA බලපත්‍රය ලබාගෙන ඇත. 19% ක ප්‍රතිශතයක් පෙන්නුම් කරමින් වසර තුළ ආයෝජන උපදේශකයින් 6 දෙනෙකු පමණක් නැවත සේවයේ පිහිටුවන ලදී. (සංඛ්‍යා සටහන: 10)

සංඛ්‍යා සටහන 10: 2023 දී බලපත්‍ර ලබාගැනීමේ සංඛ්‍යාලේඛන

බලපත්‍ර වර්ගය	2023 තුළ බලපත්‍ර ලබා ගැනීමේ සංඛ්‍යාලේඛන	%
ලියාපදිංචි ආයෝජන උපදේශක (RIA)	21	66
සහතික පත්‍ර ලාභී හිමිකම් සුරැකුම්පත් උපදේශක (CESA)	2	6
සහතික පත්‍ර ලාභී ඒකක භාර උපදේශක (CUTA)	3	9
නැවත ස්ථාපිත කිරීම්	6	19
එකතුව	**32**	**100**

අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන්

සමාලෝචිත වර්ෂය තුළ, කොටස් තැරැව්කාර සමාගම්වල දැනට සිටින ආයෝජන උපදේශකයින් සඳහා දේශීය සහ ගෝලීය ප්‍රාග්ධන වෙළෙඳපොළේ නවතම ප්‍රවණතා සමඟ නිරන්තරයෙන් තක්සේරු කිරීමට සහ යාවත්කාලීන කිරීමට ඔවුන්ට හැකිවන පරිදි CPD වැඩසටහන් 5ක් පවත්වන ලදී . මෙම වැඩසටහන් සඳහා කොටස් තැරැව්කාර සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන්, ආයෝජන උපදේශකයින්, විශ්ලේෂකයින් සහ මූල්‍ය ක්ෂේත්‍රය තුළ වෙනත් කර්මාන්තවල සේවයේ නියුක්ත වුවද තම බලපත්‍ර රඳවා ගැනීමට කැමති පුද්ගලයින් ඇතුළු 1400 කට අධික පිරිසක් සහභාගී වූහ. සියලුම CPD වැඩසටහන් අන්තර්ජාලය හරහා ඔන්ලයින් වැඩසටහන් ආකාරයෙන් (webinars) පවත්වන ලදී.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, දැනට සිටින ආයෝජන උපදේශකයින් හට ඊළඟ වසර සඳහා ඔවුන්ගේ RIA තත්ත්වය අලුත් කිරීම සඳහා වසරකට අවම වශයෙන් CPD සම්මන්ත්‍රණ ලකුණු 4ක් ලබා ගැනීම සඳහා එහි අනිවාර්ය අවශ්‍යතාවය පවත්වා ගෙන ගියේය. (සංඛ්‍යා සටහන : 11)

සංඛ්‍යා සටහන 11 : CPD වැඩසටහන් වල සාරාංශය: වසර 2023

CPD වැඩසටහනේ මාතෘකාව	සහභාගි වූ සංඛ්‍යාව
සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ සන්දර්භය තුළ නියාමනය කරන ලද ආයතනවල නියාමනය සහ අධීක්ෂණය	326
වැඩසටහන් මාලාව 01 - සුරැකුම්පත් වෙළෙඳපොළ සහ උපකරණ	261
කොළඹ කොටස් වෙළෙඳපොළ ජංගම යෙදුම සහ අනෙකුත් CDS සේවාවන් භාවිතා කරමින් CDS ගිණුම් විවෘත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය	51
වැඩසටහන් මාලාව 06 - මූල්‍ය සැලසුම්කරණය, උපදේශණය සහ අලෙවිකරණය	158
තාක්ෂණික විශ්ලේෂණය	121

ආයෝජක පාඨමාලා

ආයෝජනය කිරීමට හැකියාවක් ඇති ආයෝජකයින් සඳහා කොටස් ගණුදෙනු පිළිබඳ මූලික න්‍යායික හා ප්‍රායෝගික පැති සම්බන්ධව දැනුම ලබාදීමේ අරමුණින් ආයෝජක වැඩසටහන් ආරම්භ කරන ලදී. එක් කණ්ඩායමක් වසර තුළ ආරම්භ කරන ලද අතර එය සති හයක් දක්වා පවත්වන ලදී. කර්මාන්ත අවශ්‍යතා අනුව ලියාපදිංචි වූ සහභාගිවන්නන් 24 දෙනෙකු සමඟ දෙමළ මාධ්‍යයෙන් පවත්වන ලද 30 වන කාණ්ඩය, 2023 ජූනි මාසයේදී ආරම්භ විය.

රන් පදක්කම් සහ මුදල් ත්‍යාග ව්‍යාපෘතිය

උපාධි අපේක්ෂකයින් අතර ප්‍රාග්ධන වෙළෙඳපොළ දැනුම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ ජාතික විශ්ව විද්‍යාල සමඟ සමීප සබඳතාවක් පවත්වාගෙන ගියේය. විශ්ව විද්‍යාලවල ප්‍රාග්ධන වෙළෙඳපොළට අදාළ විෂයයන් හැදෑරීමට උපාධි අපේක්ෂකයින් දිරිමත් කිරීම සඳහා ආරම්භ කරන ලද රන් පදක්කම් සහ මුදල් සම්මාන ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුළ තවදුරටත් පවත්වාගෙන යන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රාග්ධන වෙළෙඳපොළ ක්ෂේත්‍රයේ හොඳම දක්ෂතා දක්වන උපාධි අපේක්ෂකයින් සඳහා රන් පදක්කමක් සහ මුදල් ත්‍යාගයක් ප්‍රදානය කරන ලදී. ඉහත ව්‍යාපෘතිය සම්බන්ධව ශ්‍රී ලංකාවේ ජාතික විශ්ව විද්‍යාල එකොළහක් සමඟ අවබෝධතා ගිවිසුම් (MOU) අත්සන් කර ඇත.

ඒ අනුව 2023 වර්ෂය තුළ පහත දක්වා ඇති ජාතික විශ්වවිද්‍යාල සඳහා රන් පදක්කම් සහ මුදල් ත්‍යාග පිරිනමන ලදී.

- යාපනය විශ්වවිද්‍යාලය
- කැලණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා උඹව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

අන්තර් විශ්වවිද්‍යාල දැනුම මිනුම් තරඟය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් ජාතික විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂකයින් සඳහා "Varsity Battles 2023" නමින් අන්තර් විශ්වවිද්‍යාල ප්‍රශ්න විචාරාත්මක තරඟයක් සංවිධානය කර පවත්වන ලදී.

මෙම ප්‍රශ්න විචාරාත්මක තරඟය සංවිධානය කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳව දැනුවත් කිරීම සහ එමගින් ශ්‍රී ලංකාවේ උපාධි අපේක්ෂකයින් අතර මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමයි. මෙම තරඟය සංවිධානය කිරීම හරහා උපාධි අපේක්ෂකයින්ට ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ වැඩි දැනුමක් ලබා ගැනීමට මග පෑදූ අතර කොටස් වෙළෙඳපොළෙහි ආයෝජනය කිරීමට මෙන්ම ප්‍රාග්ධන වෙළෙඳපොළ කර්මාන්තයේ රැකියා අවස්ථා සොයාගැනීමට සිසුන් පෙළඹවීමට සමත්විය.

මෙම අවස්ථාවට ජාතික විශ්ව විද්‍යාල 13ක් නියෝජනය කරමින් කණ්ඩායම් ඉදිරිපත් වූ අතර සහභාගීවන්නන් තුළ ගෝලීය වෙළෙඳපොළ, සාමාන්‍ය දැනුම, ශ්‍රී ලංකා ආර්ථිකය සහ ව්‍යාපාර, කාලීන තොරතුරු, ක්‍රීඩා සහ විනෝදාස්වාදය ඇතුළු විවිධ දැනුම් ක්ෂේත්‍ර පිළිබඳව දැනුම පරීක්ෂා කරන ලදී.

කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ පීඨය නියෝජනය කළ කණ්ඩායමට (කැලණිය මේවරික්ස්) සමස්ත තරඟයේ ජයග්‍රාහකයා ලෙස රුපියල් ලක්ෂ 3 ක (300,000/-) මුදල් ත්‍යාගයක් හිමිවිය. මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය නියෝජනය කළ කණ්ඩායම (මොර ෂාක්ස්) ප්‍රථම අනුශූරතාව දිනාගත් අතර ඔවුන්ට රු. 200,000/- ක මුදල් ත්‍යාගයක් හිමිවිය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය නියෝජනය කළ කණ්ඩායම (Pera Prodigies) දෙවන අනුශූරතාවය දිනාගත් අතර ඔවුන්ට රු. 100,000/- මුදල් ත්‍යාගයක් හිමිවිය.

උපායමාර්ගික අරමුණු 1

ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සම්බන්ධයෙන් පල වූ පුවත්පත් ලිපි



Faizal Salieh assumes duties as new SEC Chairman

THE Securities and Exchange Commission of Sri Lanka (SEC) yesterday announced that Faizal Salieh assumed duties as the Chairman on 20 February 2023.

The Daily FT on 10 February exclusively reported the impending appointment.

Salieh is currently the Chairman of the Sri Lanka Institute of Directors, which is committed to empowering Directors from both the private and public sectors with insights

Faizal Salieh

ing over 40 years of extensive experience in commercial and development banking both in Sri Lanka and overseas. He was Chief of Corp and Merchant Bank ANZGrindlays Bank; NDB; Executive Direct of NDB Housing Bank; MD/CEO of Amana Ba

Says SEC mindful in playing balanced regulatory role with due consideration to both market development and market facilitation

Stresses need to safeguard investors while helping market grow by doing 'the right thing the right way'

Urges stock brokers to move away from short-termism towards long-term sustainability collectively to build investor trust and confidence in capital market

Meets formation of Compliance Officers Forum

Brokers call for listing of identified SOEs, attract captive funds such as pension and retirement funds to market and listing of Green and Blue bonds,

New SEC Chairman starts stakeholder meetings

THE Securities and Exchange Commission of Sri Lanka (SEC) new Chairman Faizal Salieh met with representatives of the stock broking industry last week and deliberated issues that currently impact the capital market and the way forward.

SEC Director General Chinthaka Mendis, Colombo Stock Exchange (CSE) Chairman Dilshan Wirasekara, CEO Rajeeva Bandaranaike and other officials of both the SEC and CSE participated at the meeting.

SEC Chairman Faizal Salieh (right) with DG Chinthaka Mendis

More Page 2

Inaugurates 'Capital Market Club' program in Nugawela Central College in Kandy

Stresses dual importance of technology, financial literacy for future generations

Emphasises need for SL to break free from its stagnant position,

President launches visionary program to propel Sri Lanka into developed nation by 2048

PRESIDENT Ranil Wickremesinghe yesterday highlighted the dual importance of technology and financial literacy for the next generations, as Sri Lanka moves towards becoming a developed nation by 2048.

Speaking at the inauguration of the 'Capital Market Club' program at the Nugawela Central College in Kandy yesterday, Wickremesinghe emphasised the need for Sri Lanka to break free from its stagnant position and embrace a forward-thinking approach to secure its global standing.

President Ranil Wickremesinghe

MONDAY, SEPTEMBER 11, 2023

NEWS/ADVERTORIAL

University of Moratuwa Winning Team – Varsity Battles 2023 (inter-faculty quiz competition)

SEC and CSE inter-faculty quiz competition concludes at Moratuwa University

The Varsity Battles 2023, inter-faculty quiz organized by the Securities and Exchange Commission of Sri Lanka (SEC) and the Colombo Stock Exchange (CSE), was completed at the Moratuwa University on August 29.

The quiz concluded, three winning teams emerged from the Faculty of Engineering itself. The Faculty of Engineering Team 3 emerged as the winning team, whilst Faculty of Engineering Team 1 and Faculty of Engineering Team 2, received certificates being 1st and 2nd runners- up.

The Varsity Battles 2023 intend to create awareness and educate university students, capital markets and to increase financial literacy among university students. The initially launched in May 2023 with Rajarata University of Sri Lanka and University of Jaffna, followed by the create awareness on the importance of financial, investor, and capital market education. Thus, this initiative highlights the importance of financial literacy for every undergraduate in Sri Lanka."

A group of organizations have come together as sponsors to make this inter university competition a reality. The Varsity Battles 2023 is sponsored by the following organizations.

Platinum sponsors: First Capital Holdings PLC and Bartleet Religare Securities.

Gold sponsors: AICPA and CIMA Sri Lanka, Capital Trust Holdings Ltd, London Stock Exchange Group Sri Lanka, CT CLSA Securities (Pvt) Ltd, and Senfin Securities Limited

Silver sponsors: Lanka Securities (Pvt) Ltd, LOLC Holdings PLC, Asha

Policies for Management Internal Shareholders Investors, Whistleblowing, Disclosures, Social Governance Sustainability and Anti-Bribery and Corruption

Securities and Exchange Commission of Lanka has announced Corporate

SEC announces enhanced Corporate Governance rules

Exchange with effect from 1 October 2023.

High standards of Corporate Governance with accountability and transparency are critical to building investor confidence in the capital market and is therefore a priority on the SEC's regulatory agenda. The SEC recognising the need to improve the level of in the market initiated a process of amending the Rules on Corporate Governance through a process of stakeholder and public consultations. Based on the stakeholder and public responses the Rules were revised to enhance the governance structures and responsibilities of the Board of Directors and Board Committees of the compa

SEC, CSE host another Investor Forum in Negombo

The Securities and Exchange Commission of Sri Lanka (SEC) and Colombo Stock Exchange (CSE) successfully conducted another investor forum in Negombo at Jetwing Blue on August 12.

Market. A session to cre- awareness on the CSE Mobile was conducted by a CSE cutive from the Kandy ch, Madhawa Arunadeni-

rthermore, an analysis of sectoral performance and opportunities was pre- by Softlogic Stockbrokers Ltd Co-Head of Research Wickremeratne.

nel discussion was held participation of Tushara e, Raynal Wickremer- CSE Kandy Branch

wardena, providing an opportunity for participants to clarify any doubts from the panelists.

The participants were also given the opportunity to meet investment advisors from stock brokerage firms and representatives of unit trust management companies.

The SEC and CSE have conducted a number of forums this year in Badulla, Panadura, Trincomalee, Ampara and Batticaloa to create awareness on investor education and protection while highlighting the importance of financial

SEC cracks down on manipulation via social media

THE Securities and Exchange Commission (SEC) has cracked down suspected market and price manipulation via the use of social media by several persons.

In a series of actions last week, the SEC issued caution and warning notices on four persons found to have engaged in alleged manipulation. One case was a publication of certain comments on the securities of Softlogic Life Insurance PLC (AAIC) listed on the Colombo

Stock Exchange, in a WhatsApp social media group named

– "Investing", in and around January 2023 that tantamount to recommendations being made to influence other investors to make investment decisions regarding those securities without a proper basis.

More Page 2

සමාජ මාධ්‍ය නාලිකා හරහා සිදුකළ ආයෝජන දැනුවත් කිරීම්.


























උපායමාර්ගික අරමුණු 1

ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම

















උපායමාර්ගික අරමුණු 2

ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම

ආවේක්ෂණය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ප්‍රාථමික අරමුණ වනුයේ, සාධාරණ, කාර්යක්ෂම, හා විනිවිදභාවයෙන් යුත් ප්‍රාග්ධන වෙළෙඳපොළක් ප්‍රවර්ධනය කිරීම, වැඩිදියුණු කිරීම, හා පවත්වාගෙ නයාමයි. මෙහිදී වෙළෙඳපොළ මිල ගණන් කෘතිම ලෙස උස් පහත් කිරීම්, අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදු කරනු ලබන වෙළෙඳාම් සහ අනෙකුත් ව්‍යාජ වෙළෙඳපොළ ගණුදෙනු වලින් ඇතිවිය හැකි ප්‍රාග්ධන වෙළෙඳපොළ විසමාචාර හඳුනාගැනීම හා ඒවා වැලැක්වීමට කඩිනමින් ක්‍රියාත්මකවීම අවේක්ෂණ අංශය විසින් ඉටුකරනු ලබයි. මේ අනුව අවේක්ෂණ අංශය විසින් අවධිමත් වෙළෙඳපොළ චලනයන් හා විෂමතාවන්ගෙන් සුරැකුම්පත් වෙළෙඳපොළ හා එහි සහභාගිකරුවන්ගේ අඛණ්ඩතාව ආරක්ෂා කිරීම සඳහා වෙළෙඳපොළ අධීක්ෂණය සිදුකරනු ලබයි. යම්කිසි අක්‍රමිකතාවක් හඳුනාගැනීමෙන් පසුව ටැබ්ලෝ (Tableau) විශ්ලේෂනාත්මක මෙවලම් හා විවිධ ක්‍රමවේදයන් මගින් කොටස් වෙළෙඳපොළ දත්ත විශ්ලේෂණය කරනු ලබයි. තවද, ආවෙක්ෂණ අංශය විසින් බොහෝ විශ්ලේෂණයන් සඳහා අභ්‍යන්තර වශයෙන් ගොඩනැගූ කොළඹ කොටස් වෙළෙඳපොළ දත්ත පද්ධතීන් භාවිතා කරයි. එස් ඇන්ඩ් පී කැටල් අයි කිව් මගින් බහුවිධ වෙළෙඳපොළ තොරතුරු ලබාගැනීමට අවශ්‍ය වෙබ් පාදක සේවාවන් ද සපයාගනු ලබයි. අප විසින් සෑම විටම වෙළෙඳපොළ අඛණ්ඩතාව පවත්වාගැනීම සහතික කිරීම සඳහා වෙළෙඳපොළ විෂමාචාර හඳුනාගැනීමේදී නියාමන කටයුතු සිදු කරන්නෙමු. එහි ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රමවත් වෙළෙඳපොළ මෙහෙයුම් පද්ධතියක් වර්ධනය කිරීමට හා ප්‍රාග්ධන වෙළෙඳපොළ කෙරෙහි ආයෝජක විශ්වාසනීයත්වය තහවුරු කිරීමට ආවේක්ෂණ අංශයේ කාර්යන් උපකාරී වේ. ආයෝජකයන්ගේ සුරක්ෂිතතාවය අපගේ ප්‍රමුඛතාවයයි.




ආවේක්ෂණ කණ්ඩායම

ආවේක්ෂණ නිරීක්ෂණයන්, වාර්තාවන්, සහ සටහන්

ආවේක්ෂණ අංශය විසින් 2023 අප්‍රේල් මාසයේ සිට නිරීක්ෂණ පුවරුවක් (Dash Board) පවත්වාගෙන යන අතර දිනපතා කෙරෙන නිරීක්ෂණයන් මගින් එය යාවත්කාලීන කරනු ලබයි.ආවෙක්ෂණ අංශය විසින් සිදුකරනු ලබන නිරීක්ෂණයන් සහ ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මාසිකව පවත්වනු ලබන කොමිෂන් සභා රැස්වීම්හිදී කොමිෂන් සබාව දැනුවත් කෙරේ. ඒ අනුව 2023 වසරේදී ආවෙක්ෂණ අංශය විසින් නිරීක්ෂණ පුවරුව හරහා අසාමාන්‍ය වෙළෙඳපොළ හැසිරීම් පිළිබඳ සිද්ධීන් 169ක් වාර්තා කර ඇති අතර සැක කටයුතු සිද්ධීන්ගේ බරපතලකම මත අදාළ ක්‍රියාමාර්ගයන් ගෙන ඇත.

මේ සිද්ධීන් සම්බන්ධයෙන්, කොටස් තැරැව්කරුවන්, ආයෝජන උපදේශකවරුන් සහ ආයෝජකයන්ගෙන් ආවෙක්ෂණ අංශය මගින් පැහැදිලි කිරීම් කරගනු ලබයි. මෙම පැහැදිලි කිරීම් විවිධාකාර වන අතර ඒවා දුරකථන ඇමතුම් මගින්, ලිපි සහ ප්‍රකාශ සටහන් මගින් සිදුකරනු ලබයි. (රූප සටහන 04)

රූප සටහන 04: ආවේක්ෂණ වාර්තා සහ සටහන්



සමාලෝචිත වර්ෂය තුළදී විවිධ සැක කටයුතු ගනුදෙනු සම්බන්ධයෙන් ආයෝජකයන්, ආයෝජන උපදේශකයන් සහ අනුකූලතා නිලධාරීන් වෙත දුරකථන ඇමතුම් 79ක් ලබාදී ඇත. (සංඛ්‍යා සටහන 12)

සංඛ්‍යා සටහන 12: දුරකථන ඇමතුම් මගින් පැහැදිළි කර ගැනීම්

සම්බන්ධිත පාර්ශ්වය	දුරකථන ඇමතුම් සංඛ්‍යාව
ආයෝජකයින්	58
ආයෝජන උපදේශකවරුන්	17
අනුකූලතා නිලධාරීන්	4


2023 වසර තුළදී ආවෙක්ෂණ අංශය විසින් ආවෙක්ෂණ වාර්තා 12ක් සහ ආවෙක්ෂණ සටහන් 1ක් ජනනය කර ඇත. ඒ අතරින් ආවේක්ෂණ වාර්තා 11ක් සඳහා පූර්ණ විමර්ශනයන් සිදු කිරීමට අනුමත වී ඇති අතර ඒවා කඩිනමින් සහ ක්‍රියාකාරීව නිම කළ යුතුව ඇත. තවද සමහර නිරීක්ෂණ හා සොයා ගැනීම්වලට ප්‍රතිචාර වශයෙන් කාලෝචිත ලෙස බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ගයන් අනුගමනය කරයි. මීට අමතරව ආවෙක්ෂණ අංශය වෙත කොළඹ කොළඹ කොටස් හුවමාරුව වෙතින් 2023 වසර තුළ නිරීක්ෂණ වාර්තා 4ක් ලැබී ඇත. වැඩිදුර විමර්ෂණ සඳහා අවශ්‍ය කරුණු සම්පාදනය කරමින් එම

උපායමාර්ගික අරමුණු 2

ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම

වාර්තා වැඩිදුර විශ්ලේෂණය කරමින් සම්පූර්ණ වාර්තා සකස් කොට කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබයි. සමහර සිද්ධීන් කොමිෂන් සභාවේ අනෙකුත් අදාළ අංශ වෙත නිසි ක්‍රියාමාර්ග සඳහා යොමුකරනු ලැබේ. කොළඹ කොටස් වෙළෙඳපොළ මගින් යොමුකරන ලද ආවේක්ෂණ වාර්තාවන් සම්බන්ධයෙන් වැඩිදුර විස්තර සාකච්ඡා කිරීමට සහ යොමුකිරීමවල ප්‍රගතිය දැනුම්දීම සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළ ආවේක්ෂණ අංශය සමඟ නිතිපතා රැස්වීම් ද පවත් වනු ලබයි. (රූප සටහන 05)

රූප සටහන 05: සැක සහිත වරදවල් වර්ග



නිරීක්ෂණ වාර්තාවලට අමතර, කොමිෂන් සභාවේ අවශ්‍යතාවය පරිදි විශේෂයෙන්ම විමර්ශන අංශය වෙත විවිධ වෙළෙඳපොළ විශ්ලේෂණයන් ප්‍රඥාබිතා පදනම මත ආවේක්ෂණ අංශය විසින් ජනනය කර ඇත. සැක සහිත පාර්ශවයන් අතර සිදුවන්නා වූ සමාජ මාධ්‍ය ජාල පදනම් කරගත් වෙළෙඳපොළ විෂමතා හඳුනාගැනීමට ආවේක්ෂණ අංශය විසින් ශ්‍රී ලංකා පරිසනක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT) හා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේනතුව (ROC) වැනි සෙසු නියාමනකරුවන්ගේ සහ ආයතනවලින් තවදුරටත් සහාය ලබාගෙන ඇත. මෙම ක්‍රියාමාර්ග ගනු ලැබූයේ විභව වෙළෙඳපොළ විෂමාචාර සඳහා කාලෝචිත ප්‍රතිචාර දැක්වීම හා එමගින් සිදුවිය හැකි වෙළෙඳපොළ අහිතකර තත්ත්වයන් පූර්ව අවධියේදීම හඳුනා ගැනීමයි.

සිදුවිය හැකි විශාල පරාසයේ වෙළෙඳපොළ විෂමාචාරයන් හඳුනාගැනීමට සහ ආවේක්ෂණ ක්‍රියාකාරකම්හී ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් අංග සම්පූර්ණ ස්වයංක්‍රීය නිරීක්ෂණ පද්ධතියක් සඳහා යෝජනා කැඳවා ඇති අතර 2024 වසරේ සිට ස්වයංක්‍රීය නිරීක්ෂණ පද්ධතිය උපයෝජනය කිරීමට අපෙක්ෂා කරයි.

සමාජ මාධ්‍ය ජාල අධීක්ෂණය

සිදුවිය හැකි වෙළෙඳපොළ විෂමාචාර හඳුනා ගැනීමට සහ තොරතුරු පදනම් කරගත් විෂමාචාරයන්ට අදාළව ක්‍රියාකාරී පියවර ගැනීම සඳහා ආවේක්ෂණ අංශය විසින් විවිධ සමාජ මාධ්‍ය ජාලයන්හී පලකරනු ලබන විවිධ තොරතුරු අධීක්ෂණය කරනු ලබයි. ඒ අනුව විවිධ ආයෝජකයන් විසින් ෆෙස්බුක් (Facebook), යූ ටියුබ් (YouTube), වට්ස්ඇප් (WhatsApp), ටෙලිග්‍රෑම් (Telegram) සහ ට්විටර් (X) වැනි විවිධ සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ පලකරනු ලබන විෂම වෙළෙඳපොළක් නිර්මාණය කිරීමට තුඩු දෙන නිර්දේශ කිරීම්, ඉලක්ක මිල ගණන් ඉදිරිපත් කිරීම්, සමාජ මාධ්‍ය ප්‍රවර්ධන කටයුතු සඳහා "කොටස් හුවමාරුව" යන මාතෘකාව යොදාගැනීම් ආදී සියල්ලම ආවේක්ෂණ අංශය විසින් අධීක්ෂණය කරන අතර ඒවා වැළැක්වීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත.

එහි ප්‍රතිඵලයක් ලෙස සමාජ පරිසරයේ සන්දර්භය සහ පවතින වෙළෙඳපොළ තත්ත්වයන් සැළකිල්ලට ගෙන වෙළෙඳපොළ විෂමාචාර සම්බන්ධයෙන් කාලෝචිත හා සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. ඒ අනුව නිරීක්ෂණ 27කට අදාළව ආයෝජකයන්ගෙන් දුරකථන ඇමතුම් මගින් පැහැදිළි කිරීම් කඩිනමින් සිදු කොට ඇති අතර නුසුදුසු අන්තර්ගතයන් පලකිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණ 4කට අදාළව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි නිල ෆෙස්බුක්/යූ ටියුබ් ගිණුම මගින් අදාළ සාමාජ වේදිකාවන්ට වාර්තා කරන ලදී. සිදුකරන ලද නිරීක්ෂණයන්හී බරපතලතාවය අනුව සිද්ධීන් 10කට අදාළව ප්‍රකාශ සටහන් කර ගැනීම මගින් පැහැදිළි කිරීම් සිදු කොට ඇත. 2023 වර්ෂය තුළ හඳුනාගත් ආයෝජකයන් 6 දෙනෙකු සඳහා අනතුරු ඇඟවීම් නිකුත් කොට ඇති අතර ආයෝජකයන් 8 දෙනෙකු සඳහා තදබල ලෙස අවවාද කිරීම් ලිපි යවා ඇත.

විමර්ශන කටයුතු

යම් තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධාන වලට පටහැනිව ක්‍රියාකිරීමක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග යක්, යම් රීතියක්, යම් විධානයක් හෝ ලබා දෙන ලද යම් උපදෙසක් උල්ලංඝණය කිරීමක් සම්බන්දයෙන් විමර්ශන පැවැත්වීම කොමිසන් සභාවේ ප්‍රධාන කාර්යයන්, බලතල සහ කර්තව්‍යන් අතර වේ. සමාලෝචනයට ලක්වන වර්ෂය (2023) තුළදී, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඉහත සඳහන් කාර්ය ඉටු කිරීමට සිය පරිශ්‍රමයන් අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර එමඟින් සාධාරණ, ක්‍රමවත්, කාර්යක්ෂම සහ විනිවිධභාවයෙන් යුතු සුරැකුම්පත් වෙළෙඳපොළක් නිර්මාණය කිරීම, පවත්වාගෙනයාම සහ නියාමනය කිරීම සඳහා පහසුකම් සැලසීම සහ දේශීය හා විදේශීය ආයෝජකයින්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම අරමුණු වේ.

2023 ආරම්භයේ දී, පෙර වසරේ සිට ඉදිරියට ගෙන එන ලද විමර්ශන 57 ක් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සතුව පැවතුනි. තවද, 2023 වර්ෂයේදී, කොමිෂන් සභාව විසින් 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත, 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත (සංශෝධිත පරිදි) සහ 2001 සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති යටතේ සැක කටයුතු වැරදි සම්බන්ධයෙන් විමර්ශන 24ක් ආරම්භ කිරීමට තීරණය කරන ලදී. එසේ ආරම්භ කරන ලද විමර්ශනවලින් 12ක් 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ වන උල්ලංඝණයන්ට අදාළ විය. මෙම උල්ලංඝනය කිරීම්වලට අභ්‍යන්තර වෙළෙඳාම, සහ ව්‍යාජ වෙළඳාම, වෙළඳපොල මිල ගණන් කෘතිම ලෙස උස් පහත් කිරීම සහ සුරැකුම්පත් වංචා ආදී වශයෙන් වූ විවිධ කොටස් වෙළඳපොළ විෂමාචාර ඇතුලත් විය.

ඉහත කී විමර්ශන 81 න් සමාලෝචිත වර්ෂය තුළ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විමර්ශන 26 ක් අවසන් කරන ලදී. එවැනි විමර්ශන 14 ක සොයාගැනීම් මත පදනම්ව පහත සඳහන් ක්‍රියාමාර්ග ගැනීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී.

- පුද්ගලයන් 25 දෙනෙකුට සහ ආයතන 5කට හේතු දැක්වීමේ නිවේදන (Notices of Show Cause) නිකුත් කිරීම.
- එක් පුද්ගලයෙකුට අවවාද කිරීමේ ලිපියක් (Letter of Warning) නිකුත් කිරීම.
- පුද්ගලයන් දෙදෙනෙකුට අනතුරු ඇඟවීමේ ලිපි (Letters of Caution) නිකුත් කිරීම; සහ
- විමර්ශන 4ක අදාළ සොයාගැනීම්, අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කිරීම.

ඉහත විමර්ශන 26 ට අමතරව, සමාලෝචිත වර්ෂය තුළ සිදු කරන ලද තවත් විමර්ශන හතරක සොයාගැනීම් මත පදනම්ව, පුද්ගලයන් හත් දෙනෙකුට සහ ආයතන හතරකට හේතු දැක්වීමේ නිවේදන නිකුත් කිරීමට කොමිෂන් සභාව තීරණය කළේය. තවද, එවැනි විමර්ශන දෙකකට අදාළ සොයාගැනීම් අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කිරීමට තීරණය කරන ලදී. කෙසේ වෙතත්, එකී විමර්ශනවල වල වෙනත් අංශ සම්බන්ධයෙන් තවදුරටත් විමර්ශන සිදුකිරීමට කොමිෂන් සභාව තීරණය කළ බැවින්, එම විමර්ශන වසර අවසානයේ දී අවසන් නොවීය.

තවද, 2023 වසර තුළදී අවසන් කරන ලද විමර්ශන 12ක සොයාගැනීම් වලින්, එම විමර්ශනයන්ට භාජනය වූ අදාළ පුද්ගලයන් හෝ ආයතන කිසියම් වෙළඳපොල විෂමචාරයක්

සිදුකර ඇති බව තහවුරු නොවූ බැවින්, එම විමර්ශනවලට අදාලව කිසිදු බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග යක් නොගැනීමට තීරණය කරන ලදී.

ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයේදී විමර්ශන 55 ක් සිදුකරමින් පැවතුනි. ඉන් 2024 වර්ෂය සඳහා වූ කොමිෂන් සභාවේ පළමු රැස්වීමට ඉදිරිපත් කිරීමට නියමිතව තිබූ විමර්ශන අටකට අදාළ විමර්ශන වාර්තා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අවසන් කර තිබුණි.

එපමනක් නොව, ඩිජිටල් යුගයේ වර්ධනයන්ට අනුකූලව, සමාලෝචිත වර්ෂය තුළ ඩිජිටල් පරිවර්තනය වෙත යොමු වෙමින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පහත පියවර ගනු ලැබිය.

1. විමර්ශන සඳහා මෙතෙක් රැස් කරන ලද තොරතුරු ඩිජිටල් වේදිකාවකට සංක්‍රමණය කිරීම ආරම්භ කිරීම සහ
2. විමර්ශනවල සමස්ත ඵලදායීතාවය ඉහළ නැංවීමට සහ විමර්ශන අංශයේ කාර්ය සාධනය ප්‍රශස්ත කිරීම සඳහා ප්‍රයෝජනයට ගත හැකි උසස් විශ්ලේෂණ මෙවලම් ගවේෂණය කිරීම.

තවද, 2023 වර්ෂය තුලදී, මෙතෙක් අභ්‍යන්තර මාර්ගෝපදේශයක් ලෙස භාවිතා කරන ලද සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා විමර්ශන අත්පොත (SEC Investigations Manual), නව විමර්ශන සහ බලාත්මක කිරීමේ අත්පොතක් (Investigations and Enforcement Manual) මගින් ප්‍රතිස්ථාපනය කරන ලදී. මෙම නව අත්පොත 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත මගින් සිදුකරන ලද වෙනස්කම් ඇතුළත් කරමින් සකස් කර ඇත. මෙම නව අත්පොත සැකසීම සඳහා සුරැකුම්පත් කොමිෂන් සභා ජ්‍යාත්‍යන්තර සංවිධානය (IOSCO) විසින් සපයන ලද තාක්ෂණික සහාය ද ඉවහල් විය.



විමර්ශන කණ්ඩායම

බලාත්මක කිරීමේ ක්‍රියා

විමර්ශන, නිරීක්ෂණ, අධීක්ෂණ සොයාගැනීම් ආදිය මත පදනම්ව, කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ මඟ පෙන්වීම සහ තීරණය කිරීම් මත ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලාත්මක කිරීමේ ක්‍රියා මාර්ගයන් ගනු ලැබේ.*

හේතු දැක්වීම් නිවේදන නිකුත් කිරීම

- ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතින්වල 12 වන රීතිය උල්ලංඝනය කරමින් වෙළෙඳපොළ නොමග යවන සුලු ආකාරයෙන් ක්‍රියා කිරීම හේතුවෙන් ආයෝජන උපදේශකවරුන් තිදෙනෙකුට හේතු දැක්වීම් නිවේදන නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතින් වල 12 වන රීතිය උල්ලංඝනය කරමින්, වෙළෙඳපොළ නොමග යවන සුලු ආකාරයෙන් ඇතැම් ලැයිස්තුගත කොටස්වල ක්‍රියා කිරීම හේතුවෙන් ආයෝජකයින් නව දෙනෙකුට හේතු දැක්වීම් නිවේදන නිකුත් කරන ලදී.
- සමාගමක් විසින් 2014 වර්ෂයේදී, එහි ඉතිරි කොටස් හිමියන්ට අනිවාර්ය අර්පණයක් දීර්ඝ කළ කාලය තුළ සමාගම් අත්පත්කර ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය 1995 (සංශෝධිත) හි 30(1) රීතියට පටහැනිව පොදු ලැයිස්තුගත සමාගමක ක්‍රියාවක් සම්බන්ධයෙන්, හේතු දැක්වීම සඳහා 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ (සංශෝධිත) 51 (3) වගන්තිය ප්‍රකාරව එකී සමාගමට, එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කළ අධ්‍යක්ෂවරුන් හත්දෙනාට සහ එම සමාගමේ එක් සේවකයෙකුට හේතු දැක්වීම් නිවේදන නිකුත් කරන ලදී.
- 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 137 (2) (අ) වගන්තියට පටහැනිව සමාගමක ප්‍රකාශනය නොකළ මිල සංවේදී තොරතුරු සන්තකයේ තබාගෙන එකී සමාගමේ සම්බන්ධිත පාර්ශවයක්ව සිටියදී එකී පොදු ලැයිස්තුගත සමාගමේ කොටස් මිලදී ගැනීම හේතුවෙන් පුද්ගලයන් තිදෙනෙකුට හේතු දැක්වීම් නිවේදන නිකුත් කරන ලදී.
- ලේඛනයක් ප්‍රකාශයට පත් කිරීම සහ නිර්දේශයන්ට සමාන තොරතුරු අඩංගු ඉදිරිපත් කිරීමක්/වැඩමුළුවක් පැවැත්වීම හේතුවෙන් වෙළඳපල සහ/හෝ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි සුරැකුම්පත්වල මිල සම්බන්ධයෙන් ව්‍යාජ වෙළඳපොලක් නිර්මාණය කිරීමට තැත් කිරීම සම්බන්ධයෙන් පුද්ගලයෙකුට හේතු දැක්වීමේ නිවේදනයක් නිකුත් කරන ලදී.
- 2001 දෙසැම්බර් 18 දිනැති අංක 1215/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතින්වල 12 වැනි රීතියට පටහැනිව ක්‍රියාකිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග නොගත යුත්තේ මන්දැයි පැහැදිලි කිරීම සඳහා පුද්ගලයෙකුට සහ සමාගම් දෙකකට හේතු දැක්වීමේ නිවේදන නිකුත් කරන ලදී.
- පොදු ලැයිස්තුගත සමාගමක කොටස්වල පෙර විකිණීම් (front running) සිදු කිරීම හේතුවෙන් ආයෝජන උපදේශකයකුට හේතු දැක්වීමේ නිවේදනයක් නිකුත් කරන ලදී.
- පොදු ලැයිස්තුගත සමාගමක කොටස්වල පෙර විකිණීම් (front running) සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීම සහ වරදට අනුබල දීම හේතුවෙන් ආයෝජකයෙකුට, හේතු දැක්වීමේ නිවේදනයක් නිකුත් කරන ලදී.
- වෙළෙඳපොළ අතරමැදියෙකුගේ බලපත්‍රය අලුත් කිරීමේ අරමුණින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයේ වැරදි සහ අසත්‍ය තොරතුරු සැපයීම හේතුවෙන් වෙළෙඳපොළ අතරමැදියෙකුගේ ප්‍රධාන කළමනාකාරිත්වයේ නිලධාරියෙකුට හේතු දැක්වීමේ නිවේදනයක් නිකුත් කරන ලදී.
- ආයෝජකයෙකුට, කොටස් වෙළෙඳපොළ නොමග යවන සුලු ආකාරයෙන් ක්‍රියා කිරීමට කුමන්ත්‍රණය කිරීම සහ ඔහුගේ ආයෝජන උපදේශකයින්ට කොටස් වෙළෙඳපොළ නොමග යවන සුළු ආකාරයෙන් ක්‍රියා කිරීම සඳහා ආධාර

* සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇති පුද්ගලයින්ගේ නම් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ප්‍රකාශන ප්‍රතිපත්තියට අනුව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත.

උපායමාර්ගික අරමුණු 2

ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම

කිරීම සහ අනුබල දීම හේතුවෙන් හේතු දැක්වීමේ නිවේදනයක් නිකුත් කරන ලදී.

- 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 128 (1) වගන්තිය සහ 129 (1) වගන්තිය උල්ලංඝණය කරමින් ආයෝජකයෙකු කොටස් වෙළෙඳපොළ නොමග යවන සුලු ආකාරයෙන් ක්‍රියා කිරීම හේතුවෙන් පොදු ලැයිස්තුගත සමාගමක කොටස්වල වෙළඳාම් රටාව සම්බන්ධයෙන්, ඔහුට හේතු දැක්වීමේ නිවේදනයක් නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතින් වල 12 වන රීතියට පටහැනිව කොටස් වෙළෙඳපොළ නොමග යවන සුළු ආකාරයෙන් ක්‍රියා කිරීම සහ ඊට සම්බන්ධයෙන් කුමන්ත්‍රණය කිරීම හේතුවෙන්, පොදු ලැයිස්තුගත සමාග මක අධ්‍යක්ෂවරයෙකු, කළමනාකාර අධ්‍යක්ෂවරයෙකු සහ ඔවුන්ට සම්බන්ධ ආයෝජකයෙකු හට සඳහා හේතු දැක්වීමේ නිවේදන නිකුත් කරන ලදී.
- 2015 දී, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 51 (1) (අ) වගන්තියේ විධිවිධාන යටතේ පනවා ඇති අවශ්‍යතාවයක් ලෙස 2015 වර්ෂයේදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විධානයක් මගින් නිකුත් කරන ලද වෙළෙඳපොළ අතරමැදියන්ට අදාළ වන නියාමන ප්‍රමිතීන් උල්ලංඝනය කිරීම හේතුවෙන් ලියාපදිංචි කර ඇති ආයෝජන කළමණාකරුවෙකුට, එහි අධ්‍යක්ෂවරුන් සහ එහි ප්‍රධාන ආයෝජන නිලධාරියා වෙත හේතු දැක්වීම් නිවේදනයක් නිකුත් කරන ලදී.
- ආයෝජකයෙකුගේ ආයෝජන භාරව ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු ලෙස කටයුතු කරන අතරතුර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතින් වල 14 වන රීතියට පටහැනිව කොටස්වල පෙර විකිණීම් (front running) සිදු කිරීම සම්බන්ධයෙන් පුද්ගලයෙකුට හේතු දැක්වීමේ නිවේදනයක් නිකුත් කරන ලදී.
- කොළඹ කොටස් වෙළඳපොල හි වෙළඳ සහභාගිවන්නන්ගේ නීති රීති හි 13.3 (3) සහ 13.3 (4) රීති උල්ලංඝනය කිරීමෙන් 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 175 (1) (a) වගන්තිය යටතේ වරදක් සිදුකිරීම හේතුවෙන් කොටස් තැරැව්කාර සමාගමකට හේතු දැක්වීමේ නිවේදනයක් නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 වන රීතිය සහ 14 වන රීතිය උල්ලංඝනය කරමින් කොටස්වල පෙර විකිණීම් (front running) සිදු කර කොටස් වෙළඳපොළ අයුතු ලෙස හැසිරවීම සම්බන්ධයෙන් ආයෝජන උපදේශකයෙකුට හේතු දැක්වීමේ නිවේදනයක් නිකුත් කරන ලදී.
- පොදු ලැයිස්තුගත සමාගමක කොටස් සම්බන්ධයෙන්, කොටස් වෙළෙඳපොළ නොමග යවන සුලු ආකාරයෙන් ක්‍රියා කිරීම සහ තවත් අයෙකුට අනුබල දීමට කුමන්ත්‍රණය කිරීමෙන් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 වන රීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් සේවක අර්ථසාධක අරමුදලේ හිටපු සේවකයින් තිදෙනෙකුට හේතු දැක්වීම් නිවේදන නිකුත් කරන ලදී.
- සිය මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුම සහ තවත් අයෙකුගේ ගිණුම භාවිත කර ගණුදෙනු කිරීමෙන්, 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 128 සහ 132 වගන්ති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන්, ආයෝජකයෙකුට හේතු දැක්වීමේ නිවේදනයක් නිකුත් කරන ලදී.

නඩුකර පැවරීමේ නිවේදන නිකුත් කිරීම

- පොදු ලැයිස්තුගත සමාගමක්, 2014 වර්ෂයේදී එහි ඉතිරි කොටස් හිමියන්ට අනිවාර්ය අර්පණයක් දීර්ඝ කරන ලද කාලය තුළ, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ව්‍යාජ තොරතුරු සැපයීමෙන් එවකට 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ (සංශෝධිත) 51(1) (අ) වගන්තියට අනුව වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් හත් දෙනෙකුට නඩුකර පැවරීමේ නිවේදන නිකුත් කරන ලදී.
- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 වන රීතිය උල්ලංඝනය කරමින් කොටස් වෙළෙඳපොළ නොමග යවන සුලු ආකාරයෙන් ඔවුන්ගේ ගනුදෙනු ක්‍රියා කිරීම සම්බන්ධයෙන් ආයෝජන උපදේශකයින් දෙදෙනෙකුට එරෙහිව නඩුකර පැවරීමේ නිවේදන නිකුත් ලදී.
- ආයෝජකයෙකුගේ ආයෝජන භාරව ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු ලෙස කටයුතු කරන අතරතුර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 14 වන රීතියට පටහැනිව කොටස්වල පෙර විකිණීම් (front running) සිදු කිරීම කර ඇති බවට අනාවරණය වූ එක් පුද්ගලයෙකුට නඩුකර පැවරීමේ නිවේදන නිකුත් ලදී.
- හිටපු ආයෝජන උපදේශකයෙකු, ඇතැම් ආයෝජකයින් විසින් ඔහුට පවරා තිබූ මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුම් අවභාවිත කරමින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 12 වන රීතියට පටහැනිව කොටස් වෙළෙඳපොළ නොමග යවන සුලු ආකාරයෙන් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් නඩුකර පැවරීමේ නිවේදන නිකුත් ලදී.
- 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 32 (1) වගන්තිය උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් පොදු ලැයිස්තුගත සමාගමක අධ්‍යක්ෂවරියකට නඩුකර පැවරීමේ නිවේදනයක් නිකුත් ලදී.
- අනිවාර්ය අර්පණයක අර්පණකරු වූ පොදු ලැයිස්තුගත සමාගමකට සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලයට, තවත් පොදු ලැයිස්තුගත සමාගමක් විසින් එහි ඉතිරි කොටස් හිමියාට කරන ලද අනිවාර්ය අර්පණයක් සම්බන්ධයෙන් 1995 (සංශෝධිත) සමාගම් අත්පත්කර ගැනීමේ සහ ඒකාබද්ධ කිරීම් සංග්‍රහයේ (TOM CODE) 31(3) රීතිය උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් නඩුකර පැවරීමේ නිවේදන නිකුත් ලදී.
- අනිවාර්ය අර්පණයක අර්පණකරු වූ පොදු ලැයිස්තුගත සමාගමකට සහ එවකට විධායක සභාපතිවරයාට, තවත් පොදු ලැයිස්තුගත සමාගමක් විසින් එහි ඉතිරි කොටස් හිමියන්ට කරන ලද අනිවාර්ය අර්පණයක් සම්බන්ධයෙන් 1995 (සංශෝධිත) සමාගම් අත්පත්කර ගැනීමේ සහ ඒකාබද්ධ කිරීම් සංග්‍රහයේ (TOM CODE) 31(3) රීතිය උල්ලංඝනය කිරීමට අනුබල දීම සහ කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් නඩුකර පැවරීමේ නිවේදන නිකුත් කරන ලදී.
- අනිවාර්ය අර්පණයක දී අර්පණලාභී සමාගමේ කොටස් හිමියෙකු වූ පොදු ලැයිස්තුගත සමාගමක ආයෝජකයෙකුට/සභාපතිවරයෙකුට, තවත් පොදු ලැයිස්තුගත සමාගමක් විසින් එහි ඉතිරි කොටස් හිමියන්ට කරන ලද අනිවාර්ය අර්පණයක් සම්බන්ධයෙන් 1995 (සංශෝධිත) සමාගම් අත්පත්කර ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහයේ (TOM CODE) 31(3) රීතිය කඩ කිරීමට කුමන්ත්‍රණ කිරීම සහ අර්පණකාර සමාගමේ විධායක සභාපතිවරයාට ආධාර කිරීම සහ අනුබල දීම සම්බන්ධයෙන් නඩුකර පැවරීමේ නිවේදන නිකුත් ලදී.
- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 වන රීතිය උල්ලංඝනය කරමින් ඇතැම් ලැයිස්තුගත කොටස් වල වෙළඳාම කිරීමෙන් කොටස් වෙළෙඳපොළ නොමග යවන සුලු ආකාරයෙන් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් ආයෝජකයින් තිදෙනෙකුට නඩුකර පැවරීමේ නිවේදන නිකුත් ලදී.
- පොදු ලැයිස්තුගත සමාගමක විධායක නොවන සභාපති, විධායක අධ්‍යක්ෂ/ සාමාන්‍යාධිකාරී, එහි ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ පොදු ලැයිස්තුගත සමාගමට සම්බන්ධ පුද්ගලයන් දෙදෙනකුට පොදු ලැයිස්තුගත සමාගමේ කොටස්වල වෙළෙඳපොළ/මිල නොමග යවන සුලු ආකාරයෙන් ක්‍රියා කරමින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 වන රීතිය උල්ලංඝනය වන අන්දමට ක්‍රියා කිරීම සම්බන්ධයෙන්

නඩුකර පැවරීමේ දැන්වීම් නිකුත් කරන ලදී.

- පොදු ලැයිස්තුගත සමාගමක අධ්‍යක්ෂවරයෙකුට සහ කළමනාකාර අධ්‍යක්ෂවරයෙකුට සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 වන රීතියට පටහැනිව කොටස් වෙළඳපොල නොමග යවන සුළු ආකාරයෙන් ක්‍රියා කිරීම සහ එයට එක්ව කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් නඩුකර පැවරීමේ දැන්වීමක් නිකුත් කරන ලදී.
- ආයෝජකයින් දෙදෙනෙකුට, ඔවුන් විසින් පොදු ලැයිස්තුගත සමාගමක ලැයිස්තුගත කොටස් සම්බන්ධයෙන්, වයිබර් (Viber) සමාජ මාධ්‍ය සමූහයක කරන ලද ඇතැම් පළ කිරීම් හරහා කොටස් වෙළඳපොළ නොමග යවන සුළු ආකාරයෙන් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් නඩුකර පැවරීමේ දැන්වීම් නිකුත් කරන ලදී.
- පොදු ලැයිස්තුගත සමාගමක ප්‍රකාශයට පත් නොකළ මිල සංවේදී තොරතුරු සන්තකයේ තබාගෙන සිට එම පොදු ලැයිස්තුගත සමාගමේ කොටස් මිලදී ගැනීම මගින් ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 137 (2) (a) වගන්තියට පටහැනිව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් එක් පුද්ගලයෙකුට නඩුකර පැවරීමේ දැන්වීමක් නිකුත් කරන ලදී.
- 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 32(1) වගන්තිය උල්ලංඝනය කරමින් සිදු කළ අභ්‍යන්තර ගණුදෙණු සම්බන්ධයෙන් පොදු ලයිස්තුගත සමාගමක අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුට නඩුකර පැවරීමේ දැන්වීම් දෙකක් නිකුත් කරන ලදී.
- 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ (සංශෝධිත ලෙස) 32(6) වගන්තිය උල්ලංඝනය කරමින් සිදු කළ අභ්‍යන්තර ගනුදෙනු සම්බන්ධයෙන් පොදු ලැයිස්තුගත සමාගමක අධ්‍යක්ෂකවරයෙකුට නඩුකර පැවරීමේ දැන්වීමක් නිකුත් කරන ලදී.

අනතුරු ඇඟවීම් නිකුත් කිරීම

- පොදු ලැයිස්තුගත සමාගමක අධ්‍යක්ෂවරයෙකු විසින් සිදු කරන ලද ගනුදෙනු අභ්‍යන්තර ගනුදෙනුද යන්න තහවුරු කර ගැනීම සඳහා කරන ලද විමර්ශනයකින් අනතුරුව එකී අධ්‍යක්ෂවරයාට අනතුරු ඇඟවීමක් නිකුත් කරන ලදී.
- ලැයිස්තුගත කිරීමේ රීතිවල 7.8 රීතියට අනුකූල බව සහතික කිරීම සඳහා, කොටස් වෙළඳපොල වෙත මුදා හැරීමට නියමිත රහස්‍ය මිල සංවේදී තොරතුරු සඳහා ප්‍රවේශයක් ඇති අභ්‍යන්තර අධ්‍යක්ෂවරුන්ගේ ගනුදෙනු පාලනය කිරීම සඳහා ප්‍රමිතියකින් යුත් අභ්‍යන්තරික යාන්ත්‍රණයක් පවත්වා ගෙන යන ලෙස පොදු ලැයිස්තුගත සමාගමකට අනතුරු ඇඟවීමක් නිකුත් කරන ලදී.
- වට්ස්ඇප් (WhatsApp) සමාජ මාධ්‍ය සමූහයක "කොටස් හුවමාරුව" යන නම, මාතෘකාව, විස්තරය සහ ලාංඡනය භාවිතා කරමින් සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර ලබා දී ඇති කොටස් හුවමාරුවකට සම්බන්ධිත බව ඇඟවීමට ලක් කිරීම හේතුවෙන් ආයෝජකයෙකුට අනතුරු ඇඟවීමක් නිකුත් කරන ලදී.
- කොළඹ කොටස් හුවමාරුවේ හි එවකට තිබූ කොටස් තැරැව්කාර රීතීන්හි 2.5.1 රීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කොටස් තැරැව්කාර සමාගමක ප්‍රධාන විධායක නිලධාරියකුට, අනතුරු ඇඟවීමක් නිකුත් කරන ලදී.
- අවවාද කර තිබියදී, තම පියාගේ මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුම භාවිතා කරමින් ගනුදෙනු කිරීම සහ වෙනත් ආයෝජකයින්ට බලපෑම් කිරීමේ අරමුණින් සමාජ මාධ්‍ය වල කොටස් නිර්දේශ පළ කිරීම සම්බන්ධයෙන් සහ තම මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුම නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකර ඔහුගේ පුතුට භාවිතා කිරීම ඉඩදීම සම්බන්ධයෙන් එක් පුද්ගලයෙකුට අනතුරු ඇඟවීම් නිකුත් කරන ලදී.
- 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 77 වැනි වගන්තියට පටහැනිව, කොටස් හුවමාරුවේ නම, මාතෘකාව සහ ලාංඡනය භාවිතා කිරීමට එරෙහිව ආයෝජකයින් දෙදෙනෙකුට අනතුරු ඇඟවීම් නිකුත් කරන ලදී.
- ආයෝජන උපදේශකයෙකු සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් විසින් සිදු කරන ලද අසාමාන්‍ය ගනුදෙනු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයකින් අනතුරුව, කොළඹ කොටස් හුවමාරුවෙහි කොටස් තැරැව්කාර රීතිවල 3.1 රීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් එකී ආයෝජන උපදේශකවරයාට අනතුරු ඇඟවීමක් නිකුත් කරන ලදී.

අවවාද ලිපි නිකුත් කිරීම

- පොදු ලැයිස්තුගත සමාගමක හිටපු අධ්‍යක්ෂවරයකුට, එම සමාගමෙහි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයකු ලෙස තමන් කටයුතු කළ කාලය තුළ, ප්‍රකාශයට පත් නොකළ මිල සංවේදී තොරතුරු භාවිතා කරමින් එම සමාගමේ කොටස්වල ගනුදෙනු කිරීමෙන් වැළකෙන ලෙස අවවාද කරන ලදී.
- සිය සුරාකුම්පත් සම්බන්ධයෙන් ආයෝජන තීරණ ගැනීමේදී අනෙකුත් ආයෝජකයින්ට බලපෑම් වන ආකාරයෙන් සහ එමගින් කොළඹ කොටස් හුවමාරුවෙහි ගනුදෙනු කෙරෙන ඇතැම් සුරාකුම්පත් පිළිබඳව ව්‍යාජ වෙළඳපොලක් නිර්මාණය වන පරිදි සමාජ මාධ්‍ය ඔස්සේ අදහස් දැක්වීමට එරෙහිව ආයෝජකයින් නව දෙනෙකුට අවවාද කරන ලදී.
- වෙළඳපොළේ සාවද්‍ය සහ නොමග යවනසුලු පෙනුමක් ඇති වන පරිදි ලැයිස්තුගත සුරාකුම්පත් කිහිපයක කොටස් වල සිය ගනුදෙනු කිරීමේ රටාව සම්බන්ධයෙන් ආයෝජකයින් හතර දෙනෙකුට අවවාද කරන ලදී.
- කොටස් තැරැව්කාර සමාගමක ප්‍රධාන විධායක නිලධාරියකු විසින් එම කොටස් තැරැව්කාර සමාගමෙහි ඔහුගේ පවුලේ සාමාජිකයන් වන ගනුදෙනුකරුවන් දෙදෙනෙකුගේ සුරාකුම්පත් ගිණුම්වල ක්‍රියාත්මක කරන ලද පොදු ලැයිස්තුගත සමාගම් හතරක කොටස්වල ගනුදෙනුවලට අදාළව පෙර විකුණුම් විය හැකි පරිදි කරන ලද ගනුදෙනු හැසිරවීම සම්බන්ධයෙන් අවවාද කරන ලදී.
- පොදු ලැයිස්තුගත සමාගමක කොටස්වල වෙළඳපොළ හෝ එම කොටස්වල මිල සම්බන්ධයෙන් වැරදි අදහසක් ඇති වන පරිදි කරන ලද ගනුදෙනු රටාව සම්බන්ධයෙන් ආයෝජකයෙකුට අවවාද කරන ලදී.

ප්‍රසිද්ධ/පොදු තරයේ අවවාද නිකුත් කිරීම

සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 වන රීතිය උල්ලංඝනය කරමින් පොදු ලැයිස්තුගත සමාගමක කොටස් වල වෙළෙඳපොළ/මිල කෘතිම ලෙස හසුරුවමින් කරන ලද වෙළඳාම් රටාව සම්බන්ධයෙන් ආයෝජකයෙකුට තරයේ අවවාද නිකුත් කරන ලදී.

වෙනත් ආයතන වෙත යොමු කරන ලද වාර්තා

- 1998 - 2017 කාලය තුළ සේවක භාරකාර අරමුදල (Employee Trust Fund) විසින් පොදු ලැයිස්තුගත සමාගමක කොටස්වල ආයෝජනය කිරීම සඳහා සිදු කර ඇති ඇතැම් කොටස් ගනුදෙනු සම්බන්ධයෙන් සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සිදු කරන ලද විමර්ශනවල අනාවරණයන් අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කරන ලදී.
- ආයෝජන උපදේශකයෙකු සහ ඔහුගේ පවුලේ සාමාජිකයින් විසින් සිදුකරනු ලැබූ අසාමාන්‍ය ගනුදෙනු ක්‍රියාකාරකම් පිළිබඳව සහ එමගින් ඔහු කොළඹ කොටස් හුවමාරුවෙහි කොටස් තැරැව්කාර රීතිවල 3.1 වගන්තියට (එම කාලවකවානුව ඇතුලත) අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වීම සම්බන්ධව කොළඹ කොටස් හුවමාරුව වෙත දැනුම් දෙන ලදී.

උපායමාර්ගික අරමුණු 2

ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම

පරිපාලනමය දණ්ඩන නියම කිරීම

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද හේතු දැක්වීමේ ලිපිවලට දක්වන ලද පිළිතුරු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව පොදු ලැයිස්තුගත සමාගමක් විසින් කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීමේ රීති වල 7.13 (ඉ) (ii) රීතිය අනුව සමාගම අනුකූල විය යුතු හෙළිදරව් කිරීම් නොකිරීම/ප්‍රමාද වීම හේතුවෙන් 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 178 (ii) වගන්තිය ප්‍රකාරව කොමිසමේ සාමාජිකයින්ගේ තීරණය මත එම සමාගමට එරෙහිව රු. 5,000,000/- පරිපාලනමය දඩයක් පනවන ලදී.

2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 26(5), 178(5a), 81(3), 175(1)(ඇ) සහ 175(4) වගන්ති සමග කියවිය යුතු 16(ඇ) වගන්තිය මගින් නිකුත් කරන ලද නියෝගය

ලැයිස්තුගත සමාගම් සහ ඒවායේ අධ්‍යක්ෂවරුන් විසින් කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීමේ රීතිවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග සහ/හෝ පරිපාලනමය දඩයන් ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් දෙමින් ඊට අදාළ මාර්ගෝපදේශ සමගින් කොළඹ කොටස් හුවමාරුව වෙත නියෝගයක් නිකුත් කරන ලදී.

ආයෝජන උපදේශකයින් දෙදෙනෙකුට සහ ඔවුන්ගේ කොටස් තැරැව්කාර සමාගම් වෙත 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 16(ඇ) වගන්තිය යටතේ නිකුත් කර ඇති නියෝග

2022 මාර්තු 15 වැනි දින අංක 2271/09 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය සහ 2022 මාර්තු 15 දිනැති අංක 2271/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කර ඇති සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතින් සමඟ කියවිය යුතු වෙළඳපොළ සහභාගිවන්නන් සඳහා වන අවම ප්‍රමිතීන් වල (5)(අ)(ii) රීතිය යන රීතීන්ට අනුව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර ලබා ඇති වෙළඳපල අතරමැදියන් දෙදෙනකු ඔවුන්ගේ සේවාදායකයින් සමඟ ගනුදෙනු කරන ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් හෝ සේවකයින් වීමට ඔවුන් තවදුරටත් සුදුසුකම් නොලබන බවට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතින්හි යෝග්‍යතා රීතියේ 6 (ට) දෙවන (II) උපලේඛනය ප්‍රකාරව නිකුත් කරන ලද නියෝග මගින් දැනුම් දෙන ලදී.

ඉහත ආයෝජන උපදේශකයින්ට අදාළ කොටස් තැරැව්කාර සමාගම් වලටද නියෝග මගින් ඉහත කාරණා පිළිබඳව දැනුම් දෙන ලදී.

වරදවල් සමථයකට පත් කිරීම

- 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 32 (1) වගන්තිය උල්ලංඝණය කරමින් ක්‍රියා කර ඇති බවට අනාවරණය වූ පොදු ලැයිස්තුගත සමාගමක අධ්‍යක්ෂවරයකු විසින් කරන ලද අයදුම්පතක් මත, එම වරද රු. මිලියන 3ක මුදලක් ගෙවීමෙන් අනතුරුව සමථයකට පත් කිරීමට කොමිෂන් සභාව විසින් එකඟ වන ලදී. මෙම එකඟවීම මත සඳහන් කළ මුදල සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලට ගෙවීමෙන් අනතුරුව වරද සමථයකට පත් කරන ලදී.
- 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ (සංශෝධිත) 32(1) සහ 32 (6) වගන්ති උල්ලංඝණය කරමින් අභ්‍යන්තර ගනුදෙනු කිරීම සම්බන්ධයෙන් පොදු ලැයිස්තුගත සමාගමක අධ්‍යක්ෂවරයෙකුට එරෙහිව නීතිමය වැරදි හතරක්, වරදකරුගේ ඉල්ලීම මත සමථයකට පත් කිරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් එකඟ වූ නමුත් සමථයට පත් කිරීමේ මුදල් වටිනාකම සම්බන්ධයෙන් එකී පුද්ගලයා එකඟ නොවීම හේතුවෙන් එකී තීරණය කොමිෂන් සභාව විසින් ඉල්ලා අස්කර ගන්නා ලදී. ඒ අනුව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් එම පුද්ගලයාට එරෙහිව එවකට පැවති ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 32(1) සහ 32 (6) යටතේ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති අතර, එම පුද්ගලයා එම සමථයට පත් කිරීමේ මුදලේ ප්‍රමාණය අභියෝගයට ලක් කොට අභියාචනාධිකරණය හමුවේ රිට් ඉල්ලීමක් ගොනු කර ඇත. (මෙයට අදාළ නඩු සාරාංශය සඳහා පහත CA (උ) 301/2023 සහ CA (උ) 797/2023 බලන්න).
- පොදු ලැයිස්තුගත සමාගමක විධායක නොවන සභාපතිවරයකු විසින් සිදු කර ඇති බවට අනාවරණය වූ වෙළඳපල/මිල කෘත්‍රිම ලෙස හැසිරවීමේ වරද සමථයකට පත් කිරීමට සඳහා වූ අයදුම්පතක් මත, ඔහු විසින් රු. මිලියන 3.3ක මුදලක් කොමිසමේ වන්දි අරමුදලට ගෙවීමෙන් අනතුරුව එකී වරද සමථයකට පත් කරන ලදී.
- පොදු ලැයිස්තුගත සමාගමක විධායක අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරීවරයකු විසින් සිදු කර ඇති බවට අනාවරණය වූ වෙළඳපල/මිල කෘත්‍රිම ලෙස හැසිරවීමේ වරද සමථයකට පත් කිරීමට සඳහා ඉදිරිපත් කළ අයදුම්පතක් මත, ඔහු විසින් රු. මිලියන 3.3ක මුදලක් කොමිසමේ වන්දි අරමුදලට ගෙවීමෙන් අනතුරුව එකී වරද සමථයකට පත් කරන ලදී.
- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ 2001 රීතිවල 12 වන රීතිය උල්ලංඝණය කිරීම සඳහා තවත් අයෙකුට ආධාර අනුබල දීම සහ එහි කුමන්ත්‍රණය සම්බන්ධයෙන් කළ වරද සමථයට පත් කිරීමේ මුදල ගෙවීම සඳහා 2022 වර්ෂයේදී වසරක කාලයක් ලබා දුන් ආයෝජකයෙකු මෙම වසර තුළදී (2023) ඔහුගේ වරද සමථයකට පත් කිරීමේ මුදල ගෙවා පියවන ලදී.
- පොදු ලැයිස්තුගත සමාගමක සභාපතිවරයා විසින් 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 32 (6) වගන්තිය උල්ලංඝණය කරමින් අභ්‍යන්තර ගනුදෙනු කිරීමේ වරද සමථයට පත් කිරීම සඳහා කරන ලද අයදුම්පත මත, ඇතැම් කොන්දේසි වලට යටත්ව රුපියල් මිලියන 100 ක සමථයට පත් කිරීමේ මුදලක් නියම කිරීමට කොමිෂන් සභාව තීරණය කළේය. කෙසේ වෙතත්, එම පුද්ගලයා තවමත් මෙම මුදල ගෙවා වරද සමතයකට පත්කර ගෙන නොමැත.
- පොදු ලැයිස්තුගත සමාගම් දෙකක කොටස් සම්බන්ධයෙන් පුද්ගලයෙකු විසින් සිදු කර ඇති බවට අනාවරණය වූ වෙළඳපල කෘත්‍රිම ලෙස හැසිරවීමේ වරද සමථයට පත් කිරීම සඳහා එම පුද්ගලයා විසින් කරන ලද ඉල්ලීම මත, රුපියල් මිලියන 6.6 ක මුදලක් ගෙවා එකී වැරදි සමථයට පත් කිරීමට කොමිෂන් සභාව තීරණය කළේය. කෙසේ වෙතත්, මොහු විසින් මෙම මුදල පියවීමට අපොහොසත් වී ඇති අතර, ඒ අනුව ඔහුට එරෙහිව කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ නඩුකර පැවරීමට කොමිෂන් සභාව විසින් පියවර ගන්නා ලදී.
- පොදු ලැයිස්තුගත සමාගමක කොටස් සම්බන්ධයෙන් පුද්ගලයෙකු විසින් සිදු කර ඇති බවට අනාවරණය වූ වෙළඳපොල නොමග යවන සුලු ආකාරයෙන් ක්‍රියා කිරීමේ වරද සමථයට පත් කිරීම සඳහා එම පුද්ගලයා විසින් කරන ලද ඉල්ලීම මත, රුපියල් මිලියන 3.3 ක මුදලක් ගෙවා එකී වැරදි සමථයට පත් කිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී. කෙසේ වෙතත් මොහු විසින් මෙම මුදල ගෙවා නොමැති අතර, ඒ අනුව ඔහුට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ නඩුකර පැවරීමට කොමිෂන් සභාව විසින් පියවර ගන්නා ලදී.

විසඳීමට තිබෙන නඩු

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව එම්. අයි. සම්සුදීන් සහ එම්. බී නිසාර් - MC S/5322/17

1987 අංක 36 දරන (සංශෝධිත) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 51(1)(අ) වගන්තියට අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 113(අ) සහ 102 වගන්ති සමග කියවිය යුතු 2001 දෙසැම්බර් 18 දින 1215/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 12 වන රීතිය

යටතේ දඬුවම් ලැබිය හැකි වෙළඳපොල/මිල කෘත්‍රිම ලෙස හැසිරවීමට කුමන්ත්‍රණය කිරීම සහ වෙළඳපළ/මිල හැසිරවීමට ක්‍රියා කිරීම සම්බන්ධව එම්. අයි. සම්සුදීන් සහ බෆික් නිසාර් යන අයට එරෙහිව ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ මෙම නඩුව පවරන ලදී. මෙම නඩුව අධිකරණය හමුවේ විභාග වෙමින් පවතී.

ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව ලංකා කන්නන්ගර, කපිල සෙනරත්, ෆාරික් ෆුර්බාන් සහ රවින්ද්‍ර මල්ලවාරච්චි - මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව/13736/19

1987 අංක 36 දරන (සංශෝධිත) ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 51(1)(අ) වගන්තියට අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) සහ 102 වගන්ති සමග කියවිය යුතු 2001 දෙසැම්බර් 18 දින 1215/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 12 වන රීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදවල් වන වෙළඳපොළ කෘත්‍රිම ලෙස හැසිරවීම, වෙළඳපොළ අයථා හැසිරවීමට කුමන්ත්‍රණය කිරීම හා ආධාර හා අනුබල දීම සම්බන්ධයෙන් ආයෝජන උපදේශකවරුන් හතර දෙනෙකුට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ මෙම නඩුව පවරන ලදී. මෙම නඩුව අධිකරණය හමුවේ විභාග වෙමින් පවතී.

චින්තක මෙන්ඩිස් එදිරිව ඩබ්ලිව්.කේ.එච්. වැගපිටිය, තිලක් ද සිල්වා සහ තක්ෂිල හුලංගමුව - මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව/16967/20

1987 අංක 36 දරන (සංශෝධිත) ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 51(1)(අ) වගන්තියට අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) සහ 102 වගන්ති සමග කියවිය යුතු 2001 දෙසැම්බර් 18 දින 1215/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 12 වන රීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වෙළඳපොළ කෘත්‍රිම ලෙස හැසිරවීම ට කුමන්ත්‍රණය කිරීම හා ආධාර හා අනුබල දීම සම්බන්ධයෙන් ඉහත සඳහන් පුද්ගලයන්ට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ මෙම නඩුව පවරන ලදී. මෙම අධිකරණය හමුවේ නඩුව විභාග වෙමින් පවතී.

සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව සේන යද්දෙහිගේ සහ එස්. තිනාමනි මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව/12639/19

2019 වර්ෂයේ දී, අභ්‍යන්තර වෙළඳාමට සහ එයට අනුබල දීමට එරෙහිව ආචාර්ය සේන යද්දෙහිගේ සහ එස්. තිනාමනි යන අයට දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනතේ 32 වගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලදී. මෙම නඩුව දැනට එකී අධිකරණයේ ඉදිරියේ පවතී.

චින්තක මෙන්ඩිස් එදිරිව නිහාල් රදැල්ල මහේස්ත්‍රාත් අධිකරණය /කොටුව/23337/22

1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනතේ 46අ(1) වගන්තියට පටහැනිව ක්‍රියා කරමින් විමර්ශනයක් අතරතුරදී ලබාගත් ප්‍රකාශ සටහන් කිරීමේදී ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබා දීමේදී අසත්‍ය හෝ නොමඟ යවන සුළු තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් නිහාල් රදැල්ල මහතාට එරෙහිව 2022 දී කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ නඩු පවරන ලදී. මෙම නඩුව දැනට එකී අධිකරණයේ ඉදිරියේ පවතී.

ඩබ්ලිව්.කේ.එච්. වැගපිටිය සහ තිලක් ද සිල්වා එදිරිව චින්තක මෙන්ඩිස් HCRA 28/22

කොමිෂන් සභාව විසින් ගොනු කරන ලද එක/කොටුව/16967/20 නඩුවේ උගත් මහේස්ත්‍රාත්තුමාගේ නියෝගයකට එරෙහිව එම නඩුවේ චූදිතයින් දෙදෙනෙකු විසින් ප්‍රතිශෝධන ඉල්ලීමක් ගොනු කරන ලදී.

සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට පක්ෂව තීන්දුව ලැබීමෙන් පසු පෙත්සම්කරුවන් අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර ඇත.

සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව රියාස් මොහොමඩ් සංගානි මහේස්ත්‍රාත් අධිකරණය කොටුව 28266/2023

විදුල්ලංකා පුද්ගලික සමාගමේ කොටස් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී එවකට 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනතේ 32(1) සහ 32(6) වගන්තිවලට පටහැනිව කටයුතු කිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් මසදී රියාස් මොහොමඩ් සංගානි යන අයට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නඩු පවරන ලදී. මෙම නඩුව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

චින්තක මෙන්ඩිස් එදිරිව ඩබ්ලිව්. ඊ. එම්. වීරසිංහ, ඊ. ඒ. ගුණවර්ධන, සහ එස්. එම්.ද ආර්. ගුණසේකර මහේස්ත්‍රාත් අධිකරණය /කොටුව 28328/23

1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනතේ 51(1)(අ) වගන්තිය සමග කියවිය යුතු 51(2) වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි, 2001 දෙසැම්බර් 18 දිනැති අංක 1215/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 රීතිය යටතේ වන වෙළඳපොළ කෘත්‍රිම ලෙස හැසිරවීම යන වරද සිදු කිරීම සම්බන්ධයෙන් ඩබ්ලිව්. ඊ. එම්. වීරසිංහ, ඊ. ඒ. ගුණවර්ධන, සහ එස්. එම්.ද ආර්. ගුණසේකර යන අයට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලදී. පාර්ශවයන්ට සිතාසි නිකුත් කිරීමට ඇත.

චින්තක මෙන්ඩිස් එදිරිව කේ. ඒ. එල්. ඩී. ලංකා කන්නන්ගර - මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව/28706/23

එවකට 1987 අංක 36 දරන (සංශෝධිත) ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 51(1)(අ) වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි, 2001 දෙසැම්බර් 18 දිනැති අංක 1215/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 රීතිය උල්ලංඝනය කරමින් වෙළඳපොළ කෘත්‍රිම ලෙස හැසිරවීම යන වරද සිදු කිරීම සම්බන්ධයෙන් චූදිතට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලදී. මෙම නඩුව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

චින්තක මෙන්ඩිස් එදිරිව එ. කේ. ඒ. එල්. ඩී. ලංකා කන්නන්ගර - මහේස්ත්‍රාත් අධිකරණය /කොටුව 28707/23

2001 දෙසැම්බර් 18 දිනැති අංක 1215/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 රීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කේ. ඒ. එල්. ඩී. ලංකා කන්නන්ගර මහතාට එරෙහිව 2023 වසරේ දී කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ දී නඩු පවරන ලදී. මෙම නඩුව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී. .

චින්තක මෙන්ඩිස් එදිරිව ගෝවින්දසාමි රමනන් සහ කනගරත්නම් නවීන්කනාත් මහතා මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව/28553/23

දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) සහ 102 වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනතෙහි 51(1)(අ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි, 2001 දෙසැම්බර් මස 18 වන දින දරන ඇති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 වන රීතියට පටහැනිව වෙළඳපොළ කෘත්‍රිම ලෙස හැසිරවීමට කුමන්ත්‍රණය කිරීම සහ ආධාර හා අනුබල දීම සම්බන්ධව ගෝවින්දසාමි රමනන් සහ කනගරත්නම් නවීන්කනාත් මහතාට එරෙහිව 2023 වසරේ දී කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ දී නඩු පවරන ලදී. මෙම නඩුව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

අනෙකුත් නඩු පැවරීම්

ඒෂියා සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම එදිරිව ඒෂියා කැපිටල් ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්ගලික) සහ තවත් අය (මහාධිකරණ(සිවිල්) 12/2023/IP)

පැමිණිලිකරු විසින් 1 වන විත්තිකරුට එරෙහිව මෙම නඩුව පවරන ලද අතර සුරාකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පාර්ශවයක් ලෙස නම්

උපායමාර්ගික අරමුණු 2

ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම

කළ නමුත් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව කිසිදු සහනයක් අයැද නොතිබුණි. පැමිණිලිකරු සහ පළමු විත්තිකරු අතර ඇති කරගත් සමඵයෙන් පසු නඩුව අවසන් විය.

ටලිබ් ටෆ්ලක් අල් නකිබ් එදිරිව කොළඹ කොටස් හුවමාරුව සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව (WP/HCCA/LA/COL/158/17 (LA), DC Case No: DSP/20/2016)

පැමිණිලිකරු (දැනට මියගොස් ඇත) 14% ක කොටස් හිමියෙකු වන හන්ටර් සහ සමාගමට 1982 අංක 17 දරන සමාගම් පනතේ අනිවාර්යය ප්‍රතිපාදන උල්ලංඝනය කරමින් හිත් සහ සමාගම විසින් සිදුකළ කොටස් නිකුතුවකින් සිදුවන බලපෑම පිළිබඳ විමර්ශනය කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන් කොළඹ කොටස් හුවමාරුව සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව පැමිණිලිකරු මෙම නඩුව පවරා ඇත. 2017 ඔක්තෝම්බර් මස 26 වන දිනැති නියෝගය මඟින් එම නඩුව ඇසීමට දිසා අධිකරණයට අධිකරණ බලයක් නොමැති බවට වන පදනමින් නඩුව නිෂ්ප්‍රභා කරන ලද අතර පැමිණිලිකරු විසින් බස්නාහිර පළාතේ සිවිල් අභියාචනා මහාධිකරණයට අභියාචනයට අවසර ඉල්ලා නඩු පවරා ඇත. එම නඩුව එම අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

කැපිටල් ට්‍රස්ට් හෝල්ඩින්ස් සහ තුෂාන් හර්ෂ මෙන්ඩිස් වික්‍රමසිංහ එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ නීතිපති (CA (W) 465/2022)

මෙම නඩුවේ දෙවන පෙත්සම්කරු සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතින්හි 12 වන රීතිය උල්ලංඝනය කර ඇති බවට සහ ඔහුට එරෙහිව අපරාධය නඩුවක් ගොනු කිරීමට තීරණය කිරීමට එරෙහිව කොමිෂන් සභාව විසින් සර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලමින් පෙත්සම්කරුවන් විසින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව රිට් අයදුම්පතක් ගොනු කර ඇත.

වසර තුළදී අභියාචනාධිකරණය විසින් 2 වැනි පෙත්සම්කරුට එරෙහිව අපරාධ නඩු පැවරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගනු ලැබූ තීරණය සහ එහි නඩුකර පැවරීමේ දැන්වීම අවලංගු කරමින් තීන්දුවක් ප්‍රකාශයට පත් කරන ලදී.

රියාස් මොහොමඩ් සංගානි එදිරිව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ තවත් අය (CA (W) 301/2023)

පෙත්සම්කරු විසින් සිදු කරන ලද වැරදි හතරක් සමඵයකට පත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් නියම කරන ලද මුදලේ ප්‍රමාණය අභියෝගයට ලක් කරමින් පෙත්සම්කරු විසින් අයදුම්පතක් ගොනු කර,

- පෙත්සම්කරු විසින් උපයන ලද ඕනෑම ලාභයකට සමානුපාතික සහ සාධාරණ වටිනාකමකට පෙත්සම්කරුගේ ක්‍රියාවන් හතර සමඵයකට පත් කිරීමට; සහ
- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පෙත්සම්කරුට එරෙහි නඩුව සමඵ කිරීමට ගත් තීරණය සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් ප්‍රකාශයට පත් නොකිරීමට

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට වෙනත් ආකාරයකින් මෙහෙයවන සහ/හෝ බල කරමින් අභියාචනාධිකරණයෙන් මැන්ඩමස් රිට් ආඥාවක් ඉල්ලා සිට ඇත. මෙම නඩුව අභියාචනාධිකරණය හමුවේ විභාග වෙමින් පවතී.

රියාස් මොහොමඩ් සංගානි එදිරිව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ තවත් අය (CA (W) 797/2023)

පෙත්සම්කරු විසින් ඔහුගේ අභියාචනාධිකරණ රිට් අයදුම්පත් අංක 301/2023 සම්බන්ධයෙන් අභියාචනාධිකරණය හමුවේ ඉහත අයදුම්පත්‍රය ගොනු කළේ, අනෙකුත් කරුණු අතර, වැරදි හතර සමඵයට පත් කිරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පෙර ගත් තීරණය ඉල්ලා අස්කර ගැනීමට ගත් තීරණය අවලංගු කරන ලෙස සර්ටියෝරාරි ආඥාවක් ඉල්ලා සිටීමින් සහ පෙත්සම්කරුට එරෙහිව නඩු කටයුතු පවත්වාගෙන යාමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ගත් තීරණය අවලංගු කිරීම සඳහා වේ. පෙත්සම්කරු විසින් ලබා ගන්නා ලද ඕනෑම ලාභයකට සමානුපාතික සහ සාධාරණ මුදලකට පෙත්සම්කරුගේ ක්‍රියාවන් හතර සමඵයට පත් කිරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට බල කිරීම සඳහා මැන්ඩමුස් රිට් ආඥාවක්ද ඉල්ලා ඇත. මෙම නඩුව අධිකරණය හමුවේ විභාග වෙමින් පවතී.

රිදිස් ගබ්බර් එදිරිව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ තවත් අය (CA (W) 444/2023

1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ (සංශෝධිත) 51 (3) වගන්තිය ප්‍රකාරව 1995 සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහයේ (සංශෝධිත) 30(1) රීතිය උල්ලංඝනය කරමින් සමාගමේ හැසිරීම සම්බන්ධයෙන් ලැයිස්තුගත පොදු සමාගමක අධ්‍යක්ෂවරයෙකු ලෙස තමාට නිකුත් කර ඇති නඩු පැවරීමේ දැන්වීම අවලංගු කරන ලෙස ඉල්ලා මෙම රිට් අයදුම්පත ගොනු කර ඇත.

මෙම නඩුවේ නවතම තත්ත්වය අනුව, ඉහත කී උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් පොදු ලැයිස්තුගත සමාගමට එරෙහිව කටයුතු නොකිරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ගත් තීරණය සැලකිල්ලට ගනිමින්, පෙත්සම්කරු විසින් ඔහු විසින් ගොනු කරන ලද රිට් අයදුම්පත ඉල්ලා අස්කර ගන්නා ලදී.

නාගරික සංවර්ධන අධිකාරිය (UDA) එදිරිව ඕනාලි හෝල්ඩින්ග්ස් පී එල් සී (රූක (සිවිල්)/11/2021/CO)

ඕ'නාලි හෝල්ඩිංග්ස් පීඑල්සී හි ඡන්ද අයිතියෙන් 5% කට නොඅඩු කොටස් හිමි කොටස් හිමියෙකු වන නාගරික සංවර්ධන අධිකාරිය (UDA), සමාගම් පනතේ 225 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේම 226, 520 සහ 521 වගන්ති ප්‍රකාරව යටතේ ලංකා රියැලිටි ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී විසින් කොටස් හිමිකාරීත්වය හරහා සිදු වූ සමාගමේ පාලනයේ ප්‍රමාණාත්මක වෙනසක් මගින් ඕ'නාලි හෝල්ඩිංග්ස් පීඑල්සී හි කටයුතු සමාගමේ අවශ්‍යතාවලට අගතියක් වන අයුරින් ඕ'නාලි හෝල්ඩිංග්ස් පීඑල්සී අනිවාර්ය අර්පනයක් මගින් පවරා ගැනීමට එරෙහිව ඕ'නාලි හෝල්ඩිංග්ස් පීඑල්සී සමාගමට නඩු පවරන ලදී. නාගරික සංවර්ධන අධිකාරිය (UDA), විසින් පිළිවෙලින් ඕ'නාලි හෝල්ඩිංග්ස් පීඑල්සී ලංකා රියැලිටි ඉන්වෙස්ට්මන්ට් පීඑල්සී, රේණුකා කැපිටල් පීඑල්සී හි, පී.ඩබ්ලිව් කෝපරේටිස් සෙකුරිටීරියල් (ප්‍රයිවෙට්) ලිමිටඩ්, කොළඹ කොටස් වෙළඳපොළ පළමු සිට පස්වන වගඋත්තරකරුවන් ලෙස දක්වා ඇති අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හයවන වගඋත්තරකරු ලෙස දක්වා ඇත. මෙම නඩුව 2023 දෙසැම්බර් 31 දිනට විභාග වෙමින් පවතී

සේන යද්දෙහිගේ එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව (CA/ Writ/417/2017)

සේන යද්දෙහිගේ එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව (SC/SPL/LA 100/19) (මෙම නඩු දෙකම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව සේන යද්දෙහිගේ සහ එස්. තිනාමනි, MC/Fort/12639/19 නඩුවට සම්බන්ධිත නඩු වේ.)

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ආචාර්ය සේන යද්දෙහිගේ සහ සුබ්‍රමනියම් තිනමනි මහතාට එරෙහිව අභ්‍යන්තර තැනැත්තන් විසින් ගණුදෙනු කිරීම සම්බන්ධයෙන් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ ගොනු කළ නඩුකරයට ප්‍රතිචාර වශයෙන් පළමු විත්තිකරු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව අභියාචනාධිකරණය හමුවේ රිට් පෙත්සමක් ගොනුකර වෙනත් කරුණු අතර මහේස්ත්‍රාත් අධිකරණයේ සිදුකෙරෙන නඩු කටයුතු අත්හිටුවන ලෙස ඉල්ලා සිටියේය. අභියාචනාධිකරණය නියෝගයක් නිකුත් කරමින් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු අත්හිටුවීම ප්‍රතික්ෂේප කළ අතර නොතීසි නිකුත් කිරීම සම්බන්ධයෙන් ලිඛිත දේශන ගොනු කරන ලෙස ඉල්ලා සිටින ලදී. ඉන් අනතුර වූදිත විසින් අභියාචනාධිකරණයට ලබාදුන් එකී නියෝගය අභියෝගයට ලක්කරමින් අභියාචනයට ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළේය. ශ්‍රේෂ්ඨාධිකරණය පෙත්සම්කරුගේ එම ඉල්ලීමට අවසර මෙම නඩුව විභාගයට නියම කර ඇත.

ෂෝ වොලස් ඉන්වෙස්ට්මන්ට්ස් පී එල් සී සහ ගමිනිද්‍ර රාජසියා එදිරිව ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, චින්තක මෙන්ඩිස් සහ තවත් හතර දෙනෙක් – CA Writ 460/2023.

පෙත්සම්කරුවන් විසින් වෙනත් කරුණු අතර 1 වැනි වගඋත්තරකරු විසින් නිකුත් කර ඇති ''නඩු පැවරීම පිළිබඳ දැන්වීම'' ට එරෙහිව සර්ශියොරාරි ආඥාවක් ලබා ගැනීම සඳහා සහ 1 වැනි වගඋත්තරකරු සහ/හෝ 2 වැනි වගඋත්තරකරු සහ/හෝ 3 වැනි වගඋත්තරකරු පෙත්සම්කරුවන්ට එරෙහිව අපරාධ හෝ වෙනත් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම වළක්වන තහනම් නියෝගයක් ගොනු කර ඇත. නඩුව අධිකරණය හමුවේ විභාග වෙමින් පවතී.

නඩු අංකය: SC (SPL) LA අයදුම්පත අංක.177/2020

පෙත්සම්කාර සමාගම වන පන්චලිංගම් ඇසෝසියේට් ප්‍රයිවට් ලිමිටඩ් විසින් හැටන් නැෂනල් බෑන්ක් පී එල් සී සමාගම සතු කොටස් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ඇතැම් උපදෙස්වලට එරෙහිව රිට් අයදුම්පතක් ගොනු කරන ලද අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉහත කී උපදෙස් පසෙකට දැමීමට හැටන් නැෂනල් බැන්ක් පී එල් සී උත්සාහ කරයි. මුදල් මණ්ඩලය, මහ බැංකුවේ අධිපතිවරයා, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සහ සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඇතුළු තවත් සිව් දෙනෙකු වගඋත්තරකරුවන් ලෙස දක්වා ඇත. අභියාචනාධිකරණය විසින් රිට් ආඥාවක් ලබා දීම ප්‍රතික්ෂේප කිරීම මත, පෙත්සම්කාර සමාගම ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කිරීමට විශේෂ අවසරයක් ගොනු කර ඇත. සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් කිසිදු සහනයක් ඉල්ලා නැත. මෙම කාරණය ශේෂ්ඨාධිකරණය හමුවේ විභාග වෙමින් පවතී.

එම්.ඒ.සී.ඊ. මන්ත්‍රීරත්න එදිරිව සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ තවත් 14 දෙනෙකු CA (Writ) 148/2021

සේවකයෙකුට උසස්වීමක් ලබා දීමට සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගනු ලැබූ තීරණයක් අවලංගු කරන ලෙස ඉල්ලා පෙත්සම්කරු අභියාචනාධිකරණය හමුවේ සර්ටියෝරාරි සහ මැන්ඩමස්ගේ රිට් ආඥාවක් ඉල්ලා සිටියේය. ඒ වෙනුවට පෙත්සම්කරු උසස් කිරීම; නැතහොත් දැනටමත් කළමනාකරු තනතුරට පත් කර ඇති සේවකයාට ඉහළින් පෙත්සම්කරු පත් කිරීම මගින් පෙත්සම්කරු කළමනාකරු තනතුරට උසස් කිරීම විකල්පයක් ලෙස ඉල්ලා සිටින ලදී. සළකා බලන වසර තුළ ඇය සුරුකුම්පත් විනිමය කොමිෂන් සභාවේ රැකියාවෙන් ඉවත්වීම හේතුවෙන් පෙත්සම්කාරිය විසින් නඩුව ඉල්ලා අස්කර ගන්නා ලදී.

විමර්ශන, නිරීක්ෂණ, අධීක්ෂණ සොයාගැනීම් ආදිය මත පදනම්ව, කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ මඟ පෙන්වීම සහ තීරණය කිරීම් මත ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලාත්මක කිරීමේ ක්‍රියා මාර්ගයන් ගනු ලැබේ.

ඉංජිනේරු ගරු ජී. කපිල රේණුක පෙරේරා එදිරිව. නීතිපති සහ තවත් 32 SCFR 182/2021

පෙත්සම්කරු විසින් සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව (7 වැනි වගඋත්තරකරු ලෙස දක්වා ඇත) ඇතුළු තවත් 32 දෙනෙකුට එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති පෙත්සම්කරුගේ (ශ්‍රී ලංකාවේ අනෙකුත් සියලුම පුරවැසියන් ද ඇතුළුව) මූලික අයිතිවාසිකම්වලින් එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් උල්ලංඝනය කිරීම සම්බන්ධව ශේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් අයදුම්පතක් ගොනු කර ඇත. පෙත්සම්කරු විසින් 2020 මාර්තු 06 දිනැති සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් ශූන්‍ය වීම සම්බන්ධයෙන් (රාජ්‍ය සතු ආගන්තුක සත්කාර ආයෝජන කළඹ, සුදුසු ප්‍රතිව්‍යුහගත කිරීම් තුළින් ප්‍රශස්ත කාර්ය සාධන මට්ටමට පරිවර්තනය කිරීමේ මූලික අරමුණ ඇති නව රාජ්‍ය දේපළ සංවර්ධන සමාගමක් වන) ස්ථාපිත කරන ලද කැබිනට් තීරණය ප්‍රකාශ කරන ලෙස ඉල්ලා ඇත. සමාගමේ 100% ක් මහා භාණ්ඩාගාරය සතුය. සීමාසහිත සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට් සමාගම කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීම සඳහා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට අවසර දීම වැළැක්වීම සඳහා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් අතුරු නියෝගයක් ඉල්ලා ඇත. මෙම කාරණය ශේෂ්ඨාධිකරණය හමුවේ විභාග වෙමින් පවතී.

2023 ඔක්තෝම්බර් මාසයේදී පෙත්සම්කරුගේ නීතීඥවරයා අධිකරණයට දන්වා සිටියේ සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් අවලංගු කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇති බවත් එය අවසන් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට වැඩිදුර උපදෙස් ලැබී ඇති බවත්ය. එබැවින් මෙම කරුණ ඉල්ලා අස්කර ගන්නා බව පෙත්සම්කරුගේ නීතීඥවරයා අධිකරණයට දන්වා සිටියේය. ඒ අනුව මෙම පෙත්සම ඉල්ලා අස්කර ගැනීමට වගඋත්තරකරුවන්ගෙන් විරෝධතාවක් නොතිබූ බැවින් එම පෙත්සම ඉල්ලා අස්කර ගැනීමට අධිකරණය අවසර ලබා දුන්නේය.

පැමිණිලිවලට විසඳුම් යෙදීමේ ක්‍රමය

ලයිස්තුගත සමාගම්වලට අදාළව ලැබී ඇති පැමිණිලි සහ ලබා දී ඇති විසඳුම්වල තත්ත්වය පහත දක්වා ඇත. (සංඛ්‍යා සටහන 13)

සංඛ්‍යා සටහන 13: ලයිස්තුගත සමාගම්වලට අදාළ පැමිණිලි සහ කරුණු හැසිරවීම

පැමිණිල්ලේ ස්වභාවය	අවධානය යොමුකර ඇති පැමිණිලි සංඛ්‍යාව	ගන්නා ලද පියවර/ වර්තමාන තත්ත්වය
ලයිස්තුගත සමාගම්වල අධ්‍යක්ෂක මණ්ඩලයේ හැසිරීම	3	කරුණු 03ක් සුදුසු පරිදි අවසන් කර ඇත.
ලයිස්තුගත සමාගම්වල හැසිරීම්	11	කරුණු 09ක් සුදුසු පරිදි අවසන් කර ඇත/ ඉතිරි කරුණු දෙක විභාග වෙමින් පවතී.
සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවලට / කොළඹ කොටස් හුවමාරුවේ ලයිස්තුගත කිරීමේ නීති අනුකූල නොවීම	6	කරුණු 05ක් සුදුසු පරිදි අවසන් කර ඇත/ ඉතිරි කරුණ තවම විභාග වෙමින් පවතී
අනෙකුත් පරිපාලන කරුණු	5	කරුණු 05 සුදුසු පරිදි අවසන් කර ඇත.
අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුව සමඟ අනුගත නොවීම	4	කරුණු 04 සුදුසු පරිදි අවසන් කර ඇත.
මුළු කරුණු සංඛ්‍යාව	29	

උපායමාර්ගික අරමුණු 2

ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම

ව්‍යවස්ථාපිත අරමුදල්

සෙස් අරමුදල

1991 අංක 26, 2003, අංක18, 2009 අංක 47 දරන පනත් මගින් සංශෝධිත 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 14 බී යන වගන්තිය යටතේ මූලිකව පිහිටුවන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ (සෙස් අරමුදල) 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ අංක 156 (1) වගන්තිය මගින් අවලංගු කර ප්‍රතිස්ථාපනය කරන ලදී.

2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 155 (1) සහ (2) සහ 156 (1), (2) සහ (3) යන වගන්තිවලට අනුව සෙස් අරමුදලේ ක්‍රියාකාරීත්වය සහ අරමුණු පහත ආකාරයෙන් සඳහන් කොට ඇත.

155 (1) බලපත්‍රලාභී කොටස් හුවමාරුවක සටහන් වී ඇති හෝ එහි නීතිරීති යටතේ දැනුම් දෙන ලද ගැනුම්කරු සහ විකුණුම්කරු යන දෙදෙනාම විසින් සිදුකරනු ලබන සෑම සුරැකුම්පත් මිලදී ගැනීමක් සහ විකිණීමක් සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ පලකරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන අනුපාතයකට අනුව වූ සෙස් බද්දක් නියම කිරීම, අයකිරීම හා ගෙවීම් කිරීම සිදු කළ යුතුය. විවිධ වත්කම් පන්ති වෙනුවෙන් විවිධ අයකිරීමේ අනුපාතයන් පැනවීමට ඉඩ ඇත.

(2) මෙම වගන්තිය යටතේ පනවන සෙස් බද්ද වෙනත් ඕනෑම ලිඛිත නීතියක් යටතේ අය කරනු ලබන වෙනත් යම් බද්දකට හෝ සෙස් බද්දකටඅමතරව විය යුතුය.

156 (1) සෙස් බදු අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු වන අතර 156 වගන්තිය යටතේ අයකරනු ලබන සෙස් බදු අරමුදල් එම සෙස් බදු අරමුදලට බැර කල යුතුය.

(2) කොමිෂන් සභාව අනුමත කරන්නා වූ මුදල් ප්‍රමාණයන් උපයෝගී කරගෙන සෙස් බදු අරමුදලේ බැරට ඇතිමුදල් පහත දැක්වෙන කාර්ය සඳහා පමණක් භාවිතා කරනු ලැබිය යුතුය.

(අ) සුරැකුම්පත් වෙළෙඳපොළ දියුණු කිරීම;

(ආ) මේ කොටස යටතේ පිහිටු වනු ලබන වන්දි අරමුදලේ හෝ කොමිෂන් සභාවේ අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම.

(ඇ) එහි කාර්යය සහ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේදී, සහ ඉටු කිරීමේදී කොමිෂන් සභාව කළමනාකරණය, පරිපාලනය සහ මෙහෙයවීම සඳහා කොමිෂන් සභාව විසින් දරනු ලබන සියළු වියදම් පියවා ගැනීම;

(ඈ) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සළකනු ලබන පරිදි කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට නිවාසට අධ්‍යාපනික, සෞඛ්‍ය සහ ප්‍රවාහන යන කාර්යය සඳහා ණය ලබාදීම.

(ඉ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහ එහි නිළධරයන්ගේ සහ සේවකයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සහ නාමිකයන්ගේ ප්‍රතිලාභය සඳහා පිහිටුවනු ලබන විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් සහ අනෙකුත් යෝජනා ක්‍රමවලට දායක මුදල් ගෙවීම; සහ

(ඊ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන පිරිදි යෝග්‍යතාවය පෙන්නුම් කර ඇති කොමිෂන් සභාවේ නිළධරයන් සහ සේවකයන් විසින් ශ්‍රී ලංකාව තුළදී හෝ විදේශීය රටකදී නිරත වනු ලබන අධ්‍යයනයන්ට අදාළ වියදම් පියවීම.

(3) සෙස් බදු අරමුදල දියුණු කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින්, සෙස් බදු අරමුදලේ බැරට ඇති යම් අතිරික්ත මුදලක් කොමිෂන් සභාව විසින් ආයෝජනය කරනු ලැබිය හැකිය.

හිමිකම් සුරැකුම්පත් සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සෙස් බද්ද

කොළඹ කොටස් වෙළෙඳපොළ මාර්ගෝපදේශයන්ට අනුව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් හිමිකම් සුරැකුම්පත් සඳහා අය කරන ලද සෙස් බද්ද දෙවන වරටත් 2010 අගෝස්තු 1 දින සිට බලපැවැත්වෙන පරිදි එක් ගනුදෙනුවකට 0.09% සිට 0.072% දක්වා අඩු කර ඇත. නැවත අඩු කිරීම 2003 දෙසැම්බර් 1 දින සිට ක්‍රියාත්මකවූ අතර ඒ අනුව ගනුදෙනුවකට අදාළ සෙස් බද්ද 0.1% සිට 0.09% දක්වා අඩු ලරන ලදී.

තවද, 2017 ජූනි 27 දින සිට බලපැවැත්වෙන පරිදි එම ගනුදෙනු පරාසය රු. මිලියන 100ක් දක්වා වන ගනුදෙනුවලට අදාළ වන ලෙස වෙනස් විය. මීට පෙර එය පැවතියේ, 2011 ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි රුපියල් මිලියන 50 ක් හා රුපියල් මිලියන 50 ට වඩා වැඩි වටිනාකමකින් යුත් ගනුදෙනු ලෙස වන අතර අයකරනු ලැබූ සෙස් බද්ද පිළිවෙලින් 0.072%ක, හා 0.045% ක විය. අනතුරුව , 2017 ජූනි 27න් පසුව රු.මිලියන 100ක් දක්වා සහ රු. මිලියන 100 ට වඩා වැඩි වටිනාකමකින් යුත් ගනුදෙනු පරාසයන් සඳහා අයකරනු ලබන සෙස් බද්ද පිළිවෙලින් 0.072%ක, හා 0.045% ක විය.

මීට අමතරව, ගනුදෙනුකරුවෙකු විසින් එකම තැරැව්කරුවකු හරහා එකම සුරැකුම්පත (හෝ ඊට පටහැනිව) මිලදී ගෙන විකුණන එක්දින දින වෙළෙඳාමේදී සුරැකුම්පත්විනිමය කොමිෂන් සභාවට ගෙවිය යුතු ගනුදෙනු ගාස්තුව 2006 පෙබරවාරි 15 සිට බලපැවැත්වෙන පරිදි ගනුදෙනුවේ එක් පැත්තකින් අය නොකෙරේ.

මිලදී ගත් මුළු කොටස් ප්‍රමාණය විකුණන ලද මුළු කොටස් ප්‍රමාණයට සමාන නොවන්නේ නම්, ඉහත විස්තර කර ඇති පරිදි ගනුදෙනු ගාස්තු මිලදී ගත් හෝ විකුණන ලද අඩු කොටස් ප්‍රමාණයෙන් අය නොකෙරේ. මිලදී ගත් මුළු ප්‍රමාණය විකුණන ලද මුළු ප්‍රමාණයට සමාන වන අවස්ථාවක දී, විකුණුම් ගනුදෙනුවෙන් ගාස්තු අය නොකෙරේ. එසේම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ගනුදෙනු ගාස්තුවෙන් නිදහස් කිරීම තීරණය කිරීම සඳහා එකම සුරැකුම්පත මත ගනුදෙනුකරුවෙකුගේ මුළු මිලදී ගැනීම් සහ විකිණීම් සලකා බලනු ඇත. කෙසේ වෙතත්, ගණුදෙනු වල දෙපැත්තෙන්ම 0.30% ක රජයේ කොටස් ගනුදෙනු බද්ද අය කෙරේ.

සෙස් අරමුදලේ හැසිරීම


වන්දි අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 වර්ෂයේදී සෙස් අරමුදලින් රුපියල් මිලියන 50ක් එයට බැර කරන ලදී. එමෙන්ම 2009 සහ 2010 වසරවලදී වසරකට රු.මි. 50 බැගින් සෙස් අරමුදලින් රුපියල් මිලියන 100ක් පියවීම් සහතික කිරීමේ අරමුදලට පවරන ලදී.

තවද රු.මිලියන 276ක්, රු.මිලියන 380ක්, රු.මිලියන 94ක්, රු.මිලියන 52ක් හා රු. මිලියන 312ක් වශයෙන් අවස්ථා 5 දී පිළිවෙලින් 2010, 2012, 2013, 2019 හා 2020යන වර්ෂයන්හි දී ඒකාබද්ද අරමුදලට බැර කරන ලදී.

2023 දෙසැම්බර් 31 දින වන විට සෙස් අරමුදලට බැර වී ඇති ශේෂය රුපියල් මිලියන 5,237.8/- ක් වන අතර එයින් රු. මිලියන 2,962.3ක් මාස දොළහක් තුළ කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කරවල ද රු. මි. 2,181.8ක් භාණ්ඩාගාර බිල්පත්වල ද ආයෝජනය කර ඇති අතර රු.මිලියන 51.9 ක් සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීම්හී (REPO) ආයෝජනය කර ඇත.

2014 වසරේ සිට 2023 වසර දක්වා සෙස් අරමුදලෙහි වෙනස්වීම පහත රූප සටහන මගින් පෙන්නුම් කෙරේ. (රූප සටහන 06)

රූප සටහන 06: සෙස් අරමුදල





මූල්‍ය සහ පරිපාලන කණ්ඩායම

වන්දි අරමුදල

වර්ෂ 1987 දී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීමත් සමඟම වන්දි අරමුදල ක්‍රියාත්මක විය. 2021 සැප්තැම්බර් 20 වන දින සිට බලපැවැත්වෙන පරිදි 2021 අංක19 දරණ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ (නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ) 158 වන වගන්තිය යටතේ වන්දි අරමුදලක් පිහිටුවීම හා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 158 සහ 159 වන වගන්තිවලට අනුව වන්දි අරමුදල පවත්වාගෙන යාමේ අරමුණු සහ මාර්ගෝපදේශ පහත පරිදි වේ.

158. (1) බලපත්‍රලාභී කොටස් තරුවිකරුවෙකු හෝ බලපත්‍රලාභී කොටස් වෙළෙන්දෙකු සිය ගිවිසුම්ගත වගකීම් ඉටු කිරීමට අසමත්වීම හේතුකොටගෙන මුදල් හානියකට භාජනය වන යම් ආයෝජකයකුට වන්දි ප්‍රදානය කිරීම සඳහා මෙම වන්දි අරමුදල පිහිටුවන ලදී.

(2) එම වන්දි අරමුදල සමන්විත වන්නේ;

(අ) වන්දි අරමුදලෙහි කාර්යය සඳහා පර්ලිමේන්තුව විසින් සම්මත කෙරුණු මුදල්.

(ආ) මෙම පනතේ විධිවිධාන යටතේ අරමුදලට බැර කළ හැකි මුදල්; හා

(ඇ) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පරිදි සෙස් අරමුදලෙන් බැර කළ හැකි මුදල්.

(3) වන්දි අරමුදලෙහි බැරට ඇති මුදල්, කොමිෂන් සභාව තීරණය කරනු ලබන ආකාරයකට කොමිෂන් සභාව විසින් ආයෝජනය කළ හැකිය.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 159 වගන්තියට අනුව, අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරින් තිදෙනෙකු වන්දි කමිටුවේ සාමාජිකයන් ලෙස පත් කළ යුතුය.

පත් කරන ලද කමිටුව යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වන්දි තක්සේරු කිරීම හා ප්‍රදානය කිරීම පිළිබඳ වගකීම දැරිය යුතු අතර එවැනි තක්සේරු කිරීමක් සම්බන්ධයෙන් කමිටුව විසින් ගනු ලබන තීරණය අවසානතීරණය මෙන්ම මෙම පනතේ අරමුණු සඳහා තීරණාත්මක වේ.

වන්දි සඳහා ඉල්ලුම් කිරීමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් පනතේ විධි විධාන සලසා ඇත. පනත අනුව ඉල්ලුම්කරුවෙකු විසින් හිමිකම් පෑමට සහාය වන පරිදි ඉදිරිපත් කරන ලද ලේඛන සහ වෙනත් සාක්ෂි පරීක්ෂා කිරීමෙන් පසු හෝ එවැනි නඩු විභාගයක නිගමනය පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වූ ඕනෑම අවස්ථාවක කමිටුව විසින් වන්දි සඳහා වූ එම ඉල්ලීමට අවසරදීම හෝ නොදීමට ඉඩ ඇත. වන්දි අරමුදල සඳහා හිමිකම් ඉල්ලීමක් මේ දක්වා ලැබී නොමැත.

වන්දි අරමුදලෙහි හැසිරීම

වන්දි අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 වර්ෂයේදී සෙස් අරමුදලින් රුපියල් මිලියන 50ක් වන්දි අරමුදලටබැරකරන ලදී.


2023 වර්ෂය අවසානය වන විට වන්දි අරමුදලේ ශේෂය රුපියල් මිලියන 687.5 ක් වූ අතර එයින් රු. මිලියන 369.4 රුපියල් මිලියන 316.3 ක් මාස දොළහකින් කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කරවල ද මාස 12 කට පසු කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත්වල ද ආයෝජනය කර ඇති අතර රු මිලියන 1.2 ක් සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීම්වල (REPO) ආයෝජනය කර ඇත.

2014 සිට 2023 දක්වා කාලය තුළ වන්දි අරමුදලේ සංචලන පහත දැක්වේ.
(රූප සටහන 07)

උපායමාර්ගික අරමුණු 2

ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම

රූප සටහන: 07 වන්දි අරමුදල



මෙම පියවීම් සහතික කිරීමේ අරමුදල 1998 මැයි මස 22 ආරම්භ කරන ලදී. මෙම අරමුදල පිහිටුවන ලද්දේ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි සහභාගීකරුවන් අතර ගනුදෙනු පියවීම සහතික කිරීමේ අරමුණ ඇතිවය. මෙම පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි ක්‍රියාකාරීත්වය පහත සඳහන් පරිදි විස්තර කළ හැකිය.

පියවීම් සහතික කිරීමේ අරමුදල (SGF)

මෙම පියවීම් සහතික කිරීමේ අරමුදල 1998 මැයි මස 22 ආරම්භ කරන ලදී. මෙම අරමුදල පිහිටුවන ලද්දේ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි සහභාගීකරුවන් අතර ගනුදෙනු පියවීම සහතික කිරීමේ අරමුණ ඇතිවය. මෙම පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි ක්‍රියාකාරීත්වය පහත සඳහන් පරිදි විස්තර කළ හැකිය.


- කොටස් ගනුදෙනුවක් වූ සැණින් ප්‍රමාදයකින් තොරව කොටස් අයිතිය මාරු විය යුතුය. 2007 දෙසැම්බර් 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් බේරුම් කිරීම කාල සීමාව ඒකීය තලයකට ගෙන එන ලදී, එනම් ගැනුම්කරු විසින් T+3 පදනම මත එනම් ගනුදෙනුව සිදු කළ දින ද ඇතුළුව එළඹෙන සිව්වන දිනයේදී අදාළ ගෙවීම් සිදු කළ යුතු අතර විකුණුම්කරුට T+3 පදනම මත එනම් ගනුදෙනුව සිදු කළ දින ද ඇතුළුව එළඹෙන සිව්වන දිනයේදී අදාළ ගෙවීම් පියවීම සිදු කරනු ලැබේ. කෙසේ වෙතත් කොටස් අයිතිය පැවරීම සහ සත්‍ය ලෙස මුදල් ලැබීම අතර සාපේක්ෂ වශයෙන් දිගු අතරමැදි කාලයක් පැවතීම හේතුවෙන් සුරක්ෂිත නොවනපියවීම් අවදානමක් ඇතිවන නිසා මෙම අරමුදල පිහිටුවීමේ අවශ්‍යතාව ඇතිවිය.
- මෙම අරමුදලේ භාරකරුවන් නිළ බලයෙන් ඊට පත් වන අතර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති, කොළඹ කොටස් හුවමාරුවෙහි සභාපති, මහා භාණ්ඩාගාරයෙහි නියෝජ්‍ය ලේකම්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සහ කොළඹ කොටස් හුවමාරුවෙහි ප්‍රධාන විධායක නිලධාරියන අය ඊට ඇතුළත් වේ.
- ශ්‍රී ලංකා රජය මෙම අරමුදල ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 50ක මුදලක් ප්‍රදානය කර ඇත. මෙම අරමුදල භාර ඔප්පුව ප්‍රකාරව රජයේ සුරැකුම්පත්වල සහ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇත. මෙම අරමුදලට ප්‍රතිපූරක වශයෙන් පරිත්‍යාග තෑගි සහ ප්‍රදානයක් ලබාගත හැකි වේ. වර්තමානයේදී කොටස් තැරැව්කරුවන් සහ භාරකාර බැංකු මෙම අරමුදලට දායකවීමෙහි අවශ්‍යතාවක් නොමැත.
- කෙසේ වෙතත්, පියවීම් සහතික කිරීමේ අරමුදල, පියවීම් අවදානම ඉවත් කිරීම සඳහා නියමාකාරයෙන් කටයුතු කිරීමට ප්‍රමාණවත් නොවන බැවින් ඊට පිළියමක් ලෙස මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනයක් ස්ථාපනය කිරීම සඳහා පියවර ගෙන තිබේ. පියවීම් සහතික කිරීමේ අරමුදල සඳහා හිමිකම් ඉල්ලීමක් මේ දක්වා ලැබීනොමැත.

පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි හැසිරීම

අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 සහ 2010 වර්ෂයන්හිදී රුපියල් මිලියන 50 බැගින් වූ සමාන ප්‍රමාණ දෙකකින් රු. මිලියන 100 ක් සෙස් අරමුදලෙන් පියවීම් සහතික කිරීමේ අරමුදලට බැර කරන ලදී. පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි භාර ඔප්පුව වෙනස් කිරීමෙන් අනතුරුව 2012 ජනවාරි මාසයේදී කොළඹ කොටස් හුවමාරුව විසින් ද අරමුදල ශක්තිමත් කිරීම සඳහා රුපියල් මිලියන 100 ක් ලබා දෙන ලදී.

2023 දෙසැම්බර් අවසානය වන විට පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි ශේෂය රුපියල් මිලියන 1,279.2 ක් වූ අතර එයින් රු. මිලියන 90.6 ක් මාස දොළහකින් කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර වලද රුපියල් මිලියන 1146.6 ක් භාණ්ඩාගාර බිල්පත් වල ද ආයෝජනය කර ඇති අතර රු. මිලියන 3.2 ක් සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීම්වල ද ආයෝජනය කර ඇත. 2014 සහ 2023 කාලය තුළ පියවීම් සහතික කිරීමේ අරමුදලේ සංචලනය පහත දැක්වෙන ප්‍රස්ථාරයේ දක්වා ඇත. (රූප සටහන 08)

රූප සටහන: 08 පියවීම් සහතික කිරීමේ අරමුදල



උපායමාර්ගික අරමුණු 3

ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනයට අනුබලදීම

නව නිෂ්පාදන. සේවා සහ වෙළෙඳපොළ යටිතල පහසුකම් හඳුන්වා දීමෙන් සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය කිරීම සහ පුළුල් කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තිරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. වෙළෙඳපොළ ද්‍රවශීලතාවය වැඩිදියුණු කිරීම, නවීන මූල්‍ය උපකරණ හඳුන්වාදීම සහ නව ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා මුල පිරීම් මෙයට ඇතුළත් වේ.

ඵලදායි හා කාර්යක්ෂම ප්‍රාග්ධන වෙළෙඳපොළ යාන්ත්‍රණයක් ආයෝජකයින් සහ කොටස් නිකුතු ආයතන යන දෙපාර්ශ්වයටම ආර්ථිකයේ වර්ධනය සඳහා සම්පත් යොමු කරන අවස්ථා සහිත සාධාරණ වාතාවරණයක් සපයයි.

සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය පුරාම නිසි ශක්‍යතා අධ්‍යයනයක් සහ ඇගයීම් සිදු කිරීමෙන් පසු, ප්‍රාග්ධන වෙළෙඳපොළ භූ දර්ශනයට නව නියාමන සහ සංවර්ධන මුල පිරීම් ගණනාවක් ක්‍රියාත්මක කිරීමෙහි නිරත විය.

වෙළෙඳපොළට නව නිෂ්පාදන හඳුන්වාදීම

නව ප්‍රාග්ධන වෙළෙඳපොළ නිෂ්පාදන රැසක් වෙළෙඳපොළට හඳුන්වා දීම සඳහා පහසුකම් සැලසීමේ ප්‍රයත්නයේ දී, මෙම පරිවර්තනීය ප්‍රයත්නය මෙහෙයවීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව ඒකාබද්ධ කමිටුවක් පිහිටුවන ලද අතර එය මෙහෙයවනු ලබන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කීර්තිමත් කොමිෂන් සභා සාමාජිකයෙකු වන මනිල් ජයසිංහ මහතාගේ මගපෙන්වීමෙනි.

මෙම සහයෝගිතා කමිටුව මූලික බලවේගයක් ලෙස ක්‍රියා කරන අතර, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව යන දෙඅංශයේම සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක් ලෙස ඒකාබද්ධ වෙමින්, වෙළෙඳපොළ නවෝත්පාදනයේ නව යුගයක් ආරම්භ කිරීම සඳහා උපායමාර්ගික ප්‍රවේශයක් ඇති කරනු ලැබීය. එකී කමිටුව සිය උත්සාහයන්හි සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරමින් නව වෙළෙඳපොළ ආයෝජන උපකරණ රාශියක් සාර්ථකව ආරම්භ කර ඇත. කමිටුවේ මගපෙන්වීම යටතේ, කොටස් ණයට දීම හා ණයට ගැනීම හරහා නියාමනය කරන ලද හිඟ විකුණුම් සක්‍රීය කිරීම, තිරසාර බැඳුම්කර (හරිත සහ නිල්), ෂරියා අනුකූල ණය සුරැකුම්පත්, යටිතල පහසුකම් බැඳුම්කර, ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත ආයතන විසින් නිකුත් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්වලින් ගනුදෙණු කළ හැකි හිමිකම් සුරැකුම්පත් සහ රජය සතු ව්‍යාපාර විසින් (SOEs) හිමිකම්/ණය



ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන කණ්ඩායම

සුරැකුම්පත් හඳුන්වාදීම වැනි නව ආයෝජන උපකරණ හඳුන්වාදී සම්බන්ධයෙන් වන ක්‍රියාකාරකම් වල අවසන් අදියරට පැමිණ තිබේ. දැනට, එහි පළමු අදියර යටතේ කමිටුව විසින් ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත ආයතන විසින් නිකුත් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වලින් ගනුදෙනු කළ හැකි හිමිකම් සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම සහ වෙළෙඳාම් කිරීම, ඉහළ ප්‍රතිලාභයක් සහිත සාංගමික ණය සුරැකුම්පත් කොටස් හුවමාරුවෙන් බැහැර වේදිකාවක (OTC) ගණුදෙණු කිරීම, කොළඹ කොටස් හුවමාරුවෙහි ලයිස්තුගත සමාගම් සඳහා වැඩි පහසුකම් සහිත පුළුල් ව්‍යාපාර වාර්තාකරණ භාෂා (XBRL) ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම ඇතුළුව විවිධ ප්‍රධාන මූලාරම්භයන් ක්‍රියාත්මක කිරීම ක්‍රියාකාරිව අධීක්ෂණය කරනු ලබයි.

ඒ අනුව යමින්, ප්‍රාග්ධන වෙළෙඳපොළ තවදුරටත් පුළුල් කිරීම සඳහා වැදගත් වන්නා වූ තවත් බොහෝ උපායමාර්ගික ක්‍රියාකාරකම් හඳුන්වාදීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් මෙම කාර්යයේ දෙවන අදියර ආරම්භ කිරීමට කමිටුව සූදානම් වේ.

කොළඹ කොටස් හුවමාරුව තුළ මධ්‍යම ප්‍රතිපාර්ශව (CCP)

2021 අගෝස්තු මාසයේදී කොළඹ කොටස් හුවමාරුව විසින් ගෙවීම්වලට එදිරිව බේරුම් කිරීමේ යාන්ත්‍රණයක් (DvP) සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන් පසුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිය කොමිෂන් සභාව මීළඟ අදියර වෙත ඉදිරියට ගිය අතර, එමගින් සිදුවූයේ වෙළෙඳපොළෙහි පශ්චාත් ගණුදෙනු අවදානම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා අංගසම්පූර්ණ මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතන (CCP) යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමයි. මේ සඳහා, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන්, සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාව - කොළඹ කොටසු හුවමාරුව ඒකාබද්ධ කමිටුවක් පිහිටුවන ලද අතර එහි මූලිකත්වය ගෙන කටයුතු කරනු ලබන්නේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජික මනිල් ජයසිංහ මහතා විසිනි.

ඒකාබද්ධ කමිටුවේ සහයෝගිතා මගපෙන්වීම යටතේ සහ ලෝක බැංකු මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (FSMP) සඳහා පත්කර ඇති

උපායමාර්ගික අරමුණු 3

ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනයට අනුබලදීම

උපදේශකයාගේ තාක්ෂණික සහාය ඇතිව, මධ්‍යම ප්‍රතිපාර්ශව (CCP) යාන්ත්‍රණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ ප්‍රතිපත්ති රාමුව අවසන් කර කොමිසම විසින් අනුමත කරන ලදී. මධ්‍යම ප්‍රතිපාර්ශව (CCP) යාන්ත්‍රණ පද්ධතිය සඳහා පහසුකම් සැලසීමට කොළඹ කොටස් හුවමාරුව සිය පද්ධතිමය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ කටයුතු ආරම්භ කළේය. වර්තමානය වන විට, කොළඹ කොටස් හුවමාරුව විසින් අවශ්‍ය පද්ධතිමය වෙනස් කිරීම් සම්පූර්ණ කිරීම සහ නිෂ්කාශනාගාරය සඳහා අවශ්‍ය නීති රීති සකස් කර අවසන් කිරීම සඳහා කටයුතු කරමින් සිටී. 2024 වර්ෂයේ දෙවන කාර්තුව වන විට සැලසුම් කළ කාලවකවානුව තුළ මධ්‍යම ප්‍රතිපාර්ශව (CCP) යාන්ත්‍රණ පද්ධතියක් සමඟ කොටස් වෙළෙඳපොළ කටයුතු ඒකාබද්ධ වනු ඇතැයි අපේක්ෂා කරයි.

සුරැකුම්පත් ණයට ගැනීම සහ ණය දීම හරහා නියාමනය කරන ලද හිඟ විකුණුම් හඳුන්වාදීම

සුරැකුම්පත් ණය ගැනීම් සහ ණය දීම (SBL) හරහා නියාමන කරන ලද හිඟ විකුණුම් (RSS) හඳුන්වාදීම 2023 නොවැම්බර් 6 වන දින දියත් කරන ලද අතර එය ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා උපායමාර්ගික වශයෙන් සක්‍රීය දායකත්වයක් සපයනු ඇතැයි විශ්වාස කෙරේ. එපමණක් නොව, මෙම නව ආයෝජන උපකරණය හඳුන්වාදීම තුළින් සැලසුම් කර ඇත්තේ වෙළෙඳපොළ ද්‍රවශීලතාවය වැඩි දියුණු කිරීම, වෙළෙඳපොළ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සහ වෙළෙඳපොළ පුළුල් කිරීම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ ආචාරධර්ම භාවිතයන් සමඟ සමපාත වීමයි.

2021 අංක 19 දරන නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත මඟින් ශක්තිමත් කරන ලද, සුරැකුම්පත් ණය ගැනීමේ සහ ණයට දීමේ යාන්ත්‍රණයක් හරහා නියාමන කරන ලද හිඟ විකුණුම් ශක්තිමත් කිරීමේ ප්‍රතිපත්ති රාමුව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව සමඟ සහයෝගයෙන් සහ ලෝක බැංකුවේ තාක්ෂණික සහාය ඇතිව, සකස් කළේය.

වර්තමානයේදී එය දියත් කිරීමට සමගාමීව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව දැනුවත් කිරීමේ පුවත්පත් ලිපි පල කරන ලද අතර, කොළඹ කොටස් හුවමාරුව විසින් නියාමනය කරන ලද හිඟ විකුණුම් සහ සුරැකුම්පත් ණයටගැනීම සහ ණයට දීම පිළිබඳ පාර්ශවකරුවන් පුහුණු කරවීම සඳහා වැඩමුළු සහ දැනුවත් කිරීමේ සැසි පවත්වමින්, මෙම ක්‍රියාවලිය පිළිබඳ පුළුල් අවබෝධයක් පාර්ශවකරුවන්ට ලබාදීමට කටයුතු කරන ලදී.

ව්‍යාපාරික ක්‍රියාකාරකම් හෝ ආයෝජන තීරණවලට වැදගත් වන්නා වූ පාරිසරික, සමාජීය සහ පාලන (ESG) නිර්ණායක ඒකාබද්ධ කරන තිරසාර මූල්‍ය ක්‍රියාකාරකම්වල ජනප්‍රියතාවයේ වර්ධනයත් සමඟ, තිරසාර ප්‍රාග්ධන වෙළෙඳපොළ උපකරණ සඳහා ඇති ඉල්ලුම ද සමගාමීව ඉහළ ගොස් ඇත.

ෂරියා අනුකූල ණය සුරැකුම්පත් වෙළඳපොළට හඳුන්වා දීම

ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වැඩසටහන (CMDP) යටතේ එහි සංරචකයක් ලෙස, ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ හඳුනාගත් ඉල්ලුමක් ඇති ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ උපකරණ සඳහා නියාමන රාමුවක් හඳුන්වාදීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත තාක්ෂණික සහාය ලැබිණි. මේ සම්බන්ධයෙන් වෙළෙඳපොළ තක්සේරුවක් සිදුකිරීමෙන් පසු, ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශකයින් විසින් ආයෝජකයින් සහ නිකුත් කරන්නන් යන දෙඅංශයෙන්ම විශාල කැමැත්තක් දක්වන ඉස්ලාමීය ආයෝජන උපකරණයක් ලෙස සම්ප්‍රදායික ණය සුරැකුම්පතක් වන සුකුක් (Sukuk) හඳුනා ගන්නා ලදී. ඒ අනුව, ණය සුරැකුම්පත් සඳහා අදාළ වන කොළඹ කොටස් හුවමාරුවෙහි දැනට පවතින ලයිස්තුගත කිරීමේ රීතිවලට සංශෝධන සිදු කරමින් සුකුක් උපකරණ ප්‍රාග්ධන වෙළෙඳපොළට හඳුන්වා දීමට නිර්දේශ කරන ලදී.

සුකුක් යනු ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළේ වඩාත්ම ජනප්‍රිය ආයෝජන උපකරණයකි. එමෙන්ම සුකුක් යනු පදනම් වත්කමකට (සාමාන්‍යයෙන් ස්පර්ශ කළ හැකි) සම්බන්ධිත ආයෝජන උපකරණයක් වන අතර ආයෝජකයින්ගේ දෘෂ්ටිකෝණයෙන් බලන විට, සුකුක්වල ආයෝජනය කිරීම හරහා වත්කමේ අර්ධ හිමිකාරිත්වයක් නියෝජනය කරයි. ඉස්ලාමීය මූල්‍ය මූලධර්මවලට අනුව, පදනම් වත්කම් ඇතුළුව සුකුක් ආයෝජන උපකරණ ව්‍යුහය, පාර්ශවයන් අතර සම්බන්ධය සහ අරමුදල් ගලායාම ෂරියාහි රීති සහ මූලධර්මවලට අනුකූල විය යුතු අතර එබැවින් ඉස්ලාමීය නීති විද්‍යාවට අනුව සුදුසුකම් ලත් විද්වතුන් විසින් ආයෝජනය සඳහා ෂරියා අනුකූල බව සහතික කළ යුතුය.

පාර්ශ්වකරුවන්ගේ උපදේශන ක්‍රියාවලියකින් පසුව, ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශකයින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ සමඟ එක්ව සුකුක් උපකරණය හඳුන්වාදීම සඳහා නියාමන රාමුව සකස් කරන ලද අතර එම ආයෝජන උපකරණය දියත් කිරීමට පහසුකම් සැලසීම සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් අනුමත කරන ලදී.

මීට අමතරව, ෂරියා විද්වතුන් විසින් ආයෝජනය සඳහා ෂරියා අනුකූල බව සහතික කිරීමේදී ෂරියා විද්වතුන් විසින් සපයනු ලබන වෘත්තීය සේවාවට නිසි පිළිගැනීමක් ලබා දෙමින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ ෂරියා විද්වතුන් "පරිපූරක සේවා සපයන්නන්" ලෙස පිළිගෙන ඇත. ඒ අනුව, ෂරියා විද්වතුන් සඳහා මාර්ගෝපදේශ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

ප්‍රකාශිත මාර්ගෝපදේශවලට ෂරියා විද්වතුන්ගේ රාජකාරී, සුදුසුකම් සහ පළපුරුද්ද, වාර්තා ඉදිරිපත් කිරීමට සහ වාර්තා පවත්වා ගැනීමේ අවශ්‍යතා, පාලනයන් සහ බැදියා ඇතර ගැටුම් සහ සුදුසුකම් සහ යෝග්‍යතා නිර්ණායක වැනි සංඝටක ඇතුළත් වේ.

පාරිසරික, සමාජීය සහ පාලන (ESG) ආශ්‍රිත ක්‍රියාකාරකම් හඳුන්වාදීම

ව්‍යාපාරික ක්‍රියාකාරකම් හෝ ආයෝජන තීරණවලට වැදගත් වන්නා වූ පාරිසරික, සමාජීය සහ පාලන (ESG) නිර්ණායක ඒකාබද්ධ කරන තිරසාර මූල්‍ය ක්‍රියාකාරකම්වල ජනප්‍රියතාවයේ වර්ධනයත් සමඟ, තිරසාර ප්‍රාග්ධන වෙළෙඳපොළ උපකරණ සඳහා ඇති ඉල්ලුම ද සමගාමීව ඉහළ ගොස් ඇත.

සැපයුම් හා සම්බන්ධ ක්‍රියාකාරකම්

සන්දර්භය සලකා බලන විට, බොහෝ ප්‍රාග්ධන වෙළෙඳපොළවල් හරිත ක්‍රියාකාරකම් හඳුන්වා දීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ නියාමන රාමු ස්ථාපිත කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) තාක්ෂණික සහාය ඇතිව, කොළඹ කොටස් වෙළෙඳපොළෙහි හරිත බැඳුම්කර ලැයිස්තුගත කිරීම සහ ගණුදෙනු කිරීම සඳහා නියාමන රාමුව ක්‍රියාවට නංවා ඇත. ඉන් අනතුරුව, නිල් බැඳුම්කර හඳුන්වාදීම සඳහා හරිත බැඳුම්කර සඳහා වන නියාමන රාමුව සංශෝධනවලට ලක් කරන ලදී. මෙම කාණ්ඩය තුළට අනෙකුත් සුදුසුකම් ලත් බැඳුම්කර ඇතුළත් කිරීමේ ඉදිරි දැක්ම සමඟින්, හරිත සහ නිල් බැඳුම්කර "තිරසාර බැඳුම්කර" යන නාමය යටතේ ආවරණය කර ඇත.

පුළුල් ලෙස පිළිගත් ඔඑබ පදනම් කරගත් පරිගණක මෘදුකාංග භාෂාවක් වන ඔර්සෘබ හරහා ලැයිස්තුගත සමාගම් විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ස්වයංක්‍රීය කිරීමේ හැකියාව ගවේෂණය කිරීමේ අරමුණින්, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සමඟ ඒකාබද්ධ කමිටුවක් පිහිටුවන ලදී.

එපමණක් නොව, ආදර්ශමත් පාරිසරික, සමාජීය හා පාලන ආචාරධර්ම පෙන්නුම් කරන සමාගම් සඳහා පදනමක් ස්ථාපිත කිරීම සඳහා, කොළඹ කොටස් හුවමාරුව තුළ පාරිසරික, සමාජීය හා පාලන ආචාරධර්ම දර්ශකයක් හඳුන්වා දීමට තීරණය කරන ලදී. ඉන් අනතුරුව, තෝරා ගැනීම සඳහා නියමිත ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් පසු, කොළඹ කොටස් හුවමාරුව පිළිගත් තෙවන පාර්ශවීය පාරිසරික, සමාජීය හා පාලන ආචාරධර්ම ශ්‍රේණිගත කිරීමේ සමාගමක් සමඟ ගිවිසුම්වලට එළඹුණු අතර, දර්ශක ක්‍රමවේදය සකස්කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. දැනට, කොළඹ කොටස් හුවමාරුව විසින් එම දර්ශකය දියත් කිරීමට පෙර මහජනතාවගේ ප්‍රතිචාර සළකා බැලීම සඳහා අභ්‍යන්තරව සංවර්ධනය කරන ලද පාරිසරික, සමාජීය හා පාලන ආචාරධර්ම දර්ශක ක්‍රමවේදය නිකුත් කර ඇත.

ඉල්ලුම් හා සම්බන්ධ ක්‍රියාකාරකම්

සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව විසින් ස්ථාපිත ඒකාබද්ධ නව ආයෝජන උපකරණ කමිටුව හරහා මෙහෙයවනු ලබන දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් වලට අනුව, කොටස් වෙළෙඳපොළෙහි ලයිස්තුගත්වීමට හැකියාව ඇති සමාගම් සමඟ අඛණ්ඩ ප්‍රවර්ධන ක්‍රියාකාරකම්වල නිරත වේ. සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සිය ආයෝජකයින් දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස හරිත බැඳුම්කර පිළිබඳ පුවත්පත් ලිපි ද පළ කර ඇත.

ලැයිස්තුගත සමාගම් සඳහා විස්තීරණ ව්‍යාපාර වාර්තාකරණ භාෂාව (XBRL) පදනම් වූ වාර්තාකරණය ක්‍රියාත්මක කිරීම

පුළුල් ලෙස පිළිගත් ඔඑබ පදනම් කරගත් පරිගණක මෘදුකාංග භාෂාවක් වන XBRL හරහා ලැයිස්තුගත සමාගම් විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ස්වයංක්‍රීය කිරීමේ හැකියාව ගවේෂණය කිරීමේ අරමුණින්, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සමඟ ඒකාබද්ධ කමිටුවක් පිහිටුවන ලදී. මෙමගින් මූල්‍ය වාර්තා, ප්‍රකාශ සහ විගණන කාලසටහන් සකස් කිරීම, බෙදා ගැනීම සහ විශ්ලේෂණය සහ ප්‍රමිතිගත කිරීම පමණක් නොව සිදු කරන ලද විශ්ලේෂණවල නිරවද්‍යතාවය සහ ගුණාත්මක භාවයද ඉහළ නංවනු ඇත.

මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා, ඔර්සෘබ වාර්තාකරණය ක්‍රියාත්මක කරන ලද අනෙකුත් විදේශ රටවල නියාමකයින් සමඟ රැස්වීම් කිහිපයක් පවත්වන ලද අතර එහි අරමුණ මෙම රටවල්වල වාර්තාකරණ වේදිකාවන් යොදවා ඇති ආකාරය අවබෝධ කර ගැනීමයි. කොළඹ කොටස් හුවමාරුව විසින් විදේශ කොටස් වෙළෙඳපොළවල දක්නට ඇති විශාලතම සමාගම් 20-30 අතර සමීක්ෂණයක් පැවැත්වූ අතර මෙම ක්‍රියාවලිය සම්බන්ධ ඔවුන්ගේ තොරතුරු එක්රැස් කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා කොමිෂන් සභාවෙන් ප්‍රතිපත්තිමය අනුමැතිය ලැබීමෙන් පසු, මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වේදිකා ක්‍රියාකරුවෙකු ලබා ගැනීම, ලයිස්තුගත සමාගම් සඳහා වේදිකාව විවර කිරීම සඳහා විශේෂිත ඉලක්ක සහිත ඉදිරි සැළැස්මක් සකස් කර ඇත.

යටිතල පහසුකම් බැඳුම්කර හඳුන්වාදීම

යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා පවතින ප්‍රාග්ධන රැස් කිරීමේ මාර්ග පුළුල් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළට හඳුන්වා දිය හැකි යටිතල පහසුකම් ආශ්‍රිත නව වෙළෙඳපොළ උපකරණ පිළිබඳව අධ්‍යයනයක් සිදු කරන ලදී. ඒ අනුව, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව ඒකාබද්ධ නව ආයෝජන උපකරණ කමිටුවේ මගපෙන්වීම යටතේ, යටිතල පහසුකම් බැඳුම්කර වෙළෙඳපොළට හඳුන්වා දීම සඳහා පහසුකම් සැලසීමට තීරණය කරන ලද අතර ඒ සඳහා වන නියාමන රාමුව කොළඹ කොටස් හුවමාරුව විසින් අවසන් කර කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

යටිතල පහසුකම් ආයෝජන සඳහා රජයට ඇති මූල්‍ය බර අඩු කිරීම සහ ආයෝජකයින් සඳහා නව ආයෝජන වත්කම් පන්තියක් සහ යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අරමුදල සපයාගැනීමේ විකල්ප ක්‍රමයක් ලබා දීම, යටිතල පහසුකම් බැඳුම්කර හඳුන්වාදීමේ ප්‍රතිලාභ කිහිපයකි.

ශ්‍රී ලංකාව තුළ ව්‍යුත්පන්න සුරුකුම්පත් හුවමාරුවක් හඳුන්වාදීම

සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කාබන් ණය හුවමාරුවක් හඳුන්වාදීම සඳහා ප්‍රතිපත්ති සහ නියාමන රාමුවක් සකස් කරමින් සිටී. මෙය හඳුන්වාදීම රට තුළ ව්‍යුත්පන්න සුරුකුම්පත් ගණුදෙනු වෙළෙඳපොළක් හඳුන්වාදීමේ පළමු පියවර ලෙස සැලකේ. ව්‍යුත්පන්න සුරුකුම්පතක් ලෙස කාබන් ණය හුවමාරුවක් හඳුන්වාදීම, ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ තවදුරටත් පුළුල් කරමින් ව්‍යාපාර සහ සංවිධාන සඳහා වඩාත් තිරසාර ව්‍යාපාරික අවස්ථා නිර්මාණය කිරීම අරමුණයි. මීට අමතරව, අනාගත දේශීය හා විදේශීය ආයෝජකයින්ට වෙළෙඳපොළට පිවිසීමට මංපෙත් විවර කිරීමටත්, එමගින් රටට අවශ්‍ය විදේශ විනිමය ගලා ඒම ඉහළ නැංවීමටත් අපේක්ෂා කෙරේ. තවද, එය කාබන් ණය ඒකක සඳහා මිල සොයා ගැනීමේ යාන්ත්‍රණයක් සපයන අතර සමාගම්වලට ඔවුන්ගේ කාබන් ණය ඒකක ගණුදෙනු සඳහා ඉදිරිපත් කිරීමට හැකි වේ. එපමණක් නොව, මෙම ක්‍රියාවලිය තුළින් අපේක්ෂා කරන්නේ කාබන් මූල්‍යකරණය සඳහා උපරිම ප්‍රවේශය සඳහා රට දරන උත්සාහයන්ට සහය දැක්වීමක් වන අතර එමඟින් විවිධ කර්මාන්ත හරහා ආයෝජන ප්‍රයත්නයන් සහ සංරක්ෂණයට සහාය වීම ය.

මෙම ක්‍රියාවලිය පිළිබඳව තවදුරටත් අවධානය යොමුකරමින්, ශ්‍රී ලංකාව තුළ කාබන් ණය හුවමාරුවක් හඳුන්වාදීමේ සන්දර්භය තුළ ප්‍රධාන ප්‍රතිපත්ති සලකා බැලීම් ආවරණය කිරීම සඳහා අනෙකුත් රටවල සම්බන්දයෙන්ද විශ්ලේෂණයක් සිදු කරන ලදී. මෙම විශ්ලේෂණය සිදු කරන ලද්දේ මෙම ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීම සඳහා උපාය මාර්ගික මඟ පෙන්වීමක් සැපයීම සහ නියාමන රාමුව ජාත්‍යන්තර ආචාරධර්මවලට අනුකූල බව සහතික කිරීම සඳහා ය. විශ්ලේෂණය මඟින් නියාමන සහ ප්‍රතිපත්ති පරිසරය, වෙළෙඳ ස්වභාවය සහ කාබන් ණය හුවමාරුවක් හඳුන්වාදීම හා සම්බන්ධ අවදානම් සහ අභියෝග ඇතුළු විවිධ පැති සලකා බලන ලදී.

කාබන් ණය වෙළෙඳාමට පහසුකම් සැලසීම පිළිබඳ වැඩිදුර සමාලෝචනය සහ විශ්ලේෂණය සිදුකිරීමෙන් පසු, පදනම් වත්කම් පන්තියේ ස්වභාවය කුමක් වුවත් නව සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සහ එහි රීති සහ රෙගුලාසි මගින් ව්‍යුත්පන්න සුරුකුම්පත් හුවමාරුවකට බලපත්‍ර ලබා දීමට හා ඒ ආශ්‍රිත තැන්පතුගාරයකට සහ නිෂ්කාශනාගාරයකට බලපත්‍ර ලබා දීම සඳහා පහසුකම් සපයා ඇති බව ලේකම් කාර්යාලය විසින් නිරීක්ෂණය කරන ලදී. ඉන් අනතුරුව, බහු-වත්කම් පන්තියේ ව්‍යුත්පන්න සුරුකුම්පත් හුවමාරුවක් ස්ථාපිත කිරීමට ලේකම් කාර්යාලය විසින් තීරණය කරන ලදී. ඒ යටතේ කාබන් ණය වුවද පදනම් වත්කම් පන්තියක් ලෙස සැළකිය හැකිය.

උපායමාර්ගික අරමුණු 3

ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනයට අනුබලදීම

ඒ අනුව ව්‍යුත්පන්න හුවමාරුවක් ස්ථාපිත කිරීම සඳහා සංකල්ප පත්‍රිකාවක් සහ ඉදිරි සැළැස්මක් කොමිෂන් සභාව විසින් සකස් කර අනුමත කරන ලදී. අනුමත ඉදිරි සැළැස්මට අනුව, බහු-වත්කම් පන්ති ව්‍යුත්පන්න හුවමාරුවක් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසුකම් ලත් ආයතනවලින් ප්‍රතිචාර ඉල්ලා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අභිලාෂ කැඳවීමේ ප්‍රකාශයක් (EOI) ප්‍රකාශයට පත් කර ඇත. මෙම ක්‍රියාවලිය මෙහෙයවනු ලබන්නේ කොමිෂන් සභාව විසින් පත් කරන ලද අනු කමිටුවක් මගිනි.

සමස්තයක් වශයෙන්, මෙම සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රාග්ධන වෙළෙඳපොළේ වර්ධනය ඉහළ නැංවීම පමණක් නොව ජාතික ආර්ථික ප්‍රකෘතිමත්භාවය සහ තිරසාර සංවර්ධනයට ද දායක වනු ඇත.

ලයිස්තුගත පොදු සමාගම්වල ව්‍යවස්ථාපිත විගණන පැවැත්වීම සඳහා සුදුසුකම් ඇති බාහිර විගණකවරුන්ගේ ලයිස්තුවක් හඳුන්වාදීම

ලයිස්තුගත පොදු සමාගම්වලට අදාළ විගණන කටයුතු හා ඒ සම්බන්ධ වගකීම් ඉටු කිරීම සඳහා 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ අපේක්ෂාවන් සපුරාලීම සඳහා ලයිස්තුගත පොදු සමාගම්වල ව්‍යවස්ථාපිත විගණන සිදු කිරීමට සුදුසුකම් ඇති" අනුමත විගණකවරුන්ගේ ලයිස්තුවක්" සාංගමික කටයුතු අංශය විසින් සකස් කරන ලදි. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සම්මේලන මණ්ඩලයෙන් (SLAASSMB) ලබාගත් යෙදවුම් සහ අනෙකුත් නියාමකයින් විසින් අනුගමනය කරන ලද සමාන ප්‍රවේශයන් සැළකිල්ලට ගනිමින්, විගණකවරුන් ඇගයීම සඳහා තක්සේරු නිර්ණායක සකසන ලදි. ලයිස්තුගත පොදු සමාගම්වල ව්‍යවස්ථාපිත විගණනවල ගුණාත්මක මට්ටම ඉහළ නැංවීමේ අරමුණ පැහැදිළි කිරීම සඳහාත් මෙම මූල පිරීම සහ එහි ඉදිරි මග පිළිබඳව සාකච්ඡා කිරීම සඳහාත් විගණකවරුන් සමඟ රැස්වීම් ගනනාවක් පවත්වන ලදි. එම්පවර් පුවරුවේ ලයිස්තුගත කර ඇති සමාගම්වලට හැර, අනෙකුත් සමාගම්වලට 2024 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ආරම්භ වන මූල්‍ය වර්ෂය සඳහා මෙම මූල පිරීම බලාත්මක වනු ඇත.

රාජ්‍ය ව්‍යවසායන් ලයිස්තුගත කිරීම

රාජ්‍ය ව්‍යවසායන් විසින් නිකුත් කරන ලද කොටස්, කොළඹ කොටස් හුවමාරුවේ ලයිස්තුගත කිරීමට පහසුකම් සැළසීම සඳහා නියානම රාමුවක් සකස් කරන ලදි. මෙමගින් රාජ්‍ය ව්‍යවසායන් හට ප්‍රාග්ධන වෙළෙඳපොළ හරහා වඩාත් නම්‍යශීලී රාමුවක් මගින් ඔවුන්ගේ සැළකිය යුතු ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමට මගපාදන අතරම රාජ්‍ය අයවැය මත පමණක් රඳා නොසිට වර්ධනය වීමටත් ඒ හරහා තිරසාර ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමටත් හැකි වනු ඇත. සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ මීට අදාළ නීතිරීති ද කොමිෂන් සභාව විසින් සමාලෝචනය කර අනුමත කරන ලදි. එමෙන්ම ඒ සඳහා පහසුකම් සැළසීම සඳහා කොළඹ කොටස් හුවමාරුවේ" කැටලිස්ට් පුවරුව" නමින් වෙනම පුවරුවක් නිර්මාණය කරන ලදි.

බහුවිධ මුදල් පුවරුව

බහුවිධ මුදල් පුවරුව හරහා කොළඹ කොටස් හුවමාරුවේ නම් කරන ලද විදේශ මුදල්වලට අදාළ ණය සුරැකුම්පත් (FCDDS) ලයිස්තුගත කිරීමට පහසුකම් සැළසීම සඳහා පවතින ලයිස්තුගත කිරීමේ රීති සංශෝධනය කරන ලදි. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අදාළ සංශෝධිත රීති සමාලෝචනය කර නියමිත කාල සීමාවේදී අනුමත කරන ලදි.

ආයතනික පාලනය

කොළඹ කොටස් හුවමාරුවේ ලයිස්තුගත සමාගම් අතර ආයතනික පාලන මට්ටම් වැඩිදියුණු කිරීම සහ ආයෝජකයින්ගේ සහ පාර්ශවකරුවන්ගේ විශ්වාසය ගොඩනැංවීමට උපකාරී වන යහපත් අධ්‍යක්ෂ මණ්ඩලයක් සහ කළමනාකරණ භාවිතයන් පිළිබඳ පැහැදිළි මග පෙන්වීමක් ලබාදීම සඳහා ආයතනික පාලනය පිළිබඳ නව ලයිස්තුගත කිරීමේ රීති හඳුන්වා දෙන ලදි. මෙම සංශෝධන පාර්ශවකරුවිනගේ සහ මහජන ප්‍රතිචාර මත සහ ගෝලීයව පිළිගත් භාවිතයන්ට අනුකූල වේ. මෙහි කැපී පෙනෙන ලක්ෂණ වන්නේ අධ්‍යක්ෂකවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරීන් සඳහා වන "නිසි සහ සුදුසු" උපමානවලට අදාළ රීති සහ ආයතනවල අකටයුතුකම් දැනුම් දෙන්නන් ආරක්ෂා කිරීමේ රීති සහ පාරිසරික සමාජීය සහ පාලන තිරසාරභාවය පිළිබඳ ප්‍රතිපත්ති සහිත නීති අනෙකුත් දෑ අතර ඇතුළත් වීමයි.

කල්පිරීමේ දිනයක් රහිත ණයකර

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍ර නිකුත් කරන ලද වාණිජ බැංකු හෝ විශේෂිත බැංකු විසින් නිකුත් කරනු ලබන කල්පිරීමේ දිනයක් රහිත ණයකර ලයිස්තුගත කිරීම පහසු කිරීම සඳහා නව ලයිස්තුගත කිරීමේ රීති හඳුන්වා දෙන ලදි. කොමිෂන් සභාව විසින් අදාළ සංශෝධිත රීති සමාලෝචනය කර පියමිත කාලසීමාවේදී අනුමත කරන ලදි. කල් පිරීමේ දිනයක් රහිත ණයකර නිකුත්ව "සුදුසුකම් ලත් ආයෝජකයන්ට" පමණක් සීමා වේ.

අනෙකුත් ක්‍රියාකාරකම්

- සාංගමික ණය ගනුදෙනුවල ප්‍රතිමිලදී ගැනීම් සඳහා සංශෝධිත ගනුදෙනු ගාස්තු සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු, ඒ සඳහා අවශ්‍ය රෙගුලාසි නිකුත් කිරීමට මුදල් අමාත්‍යාංශය (MoF) වෙත ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, මුදල් අමාත්‍යාංශය විසින් රෙගුලාසි නිකුත් කරන ලදී.

- කොළඹ කොටස් හුවමාරුව විසින් යෝජනා කරන ලද සාංගමික ණය ගනුදෙනු සඳහා අදාළ ගනුදෙනු ගාස්තු ගණුදෙණු වටිනාකමින් පදනම් ඒකක 1 ක් දක්වා අඩු කිරීමට කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන ඇති අතර ඒ සඳහා අවශ්‍ය රෙගුලාසි නිකුත් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයට (MoF) ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී. ජාතික අයවැයට ඇතුළත් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලදී.

උපායමාර්ගික අරමුණු 4

දැනුවත් ආයෝජන තීරණ ගැනීම සහ ප්‍රාග්ධන වෙළෙඳපොළේ අයිතීන් ආරක්ෂා කිරීම

ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නැංවීම සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම, ආයෝජකයින්ට මනා වූ දැනුවත්භාවයකින් යුත් මූල්‍ය හා ආයෝජන තීරණ ගැනීම සඳහා ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විවිධ උපායමාර්ගික ක්‍රියාකාරකම් හරහා ආයෝජකයින් සවිබල ගැන්වීමට ප්‍රමුඛත්වය දීමට කැපවී සිටී.

වසර තුළදී, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සමාජයේ විවිධ කොටස්වලට ගැලපෙන පරිදි සකස් කරන ලද ආයෝජකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ක්‍රමවත්ව සැලසුම් කර, පවත්වන ලදි. මෙම ක්‍රියාකාරකම් හරහා අපෙක්ෂා කරනුයේ වෙළෙඳපොළ පිළිඳව පවතින අපහැදිලි තැන් සම්බන්ධයෙන් ආයෝජකයින් දැනුවත් කිරීම පමණක් නොව ඔවුන්ගේ මූල්‍ය අයතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය දැනුමෙන් ඔවුන් සන්නද්ධ කිරීමට ක්‍රියාශීලී පියවරක් ලෙසද ක්‍රියා කිරීමයි.

බාහිර ක්‍රියාකාරකම් - සම්මන්ත්‍රණ සහ වැඩමුළු

නව ආයෝජන අවස්ථා සහ ආයෝජන උපකරණ සමඟ මූල්‍ය වෙළෙඳපොළවල් වඩ වඩාත් සංකීර්ණ වෙමින් පවතී. ආයෝජකයින් ප්‍රාග්ධන වෙළෙඳපළේ ජීවනාලිය වන බැවින්, ඔවුන්ගේ අයතිවාසිකම් ආරක්ෂා කිරීම සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ප්‍රමුඛතාවයකි. ප්‍රාග්ධන වෙළෙඳපොළ කෙරෙහි ආයෝජක විශ්වාසය ගොඩනැගීම සඳහා දැනුවත් මූල්‍ය තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු පුද්ගලයන් සතුව ඇති වෙළෙඳපොළක් පවත්වාගෙන යාම වැදගත් වේ.

වසර තුළදී, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ආයෝජක අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා උපාය මාර්ග සැලසුම් කරන ලද අතර සියලු වයස්වල සහ සියලු තරාතිරම්වලට අයත් පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත ළඟාවීම අරමුණු කර ගෙන ඇත. ආර්ථික අවිනිශ්චිතභාවය සහ අභියෝග නොතකා, අප ගුරුවරුන්, ආයෝජකයින්, සිසුන්, උපාධි අපේක්ෂකයින් සහ මහජනතාව සඳහා ඔන්ලයින් ක්‍රමයට සහ පුද්ගලික සැසි සංවිධානය කිරීම යනාදී දෙයාකාරයෙන්ම බාධාවකින් තොරව ඉගෙනුම් අවස්ථා සහ අත්දැකීම් ලබාදීමට කටයුතු කළෙමු.



බාහිර සම්බන්ධතා සහ ප්‍රාග්ධන වෙළෙඳපොල අධ්‍යාපන කණ්ඩායම

ගුරු පුහුණු වැඩමුළු

විවිධ විෂයයන් හරහා දැනුම ලබා දීමෙන් ගුරුවරුන් විසින් සිසුන්ගේ අධ්‍යාපනික සංවර්ධනය සඳහා අඩිතාලම දමයි. ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳව ගුරුවරුන් දැනුවත් කිරීම ඉතා වැදගත් පියවරකි. ඒ මන්ද යත්, ගුරුභවතුන්ට, මූල්‍ය වෙළෙඳපොළ, ආයෝජන මූලධර්ම සහ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් දැනුම සිසුන්ට ලබා දීමට ඔවුන්ට ඉහළ හැකියාවක් ලැබෙන බැවිනි.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, සිසුන්ට ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ වටිනා දැනුමක් සහ අවබෝධයක් ලැබෙන අතර, ඔවුන්ට දැනුවත් තීරණ ගැනීමටත්, දිනෙන් දින දියණුවන වන ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ විශ්වාසයෙන් සැරිසැරීමටත් හැකියාව ලැබේ. මේ අනුව, ගුරු පුහුණුව සඳහා ආයෝජනය කිරීම ගුරුවරයාගේම මූල්‍ය සාක්ෂරතාවය වැඩි දියුණු කරනවා පමණක් නොව මූල්‍යමය වශයෙන් බුද්ධිමත් පරපුරක් බිහිකිරීමට ද දායක වේ. ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ජාතික අධ්‍යාපන ආයතනය සහ අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව දිවයින පුරා භාෂා ත්‍රිත්වයෙන්ම ගුරුවරුන් සඳහා වැඩසටහන් 08ක් පවත්වන ලදී.

පාසල් සම්මන්ත්‍රණ

පාසල් සිසුන් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම මූල්‍ය සාක්ෂරතාවය සහ ප්‍රාග්ධන වෙළඳපොළ පිළිබඳ දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඉතිරිකිරීම්, ආයෝජන සහ අවදානම් අවබෝධ කර ගැනීම වැනි සංකල්ප හඳුන්වා දීමෙන් කුඩා කාලයේ සිටම වගකීම් සහගත මූල්‍ය තීරණ ගැනීමේ පදනම සකස් කරනු ලබයි. සළකා බලන වර්ෂය තුළ අප පාසල් සිසුන් සඳහා පහත සඳහන් පාසල් සහ අධ්‍යාපන කලාපයන් සම්බන්ධ කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

උපායමාර්ගික අරමුණු 4

දැනුවත් ආයෝජන තීරණ ගැනීම සහ ප්‍රාග්ධන වෙළෙඳපොළේ අයිතීන් ආරක්ෂා කිරීම

- ආනන්ද ශාස්ත්‍රාලය ජාතික පාසල, මතුගම
- පුත්තලම අධ්‍යාපන කලාපය
- හලාවත අධ්‍යාපන කලාපය
- ගම්පොල අධ්‍යාපන කලාපය
- බලංගොඩ අධ්‍යාපන කලාපය
- කෑගල්ල අධ්‍යාපන කලාපය
- කඩවත මධ්‍ය මහා විද්‍යාලය
- හොරවල මහා විද්‍යාලය
- දොඩන්ගොඩ මහා විද්‍යාලය, දොඩන්ගොඩ
- පානදුර බාලිකා මහා විද්‍යාලය, පානදුර
- වේල්ස් කුමරි විද්‍යාලය, මොරටුව

පාසල් ප්‍රාග්ධන වෙළෙඳපොළ සමාජ 100 ක් පිහිටුවීමේ ක්‍රියාවලිය

සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව, අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජනාධිපති ලේකම් කාර්යාලය සමඟ එක්ව පාසල්වල ප්‍රාග්ධන වෙළෙඳපොළ සමාජ පිහිටුවීම මගින් අධ්‍යාපන පද්ධතිය හරහා මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කළේය. මෙම කාර්යය වඩාත් සුමටව සහ සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව සහ මුදල් අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

ප්‍රාග්ධන වෙළෙඳපොළ සමාජ 100ක් පිහිටුවීමේ සමාරම්භක උත්සවය 2023 අගෝස්තු 31 වැනි දින මහනුවර, නුගවෙල මධ්‍ය මහා විද්‍යාලයේදී ගරු ජනාධිපති, රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විනි. වාණිජ විෂය ධාරාවේ ඉසෙඩ් අගය මත මූලික පාසල් 100 තෝරා ගන්නා ලදී. තෝරාගත් පාසල් 100හි ප්‍රාග්ධන වෙළෙඳපොළ සමාජ 100 සඳහා වන වරලත් සහතික පිරිනැමීම පළාත් මට්ටමින් පැවැත්විණි.

උපාධි අපේක්ෂකයින් සඳහා වැඩසටහන්

උපාධි අපේක්ෂකයින්ගේ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීමට සහ සුරුකුම්පත් වෙළෙඳපොළ තුළ සක්‍රීය ලෙස සහභාගීත්වය දිරිගැන්වීම සඳහා සකස් කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වමින් අප ශ්‍රී ලංකාවේ ජාතික විශ්ව විද්‍යාල සම්බන්ධ කර ගනිමින් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ පැවැත්වුවෙමු.

මෙම ක්‍රියාකාරී ප්‍රවේශය හරහා මූල්‍ය මූලධර්ම පිළිබඳ ගැඹුරු අවබෝධය සඳහා පමණක් නොව ප්‍රාග්ධන වෙළෙඳපොළ කර්මාන්තය සඳහා කුසලතා සපිරි සංචිතයක් නිර්මාණය කිරීම සඳහා ද යොමු වූවෙමු. වසර පුරාවට අප විශ්වවිද්‍යාලවල පහත සඳහන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කළෙමු.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- කොළඹ විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- සබරගමුව විශ්වවිද්‍යාලය
- වයඹ විශ්වවිද්‍යාලය

වාසිටි බැට්ල්ස් අන්තර් විශ්වවිද්‍යාල ප්‍රශ්න විචාරාත්මක දැනුම මිනුම තරඟය

උපාධි අපේක්ෂකයින් අතර මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම අරමුණු කරගත් 2023 වාසිටි බැට්ල්ස් (Varsity Battles) - අන්තර් විශ්වවිද්‍යාල ප්‍රශ්න විචාරාත්මක දැනුම මිනුම තරඟය සංවිධානය කිරීමට සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටසු හුවමාරුව සමඟ අත්වැල් බැඳ ගත්තේය.

මෙම තරඟය මගින් ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර දැනුම, කොටස් වෙළෙඳපොළේ ආයෝජන දිරිමත් කිරීම සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ කර්මාන්තයේ වෘත්තීය අවස්ථා වර්ධනය කිරීම යන දෙඅංශයෙන්ම සිසුන්ගේ දැනුම පරීක්ෂා කරන ලදී.

මෙම තරඟයට රාජ්‍ය විශ්ව විද්‍යාල 13 ක් සම්බන්ධ වූ අතර, එය අදියර දෙකකින් සමන්විත විය. විශ්ව විද්‍යාල තුළ අන්තර් පීඨ තරඟය පවත්වා ඉන් ඉහළම දක්ෂතා දක්වන ලද කණ්ඩායම් තුනට ජාතික මට්ටමේ තරඟය සඳහා සහභාගීවීමට අවස්ථාව උදාවිය.

මෙම සාමූහික ක්‍රියාකාරම හරහා, ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව ශ්‍රී ලාංකික උපාධි අපේක්ෂකයින් අතර මූල්‍ය සාක්ෂරතාවයේ සහ ආයෝජන සංස්කෘතියේ ධනාත්මක දියුණුවක් ඇති කිරීමේ උත්සාහයක නිරත විය.

සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව, අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජනාධිපති ලේකම් කාර්යාලය සමඟ එක්ව පාසල්වල ප්‍රාග්ධන වෙළෙඳපොළ සමාජ පිහිටුවීම මගින් අධ්‍යාපන පද්ධතිය හරහා මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කළේය.

IOSCO'S හි ලෝක ආයෝජක සති වැඩසටහන

ලෝක ආයෝජක සතිය හා සමගාමීව, අප ආයෝජකයින් තුළ වර්ධනය වන උනන්දුවට ගැලපෙන වටිනා ඉගෙනුම් අවස්ථා ලබා දෙමින් සමාජ මාධ්‍ය වේදිකා හරහා ප්‍රධාන පණිවිඩ බෙදා හැරීමට සැලසුම් කර ක්‍රියාකාරකම් මාලාවක් දියත් කළෙමු. අපගේ සමාජ මාධ්‍ය ප්‍රචාරණය තුළ ආයෝජකයන්ගේ ඔරොත්තු දීමේ හැකියාව, තිරසාර මූල්‍යකරණය සහ ආයෝජක ආරක්ෂාව වැනි තේමා කිහිපයක් ඇතුළත් විය.

ඩිජිටල් භූ දර්ශනය තුළ අපගේ සමාජ මාධ්‍ය පැවැත්ම පුළුල් කරමින්, ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ලෝක ආයෝජක සතියට සමගාමීව එහි Instagram ගිණුම දියත් කරන ලදී. මීට අමතරව, ලෝක ආයෝජක සතියේ වැදගත්කම ප්‍රවර්ධනය කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුව සමඟ එක්ව සිනු නාද කිරීමේ (Bell Ringing) උත්සවයක් පවත්වන ලදී.

මීට අමතරව, ලෝක ආයෝජක සතියට සමගාමීව වර්සිටි බැට්ල් අන්තර් විශ්වවිද්‍යාල ප්‍රශ්න විචාරාත්මක දැනුම මිනුම තරඟාවලියහි එක් තරඟයක් කැලණිය විශ්වවිද්‍යාලයේදී සංවිධානය කරන ලද අතර, වගකීම් සහගත ආයෝජන පිළිවෙත් ප්‍රවර්ධනය කරමින් මූල්‍ය දැනුමෙන් පුද්ගලයින් දැනුවත් කිරීම සහ සවිබල ගැන්වීම මෙහි අරමුණ විය. මෙම කාර්යය සිසුන් අතර ඉහළ තරඟකාරිත්වයක් ඇති කිරීමට පමණක් නොව, විශ්ව විද්‍යාල ප්‍රජාව තුළ මූල්‍ය සාක්ෂරතාවය සහ ආයෝජක අධ්‍යාපනය ඉහළ නැංවීමේ පුළුල් ඉලක්කයට ද දායක විය.

ආයෝජක සම්මන්ත්‍රණ SEC/CSE

දැනුවත් කිරීම සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා දීමේ ප්‍රයත්නයක් ලෙස, සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව විසින් ''නැණවත් අයෝජනයකට සවිමත් අත්වැලක්'' යන තේමාව යටතේ ආයෝජක සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කරන ලදී.

සුළු පරිමාණ ආයෝජකයින්ගෙන්ට වඩා ක්‍රියාශීලී ලෙස සහ ඉහළ දැනුවත්භවයකින් ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ කටයුතු කිරීමට ඔවුන්ගේ සහභාගීත්වය දිරිමත් කිරීමට මෙම සම්මන්ත්‍රණ මාලාවේ අරමුණයි. වසර පුරා පානදුර, ත්‍රිකුණාමලය, අම්පාර, මඩකලපුව, මීගමුව, අනුරාධපුරය, බදුල්ල ඇතුළු ප්‍රදේශ රැසක ප්‍රාදේශීය ආයෝජක සම්මන්ත්‍රණ කිහිපයක් පැවැත්විණි.

"වර්තමාන කොටස් වෙළෙඳපොළ තුළ ඔබ කෙසේ හැසිරිය යුතුද?" ආයෝජකයින් සඳහා පැවැත්වූ වැඩසටහන

''වර්තමාන කොටස් වෙළෙඳපොළ තුළ ඔබ කෙසේ හැසිරිය යුතුද?" ආයෝජක වැඩසටහනට කර්මාන්තයේ විශේෂඥයෙකු සහභාගී වූ අතර ශ්‍රී ලංකා ආර්ථිකයේ බලපෑම් මත පදනම්ව වත්මන් කොටස් වෙළෙඳපොළ තුළ කටයුතු කරන්නේ කෙසේද යන්න සාකච්ඡා කිරීම එහි මූලික අරමුණ විය.

මෙම සම්මන්ත්‍රණය තුළින් සහභාගිවූවන්ට කර්මාන්තයේ පළපුරුදු ව්‍යක්තිකයෙකුගෙන් සෘජුව අදහස් විමසීමට අගනා අවස්ථාවක් සලසා දුන් අතර, ආයෝජනයේ විවිධ පැතිකඩයන් සහ වෙළෙඳපොළ සංකීර්ණතා පිළිබඳ ගැඹුරු අවබෝධයක් ද ලබාගත හැකි විය. සිංහල මාධ්‍යයන් මෙම සාකච්ඡා පැවැත්වීම හරහා පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත ප්‍රවේශ වීමට හැකියාව ලබුණි.

ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව (SEC)සහ ශ්‍රී ලංකා වරලත් මූල්‍ය විශ්ලේෂකයින්ගේ (CFA) සංගමය විසින් ශ්‍රී ලංකා පර්යේෂණ විශ්ලේෂකයින් සඳහා පවත්වන ලද වැඩමුළුව

ශ්‍රී ලංකා වරලත් මූල්‍ය විශ්ලේෂකයින්ගේ (CFA) සංගමය සමඟ එක්ව, අප ''පර්යේෂණ අබණ්ඩතාව වැඩි දියුණු කිරීම: කොටස් තැරැව්කාර සමාගම්වල පර්යේෂණ විශ්ලේෂකයින් සඳහා වාස්තවික ප්‍රමිති සංවාලනය කිරීම" යන මැයෙන් වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහන මඟින් වාස්තවික ප්‍රමිතීන් ආරක්ෂා කිරීමේ වටිනාකම, කොටස් තැරැව්කාර කර්මාන්තයේ පර්යේෂණ අබණ්ඩතාව ශක්තිමත් කිරීම සහ සියලු කර්මාන්ත හරහා පර්යේෂණ පුහුණුවීම්වල ගුණාත්මක භාවය වැඩි දියුණු කරන ලදී.

මාධ්‍ය එකතුව

සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් මාධ්‍ය රැස්වීමක් සංවිධානය කරන ලදී, කර්මාන්තයේ නියැලෙන්නන් සහ බලගතු මාධ්‍ය පුද්ගලයින් එක් වහලක් යටට එක් කරමින් සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ උපාය මාර්ගික මාර්ග සිතියම පිළිබඳ යාවත්කාලීන කිරීම් බෙදාහදා ගත්තේය. සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අනාගත දිශානතිය පිළිබඳ විස්තීර්ණ දළ විශ්ලේෂණයක් ලබා දෙමින් විවෘත සංවාදයකට සහ තීක්ෂ්ණ බුද්ධි හුවමාරුවකට මෙම සිදුවීම පහසුකම් සැලසීය. ප්‍රධාන පාර්ශ්වකරුවන් සහ මාධ්‍ය නියෝජිතයන් එක්රැස් කිරීම මඟින්, රැස් කිරීම විනිවිදභාවය සහ සහයෝගිතාවය වර්ධනය කර, ආයෝජක අවශ්‍යතා ඉදිරියට ගෙන යාමට සහ වෙළෙඳපොළ ස්ථාවරත්වය සහතික කිරීමට සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කැපවීම ශක්තිමත් කරයි.

සමාජ මාධ්‍ය හරහා මූල්‍ය සාක්ෂරතාව වැඩි දියුණු කිරීම

අද, අපගේ ලෝකය ඉතිහාසයේ විශාලතම තරුණ පරම්පරාවේ නිවහන වන අතර වේගවත් ඩිජිටල් පරිණාමයේ යුගයක් වන අතර, ඩිජිටල් යටිතල පහසුකම්වල පුළුල් දියුණුව, පුළුල් අන්තර්ජාල සම්බන්ධතාවය සහ ස්මාර්ට්ෆෝන් භාවිතය වැඩි කිරීම මඟින් මෙහෙයවනු ලැබේ. මෙම වසරේ, අපි Twitter සහ Facebook වැනි සමාජ මාධ්‍ය වේදිකා හරහා ආයෝජක අධ්‍යාපන ප්‍රයත්නයන් සඳහා ප්‍රමුඛත්වය දී ඇත.

කාන්තා දිනය සහ ලෝක ආයෝජක සතිය වැනි ප්‍රධාන සිදුවීම් උපයෝගී කර ගනිමින් ඉලක්කගත සමාජ මාධ්‍ය ප්‍රචාරණ හරහා මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම අපගේ ප්‍රයත්නවල අරමුණයි. සංරක්ෂිත සිදුවීම් සහ සමාජ අන්තර්ගතයන් හරහා, ආයෝජන වංචා පිළිබඳ දැනුවත් කිරීම, නව සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධාන සහ කොටස් වෙළඳපොලේ ආයෝජනය කරන්නේ කෙසේද යන්න පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සහ සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඉදිරියට ගෙන යන ආයෝජක ආරක්ෂණ මූලපිරීම් පිළිබඳව අපි නිරන්තරයෙන් අන්තර්ගතය බෙදා හැරීම කෙරෙහි අවධානය යොමු කරමු.

SEC YouTube නාලිකාව අධ්‍යාපනික වීඩියෝ බෙදා ගනී, ආයෝජකයින් සඳහා වටිනා සම්පත් සැපයීමට අපගේ කැපවීම ශක්තිමත් කරයි.

උපායමාර්ගික අරමුණු 5

ආයතනික විශිෂ්ඨත්වය දියුණු කිරීම


මානව සම්පත් (HR) ඉදිරි ගමන් මග

මානව සම්පත් ක්‍රියාවලියේ මූලික වගකීම වන්නේ මානව සම්පත් කළමනාකරණයට අදාළ ප්‍රතිපත්ති පරිපාලනය, බඳවා ගැනීමේ ක්‍රියාවලිය, ස්ථාපනය, ප්‍රතිලාභ පරිපාලනය, රැකියා සහ කම්කරු නීතිවලට අනුකූල වීම පිළිබඳව සහතික වීම, නව සේවකයන් පුහුණු කිරීම, සේවක ඉදිරි පුහුණුව හා සංවර්ධනය , පුද්ගල වාර්තා රඳවා තබා ගැනීම, වැටුප් සහ වැටුප් පරිපාලනය සහ ආයතනයේ සංවර්ධනයට සහ වර්ධනයට උපකාර වන සේවක ආධාර වැඩසටහන් වැනි කාර්යයන් ඇතුළුව සියලුම සේවක ආශ්‍රිත කරුණු කළමනාකරණය කිරීම, සහාය වීම සහ හැසිරවීමයි. මානව සම්පත් කණ්ඩායම අනෙකුත් සියලුම අංශයන් සමග ඉතා සමීපව කටයුතු කරන අතර ඔවුන්ගේ අවශ්‍යතා වලට සහය වීමට සහ ප්‍රතිචාර දැක්වීමට දායක වෙයි.


කාර්ය මණ්ඩලය

ආයතනය සඳහා සේවකයින් බඳවා ගැනීම සම්බන්ධයෙන්, සලකා බලන වසර ඉතා සාර්ථක ක්‍රියාවලියක් විය. නීති සහ බලාත්මක කිරීමේ අංශය සඳහා නව අධ්‍යක්ෂකවයෙකු, විමර්ශන සහ බලාත්මක කිරීමේ අධ්‍යක්ෂකවරයෙකු (නීතිපති දෙපාර්තමේන්තුවේ නිදහස් කරනු ලැබූ) සහ තොරතුරු තාක්ෂණ අංශය සඳහා ප්‍රධාන ඩිජිටල් නිලධාරියෙකු වැනි බොහෝ බලාපොරොත්තු වූ ජ්‍යෙෂ්ඨ තනතුරු බඳවා ගැනීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට හැකි විය. තවද, සහකාර කළමනාකරුවන් 12 දෙනෙකු, රහස්‍ය ලේකම්වරයෙකු සහ තොරතුරු තාක්ෂණ ඒකකයට සහාය වීම සඳහා කනිෂ්ඨ නිලධාරියෙකු වැඩ භාර ගන්නා ලදී. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අරමුණු, ප්‍රතිපත්ති සහ වටිනාකම් ඉස්මතු කරමින් සහ නව සේවකයන්ට ආයතනය පිළිබඳ මූලික අවබෝධයක් ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් නව සේවකයින් පිළිගැනීමට සහ ඒකාබද්ධ කිරීමට විනිමය කොමිෂන් සභාව කටයුතු සම්පාදනය කළේය. එසේම, කොටස් තැරැව්කරුවකුගේ භූමිකාව සහ කොළඹ කොටස් හුවමාරුවේ කාර්යභාරය පිළිබඳව නවකයන් දැනුවත් කිරීම සඳහා අදාළ ආයතන වෙත ගොස් එම දැනුම ලබාදීමේ වැඩසටහනක් දක්වා එම මූලික පුහුණුව දීර්ඝ කරන ලදී. (රූප සටහන් 09, 10, 11, 12, 13)


රූප සටහන: 09 සේවා තොරතුරු




රූප සටහන: 10 වයස් විශ්ලේෂණය




රූප සටහන: 11 අධ්‍යාපන සුදුසුකම් අනුව සේවක සංඛ්‍යාව



රූප සටහන: 12 පවත්නා කාර්යමණ්ඩල සංයුතිය



රූප සටහන: 13 ස්ත්‍රී පුරුෂ සංයුතිය



තරුණ වෘත්තිකයන් නවෝත්පාදන සහ නැවුම් ඉදිරි දැක්මක් සඳහා දායක වෙමින් ඔවුන්ගේ අධ්‍යාපනයෙන් යාවත්කාලීන දැනුම සහ කුසලතා ගෙන එන බව අපගේ විශ්වාසයයි. එබැවින්, අනාගත නායකයින් බිහිකිරීමේ මාර්ගයක් සහතික කරමින් රට පුරා සිටින දක්ෂ පුද්ගලයින් හඳුනාගෙන සංවර්ධනය කිරීමේ අරමුණින් කළමනාකරණ අභ්‍යාසලාභීන් බඳවා ගැනීම සඳහා මෙම වසරේදී සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මුල පුරන ලදි. තේරීම් ක්‍රියාවලිය පුරාවට අපක්ෂපාතීත්වයට මුල් තැනක් ලබාදුන් අතර ලැබී තිබුණු විශාල අයදුම්පත් සංඛ්‍යාව හේතුවෙන් ක්‍රියාවලිය මාස දෙකක් පුරා පැතිර ගියේය.

අයදුම්පත්‍රය මගින් ඉල්ලා තිබූ සුදුසුකම් සම්පූර්ණ කළ අපේක්ෂකයින් නාලන්දා විද්‍යාලයේ පැවති තරඟ විභාගයක් සඳහා කැඳවනු ලැබීය. තරඟ විභාගය පැවැත්වීමේ ක්‍රියාවලිය තුළ ඉහළම මට්ටමේ රහස්‍යභාවයක් සහ විශ්වසනීයත්වයක් පවත්වා ගනිමින් නිම කිරීමට නාලන්දා විද්‍යාලයේ විදුහල්පතිවරයා සහ කාර්ය මණ්ඩලය ප්‍රශංසනීය සහයෝගයක් ලබා දුන්නේය. දෙසැම්බර් මාසයේදී, තරඟ විභාගයෙන් 60% ට වඩා වැඩි ලකුණු ලබා ගත් අපේක්ෂකයින් ඔවුන්ගේ කුසලතා, රැකියා පළපුරුද්ද සහ පෞරුෂය, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ රැකියා අවශ්‍යතා සමඟ ගැලපේද යන්න තක්සේරු කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ 2ක් පවත්වන ලදී.



මානව සම්පත් සහ ආයතනික පරිවර්තන කණ්ඩායම

සීමාවාසිකයින් බඳවා ගැනීම්

ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමකයාගේ කාර්යභාරය පිළිබඳ දැනුම සහ පුහුණුව ලබාදීමේ අරමුණින් ජාතික විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයින් සඳහා වසර තුළ සීමාවාසික අවස්ථා 9ක් ප්‍රදානය කර ඇත.

ඉල්ලා අස්වීම්

දක්ෂ තරුණ වෘත්තිකයන් රඳවා තබා ගැනීම වසර තුළ බරපතල අභියෝගයක් විය. බොහෝ තරුණ වෘත්තිකයින් ආර්ථික අවිනිශ්චිතතාවයන් හේතුවෙන් රට හැර යාමේ ඉහළ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර එමගින් ඔවුන් අපේක්ෂා කරන ලද්දේ තම ජීවන තත්ත්වය ඉහළ නැංවීමට වඩා හොඳ අවස්ථා සොයා ගැනීමයි. ඒ අනුව කාර්ය මණ්ඩල සාමාජිකයින් දස දෙනෙකු විදේශ රැකියා වලට යාම සඳහා සේවයෙන් ඉල්ලා අස් විය. එසේම, කාර්ය මණ්ඩල සාමාජිකයින් අට දෙනෙකු ඉහළ වැටුප් සහ වරප්‍රසාද සඳහා රට තුළ වෙනත් ආයතන වෙත සංක්‍රමණය විය. එසේම වසර 25කට වැඩි කාලයක් සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සේවය කළ ජ්‍යෙෂ්ඨ කාර්යාල කාර්ය සහායකයින් තිදෙනෙක් සේවයෙන් විශ්‍රාම ගියහ. ඒ අනුව, අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු, ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරුවන් තිදෙනෙකු, සහකාර කළමනාකරුවන් දොළොස් දෙනෙකු, දුරකථන ක්‍රියාකරුවෙකුගේ ඉල්ලා අස්වීම සහ ජ්‍යෙෂ්ඨ කාර්යාල සහකාරවරුන් තිදෙනෙකුගේ විශ්‍රාම යාමත් සමඟ වසරේ සේවක පිරිවැටුම් අනුපාතය 21% ලෙස පෙන්නුම් කළේය.

පුහුණු හා සංවර්ධන

උසස් තත්ත්වයේ, විස්තීර්ණ පුහුණු සහ සංවර්ධන වැඩසටහන් මඟින් සේවකයින්ට ආයතනයේ ක්‍රියාවලි, ක්‍රියා පටිපාටි සහ ඉලක්ක පිළිබඳ වැඩි අවබෝධයක් ලබා දෙයි. එමගින් ඔවුන්ගේ භූමිකාවන් තුළ ඵලදායී ලෙස කටයුතු කිරීමට අවශ්‍ය දැනුම සහ කුසලතා ද ලබා දෙයි.

එබැවින් සේවක පුහුණුව සහ සංවර්ධන ක්‍රියාපටිපාටිය සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නිරන්තර වැඩිදියුණු කිරීම්වලට ලක් වන අතර එමගින් වෙළෙඳපොළ ප්‍රවණතා, වර්ධනය වන

එබැවින් සේවක පුහුණුව සහ සංවර්ධන ක්‍රියාපටිපාටිය සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නිරන්තර වැඩිදියුණු කිරීම් වලට ලක් වන අතර එමගින් වෙළෙඳපොළ ප්‍රවණතා, වර්ධනය වන නිපුණතා සහ අපගේ කණ්ඩායම තුළ අපට ඇති පුද්ගලයින්, නිවැරදි ආකල්ප සමඟ ගැලපීම සහ මිශ්‍ර කිරීම, විශිෂ්ඨ කාර්ය සාධනයක් ලබා ගැනීම සඳහා ගුණාත්මක මානසිකත්වය බිහිකිරීම සහ ඉහළ ඵලදායිතාව පිළිබඳව අවධානය යොමුකරයි.

නිපුණතා සහ අපගේ කණ්ඩායම තුළ අපට ඇති පුද්ගලයින්, නිවැරදි ආකල්ප සමඟ ගැලපීම සහ මිශ්‍ර කිරීම, විශිෂ්ඨ කාර්ය සාධනයක් ලබා ගැනීම සඳහා ගුණාත්මක මානසිකත්වය බිහිකිරීම සහ ඉහළ ඵලදායිතාව පිළිබඳව අවධානය යොමුකරයි.

වර්තමාන තරඟකාරී රැකියා වෙළෙඳපොළ තුළ, සේවකයින් තම රැකියාවල යාවත්කාලීනව සිටීමට සහ ඔවුන්ගේ වෘත්තීන් ඉදිරියට ගෙනයාමට අඛණ්ඩ පුහුණුව සඳහා දැඩි උනන්දුවක් දක්වයි.

2023 වර්ෂයේදී විදේශ පුහුණුව සඳහා රුපියල් මිලියන 40ක් අයවැයෙන් වෙන් කළ අතර සහභාගීවූවන්ට කිසිදු ගාස්තුවකින් තොරව විදේශ පුහුණුවීම් සහ සම්මන්ත්‍රණ සහභාගිවීම් 15ක් සඳහා මිලියන 15ක් ආයෝජනය කර ඇත. විශේෂයෙන්ම ජාත්‍යන්තර සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සංවිධානය (IOSCO) විසින් නියම කරන ලද වැඩසටහන් ඇතුළු විදේශ පුහුණු වැඩසටහන් ලබා දීමට සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කළමනාකාරිත්වය කැපවී සිටියද, විනිමය හුවමාරු සීමා කිරීම් ඊට අභියෝග යක් විය. 2024 වර්ෂයේදී දී මෙම පාලන ලිහිල් කිරීමක් අප අපේක්ෂා කරන අතර එමඟින් කාර්ය මණ්ඩල කුසලතා වැඩි දියුණු කිරීමට සහ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය මෙහෙයවීමට කොමිෂන් සභාවේ උත්සාහයට පහසුකම් සැලසෙනු ඇත.

IOSCO වාර්ෂික සම්මන්ත්‍රණය, කම්ටු රැස්වීම්, අනෙකුත් නියාමන වැඩමුළු ආදිය හරහා ලෝකයේ සුරුකුම්පත් සහ අනාගත වෙළෙඳපොළවල් වලින් පැන නගින වඩාත්ම

උපායමාර්ගික අරමුණු 5

ආයතනික විශිෂ්ඨත්වය දියුණු කිරීම

දැවෙන නියාමන ගැටළු සාකච්ඡා කිරීමට එහි සාමාජිකයින්ට සෑම විටම අවස්ථාව ලබා දෙන බැවින් අප IOSCO වෙත අපගේ ප්‍රශංසාව පිරිනමන්නෙමු. වසර තුළ අනෙකුත් නියාමන ආයතන, ආසියා පැසිෆික් ආර්ථික සහයෝගීතාව පිළිබඳ කමිටුව (APEC), ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), මැලේසියා සුරැකුම්පත් කොමිසම යනාදී ආයතන ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රවණතා සහ වර්ධනයන් සමඟ සමීපව සිටීමට කාර්ය මණ්ඩලයට බෙහෙවින් වැදගත් පුහුණු සහ දැනුවත් කිරීමේ අවස්ථා ලබා දෙන ලදී.

IOSCO සහ PIFS - ඇමරිකාවේ කේම්බ්‍රිජ්හි නීති විද්‍යාලය විසින් සත්කාරකත්වය සපයන ලද සුරැකුම්පත් වෙළෙඳපොළ නියාමකයින් සඳහා වන ගෝලීය සහතික පත්‍ර පාඨමාලාව හැදෑරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට පූර්ණ ශිෂ්‍යත්වයක් පිරිනමන ලදී. මෙම ගෝලීය සහතිකය IOSCO සාමාජිකයින්ට පිරිනමන ලද විධායක අධ්‍යාපන වැඩසටහනක් ලෙස සුරැකුම්පත් වෙළෙඳපොළේ නියාමකයින්ට ගැලපෙන පරිදි සකස් කර ඇත. මෙම පාඨමාලාව IOSCO හි අඛණ්ඩ ධාරිතා ගොඩනැගීමේ ප්‍රයත්නවල කොටසක් වූ අතර, පාඨමාලාව හැදෑරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට, මෙම ශිෂ්‍යත්වය ලැබුණු පළමු අවස්ථාව මෙය විය.

2016 න් පසුව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ASF ටෝකියෝ සම්මන්ත්‍රණයට සහභාගී වීමට සැලකිය යුතු අවස්ථාවක් හිමි විය. සෑම සහභාගිවන්නෙකුටම ඔවුන්ගේ අදාළ වෙළෙඳපොළ සහ නියාමන රාමු හෙළිදැක්වීමට, මුහුණ දෙන අභියෝග ඉදිරිපත් කිරීමට සහ සුදුසු විසඳුම් සාකච්ඡා කිරීම පැවරී තිබිණ. තවද, සියලුම සහභාගිවන්නන්ට ජපානයේ ටෝකියෝ කොටස් හුවමාරුව, මූල්‍ය සේවා ඒජන්සිය සහ සුරැකුම්පත් ආවේක්ෂණ කොමිෂන් සභාව වැනි ප්‍රමුඛ ආයතන නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දෙන ලදී.

තවද, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, බලාත්මක කිරීම් සහ තොරතුරු හුවමාරු කිරීම් පිළිබඳ IOSCO හි කමිටු අංක 4 (C4) සහ Screening Group (SG) හි මෙන්ම සුළු පරිමාණ ආයෝජකයින් පිළිබඳ ප්‍රතිපත්ති සහ ප්‍රමිති සම්පාදන කමිටු අංක 8 හි (C8) සාමාජිකයෙකි. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නිලධාරීන් පිළිවෙලින් ඇමරිකා එක්සත් ජනපදයේ සහ මැලේසියාවේ ඉහත රැස්වීම් නියෝජනය කළහ.

2023 වසරේ දී කාර්ය මණ්ඩලයට වියදම් අධික විදේශීය පුහුණුවලට වඩා, රුපියල් මිලියන 2.4ක් වටිනා දේශීය පුහුණු අවස්ථා රාශියක් ලැබුණි. සේවා ස්ථානයට ගැළපෙන පරිදි කාර්ය මණ්ඩල නිපුණතා ඉහළ නැංවීමේ සහ වැඩිදියුණු කිරීම් වලට සමගාමීව විවිධ ක්ෂේත්‍රයන්හි පුහුණුව ලබා දෙන ලදී. Daily FT සහ CICRA Holdings විසින් සංවිධානය කරන ලද 2023 සයිබර් ආරක්ෂණ සමුළුව (Cyber Security Summit 2023) ට සහභාගී වීමත් සමඟ බැංකු අධ්‍යයන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද MS Excel හි අතරමැදි පාඨමාලාවක් සහ උසස් සහතික පත්‍ර පාඨමාලාවක් වැනි තොරතුරු තාක්ෂණයේ ආයෝජන මෙයට ඇතුළත් විය.

මීට අමතරව, බැංකු අධ්‍යයන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද භාණ්ඩාගාර තොරතුරු ආරක්ෂණ වැඩසටහනේ මෙහෙයුම් සම්බන්ධ වැඩසටහනද කාර්ය මණ්ඩලයට ප්‍රයෝජනවත් විය.

